ධරණී

සතුටින් ජීවිතය දරන්නී

පළමු කාණ්ඩය හතළිස් එක්වන කලාපය

2021 සැප්තැම්බර් 15 වන බදාදා මිල රු. 40 යි

ධරණී
ශ්‍රී ලංකාවේ
අංක එකේ
කාන්තා
පුවත්පත

මම කිව්ව දේ අහලා ඉස්සර වුනානම් අදත් එයා ජීවතුන් අතර

■ සන්ශයින් සුද්දගේ පෙම්වතිය කියයි

ලේලිගේ සුදු රෙද්ද හොයන නැන්දම්මලාට පුතාගේ කුමර බඹසරත් රකින්න කියමුද?

බාලගිරි යකින්නට ඉංග්‍රීසිත් තේරෙනවද?

ලයිසන් නැතුව බයික් පැද්ද නෝනා කෙනෙකුට පොලිසියේ මහත්වරු අනුකම්පා කරලා

රටම කතා කරන සුබෝධනී ධරණීට කතා කරයි

ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ජ්‍යෙෂ්ඨතම කාන්තා මැදිරි කළමනාකාරිණී

ලක්මිණී ජයසූරිය

■ ඡායාරූපය - මධුසංක සිරිවර්ධන

සිහින් මනාලියකගේ කැන්ඩියන් සෙට් එක

සරල වෙන තරමට හැඩයි

මේකප් එක හා කොණ්ඩා මෝස්තරය ඉතාමත්ම සරලයි

මල් කළඹ ඇගේ පෙනුමත් එක්ක ගැළපෙන්න කුඩාවට නිර්මාණය කළා

මෙවර මනාලිය පිටුවෙන් ඉදිරිපත් කරන්නේ තවත් සාම්ප්‍රදායික උඩරට මනාලියක්.

විශේෂයෙන්ම අලුත් ඇඳුම් මෝස්තරත් එක්ක උඩරට ආකාරයට හැඩවෙන්න මේ දිනවල යුවතියන් අතර තියෙන්නෙ ලොකු තරඟයක්. වල්පොල, 'සැලෝන් කළණි' රූපලාවන්‍ය ආයතනයේ කළණි ඩී. දිසානායක අතින් හැඩ වූ මේ සාම්ප්‍රදායික උඩරට මනාලිය තුළ විශේෂතා බොහොමයක්ම දක්නට ලැබෙනවා.

"මේ මනාලිය චාම් මනාලියක්. ඇඳුම හා සිම්පල් මේකප් එක පමණයි මම භාවිතා කළේ. මේ දවස්වල සාම්ප්‍රදායික කැන්ඩියන් එකට වැඩිපුරම භාවිතා කරන්නේ බ්‍රොකේට් මැටීරියල් එක. සාරිය එම මැටීරියල් එකෙන් හදලා, පර්ල් ස්ටෝන් වර්ක් එකක් දලා තියෙනවා. කුරුළු රූ තමයි ඇඳුම නිර්මාණය කළේ. සුදුපාට ඩල් ගෝල්ඩ් එකක් මික්ස් කරලා තියෙන්නේ ආභරණ ආදිය හොඳින් කැපී පෙනෙන්න ඕනි නිසාමයි.

මනමාලිය උස මහත කෙනෙක් නෙමේ. මේ නිසා කැන්ඩියන් සෙට් එකත් බොහොම සරලව තමයි දැම්මේ. මොකද ආභරණ හෙවි (Heavy) වුණාම ඇගේ පුංචි බවට එය ප්‍රශ්නයක් වෙනවා. මූණ පළල් නැති නිසා තැල්ල වුණත් ලොකු එකක් භාවිතා කළේ නැහැ.

මේකප් එකත් ඉතාමත් සරල ආකාරයට දලා තියෙනවා. කොණ්ඩා මෝස්තරෙත් ඉතාමත්ම සරලයි. ඉද්ද පොහොට්ටුවලින් හෙඩ්රස් එක නිර්මාණය කළා. කරමාලයත් ඉතා පොඩි එකක් තමයි භාවිතා කළේ. හැමවෙලාවෙම උත්සාහ කළේ ඇගේ පුංචි මුහුණේ හැඩ මතු කරන්න. මෙවන් මනාලියකට ජුවලරි හරිම අඩුවෙන් තමයි භාවිතා කරන්න ඕනි.

මල් කළඹ ඇගේ පෙනුමත් එක්ක ගැළපෙන්න කුඩාවට නිර්මාණය කළා. උස නැති පෝසි බොකේ එකක් තමයි නිර්මාණය කරලා තියෙන්නේ. රෝස හා බේබිස්බෙත් බොකේ එක සඳහා භාවිතා කරලා තියෙනවා."

මනාලිය හැඩගැන්වීම - රූපලාවන්‍ය ශිල්පිනී **කළණි ඩී. දිසානායක**

ඇඳුම නිර්මාණය - **කුරුළු රූ**

ඡායාරූප - **නලීම් කමලඩීන්**

සම්බන්ධීකරණය - **ක්‍රිෂාන්ත පුෂ්පකුමාර**

මම කිව්ව දේ අහලා ඉස්සර වුණානම් අදත් එයා ජීවතුන් අතර

සන්ශයින් සුද්දගේ පෙම්වතිය කියයි

පාතාලයේ ගෝඩ් ෆාදර් ලෙස හැඳින්වූ 'මාකදුරේ මධූෂ්'ගේ ගෝලයෙකු බව කියන, 'සන්ශයින් සුද්ද' මාතර කොටවිලදී නාඳුනන කණ්ඩායමක් විසින් පසුගිය (03) වනදා වෙඩි තබා ඝාතනය කර තිබුණි.

අමිල ප්‍රසංග නොහොත් සන්ශයින් සුද්ද

මෙසේ ඝාතනයට ලක් වූ 29 හැවිරිදි අමිල ප්‍රසංග නොහොත් සන්ශයින් සුද්ද මාතර, මිරිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර, හෝටල් සහ ධීවර කර්මාන්තවලට සම්බන්ධ අයෙකි. දීර්ඝ කාලයක සිට මාකදුරේ මධූෂ් සමඟ සමීප සබඳතා පවත්වා ඇතැයි කියන සන්ශයින් සුද්ද, ඩුබායිහි පැවති මධුෂ්ගේ සාදයේ පවා සිට ඇති අතර, ඒ හේතුවෙන් මාස කිහිපයක් එරට බන්ධනාගාරයකද රඳවා සිට ඇත.

මාතර, කොටවිල පදිංචි පේශලා පියුමි ගමගේ නමැති 22 හැවිරිදි තරුණියක් සමඟ ඔහු සබඳතාවයක් පවත්වාගෙන ගොස් තිබූ අතර, පසුගිය 03 වැනිද ඇගේ නිවසට ගොස් ආපසු එමින් සිටියදී මෙම වෙඩි ප්‍රහාරයට ලක්ව ඇත.

දකුණ පමණක් නොව රටම කතාබහ කළ මෙම සිද්ධියේ අග - මුල ගැන ඔහුගේ පෙම්වතිය පේශලා 'ධරණී' ට කී කතාවයි මේ...

"මේ වෙනකොට මම සුද්දගෙ අනියම් බිරිඳ කියලා ලේබල් ගහලා... හැබැයි මමයි සුද්දයි ආදරේ කරේ අපි දෙන්නම වෙන අයව බඳින්න කලින් ඉඳලා. ඒත් ටික කාලෙකින් අපි ඒ සම්බන්ධෙ නතර කරා. ඊටපස්සෙ තමයි මට චමිත්ව හම්බුණේ. ඒ ෆේස්බුක් එකෙන්. ඊටපස්සේ මම චමිත්ව බඳින්න තීරණය කළා. හැබැයි ඒ වෙද්දි මට අවුරුදු දහඅටක්වත් සම්පූර්ණ වෙලා තිබුණෙ නෑ. අනික චමිත් මට වඩා අවුරුදු දහයක් විතර වැඩිමල්. ඒක නිසා අපේ ගෙදරින් මේ සම්බන්ධෙට ටිකක්වත් කැමති වුණේ නෑ...

ගෙදර අය මට කට කැඩෙනකන් කිව්වා චමිත් කියන්නෙ හොඳ මිනිහෙක් නෙවෙයි අතාරින්න කියලා. ඒත් 2016දී මට අවුරුදු 18 සම්පූර්ණ වෙනකොටම චමිත් මාව ගෙදරට හොරෙන් එක්කන් ගිහින් කසාද බැඳගත්තා.

එදායින් පස්සෙ මගේ පවුලේ අය මාව ගෙදරට ගත්තේ නෑ."

දෙමව්පියන්ගේ ආදරය, රැකවරණය මැද ජීවත් වූ පේශලාගේ ජීවිත කතාවට අඳුරු පිටුවක් එකතුවන්නේ එතැන් සිටය.

"කසාද බැඳලා ටික දවසක් යද්දී තමයි මම දැනගත්තේ චමිත් කියන්නේ කලිනුත් දෙපාරක් කසාද බැඳපු මනුස්සයෙක් කියලා. ඒ වගේම ඒ මනුස්සයා හම්බකරේ ගණිකා මඩමක් කරලා. ඒත් මට ආපහු හැරෙන්න බැරි නිසා මම මොන දුක හරි විඳගෙන ජීවත් වෙනවා කියලා හිත හදාගත්තා...

ඒත් ටික දවසක් යද්දි චමිත් මාවත් මිනිස්සුන්ට විකුණන්න පටන්ගත්තා. ඒ විතරක් නෙවෙයි මට දුව හම්බෙලා මාසයක් යනකොට එයා ගෙදරට වෙන ගෑනු කෙනෙක්ව එක්කගෙන ඇවිත් මට පේන්න මගේ කාමරේම ඒ ගෑනු කෙනා එක්ක හිටියා.

ඊටපස්සෙ ගෙදරට ජෝඩුවකට එන්න කියලා චමිත් ඒ ගෑනු කෙනා එක්ක ඉද්දි, මට ඒ පිරිමි කෙනා එක්ක ඉන්න කිව්වා. මට ඒ අපායේ ජීවත්වෙන්න බැරි තැන මම දෙළොස් වතාවක් අම්මලාගෙ ගෙදර ගියා. ඒත් ඒ ගියපු හැමවතාවකම චමිත් ඇවිල්ලා අපේ තාත්තට මන්නෙන් කොටලා, නංගිට අම්මට ගහලා මාව බලෙන් අරන් ගියා."

පසුව පොලිසියේ පැමිණිල්ලක් සටහන් කර ඇයව නැවතත් මහගෙදර ගෙන යාමට ඇගේ දෙමව්පියන් විසින් කටයුතු කර තිබුණේ චමිත්ගේ දැඩි තර්ජන ගර්ජන මැද්දේය.

ඇගේ ජීවිතයට නැවතත් පරණ පුරුදු ආදරයේ හෙවනැල්ල වැටෙන්නට පටන් ගත්තේ මේ අතරය.

"ඊටපස්සෙ මම ගෙදර ඇවිත් ගිය අවුරුද්දෙ පෙබරවාරි 5 වෙනිදා ආපහු සුද්දට කතා කළා. මට සිද්ධ වෙච්ච හැමදේම එයාට කිව්වා. ඒ වෙද්දි එයත් බැඳලා පුතෙකුත් හිටියා. නීතියෙන් දික්කසාද වෙලා නොතිබුණාට එයාලා ජීවත් වුණේ එක වහලක් යට නෙවෙයි. ඒක නිසා සුද්ද මට කිව්වා මාවයි, දුවවයි එයා බලාගන්නම් ආපහු චමිත් ළඟට යන්න එපා කියලා...

එදා ඉඳන් මගේ දුවව අපේ ගෙදර අම්මා ළඟ නවත්තලා, මම සුද්ද එක්ක එයාගෙ මිරිස්සෙ සන්ශයින් හෝටලේම කාමරේක නතර වුණා."

පේෂලා, සුද්ද සමඟ ගිය පසු, චමිත් භූමිතෙල් වැදුණු ගැරඩියෙක් මෙන් කිපුණු බව ඈ කියයි.

"චමිත් හැමවෙලාවෙම සුද්දගෙ ෆෝන් එකටයි, ෆේස්බුක් එකටයි මැසේජ් එවලා මරණ තර්ජන කළා. මුළු වරකාපිටියම හෙල්ලෙන විදිහට උඹව මරණවා, සුදු කොඩි ලෑස්ති කරගනින් කිව්වා. ඒ හැමවෙලාවකම මම සුද්දට කිව්වා ඒ මිනිහා ඉස්සර වෙන්න කලින් ඔයා ඌව ඉවරයක් කරන්න කියලා. අනේ ඒ හැමවෙලාවකම ඒ අහිංසක මනුස්සයා කිව්වෙ මම ඒ වගේ පව්කාර වැඩ කරන්නේ නෑ පේශලා කියලා..."

ඇය කියන්නීය.

"පහුගිය තුන්වෙනිදා මට උණ ගතියක් තිබුණා. කෑම අප්පිරියා නිසා සුද්ද අපේ අම්මට කෝල් කරලා කිව්වා මට කන්න බත් ටිකක් ලෑස්ති කරලා තියන්න කියලා. අනේ ඒ බත් කට අරන් එන්න ගියපු වෙලාවෙ තමයි වෙඩි තියලා තියෙන්නේ. මැසේජ්වලින්, කෝල්වලින් තර්ජනය කරලා කියපු විදිහටම තමයි මගේ සුද්දව මරලා දැම්මෙ.

සුද්ද කියන්නේ මිනිස්සු කියන තරම් වැරදි කරපු මනුස්සයෙක් නෙවෙයි. එයාට හෙරොයින් නඩු, කුඩු නඩු, මිනීමැරුම් නඩු තිබුණේ නෑ. ඩුබායි සිද්ධියට දාලා තිබුණ නඩුවෙනුත් එයාව නිදෙස්කොට නිදහස් කළා. අනික සුද්ද කියන්නේ කුඩු ටිකක්, පිස්තෝලයක් ඇහැටවත් දැකලා නැති අහිංසක මනුස්සයෙක්. මට කියන්න තියෙන්නේ ඒ තරම් හොඳ මනුස්සයෙක් ආපහු කොහෙන්වත් දකින්න ලැබෙන්නෙ නෑ කියලා විතරයි."

ඒ මනුස්සයා හම්බකරේ ගණිකා මඩමක් කරලා. ඒත් මට ආපහු හැරෙන්න බැරි නිසා මම මොන දුක හරි විඳගෙන ජීවත් වෙනවා කියලා හිත හදාගත්තා

ලෝකෙටම කළු වුණත් ඇයට අනුව සුද්දගේ චරිතය සුදුය. එසේ නම් ඔහු මාකදුරේ මධූෂ්ගේ සමීපතමයෙකු වූයේ කෙසේද වග අපගේ ඊළඟ පැනය විය.

"සුද්දගෙ මස්සිනා කෙනෙක් එයාගෙ දේපොල ගන්න එයාව මරන්න හැදුවා. ඒකෙන් ගැලවෙන්න උදව් ඉල්ලගන්න සුද්ද මධූෂ්ව හොයාගෙන ගිහින් තිබුණා. පස්සෙ මධූෂ් ඒ ප්‍රශ්නෙන් සුද්දව බේරගෙන ඩුබායි යන්න කතා කරලා තිබුණා. එයාගේ ජීවිතේ බේරගත්ත මනුස්සයාගෙ වචනෙට පිටින් යන්න බැරි නිසා තමයි සුද්ද මධූෂ් එක්ක ඩුබායි ගිහින් තියෙන්නේ."

තම තමාගේ කිල්ලෝටවල හුණු ඇති තරම දන්නේ තමාමය. නමුත් ඊට පෙර සියල්ලන් විසින් දැනගත යුතු තවත් කරුණක් ඇත. එනම් අවි ගත්තෝ අවියෙන්ම නසින බවය.

ලිහිණි මධුෂිකා
දර්ශාන් කානිල්

සුද්දා මට කිව්වා මාවයි, දුවවයි බලාගන්නම් ආපහු චමිත් ළඟට යන්න එපා කියලා

අවුරුදු 53ක් විශාඛා දියණිවරුන්ට රැකවල් සැදූ

‘විල්සන් අංකල්’

සෙනරත් දසනායක කියනවාට වඩා බොහෝදෙනෙක් ඔහුව දන්නේ ‘විල්සන් අංකල්’ කී විටය. වසර පනස් තුනක් විශාඛා දියණිවරුන්ට ආදරය රැකවරණය දෙමින්ද, එම භූමියේ දේපළ තමාගේ මෙන් සුරකිමින්ද, තමා වෙත පවරාගත් වගකීම අකුරටම ඉටු කරමින්ද හෙතෙම කළ කාර්යයට පසුගියද විරාමයක් ලැබුණි. ඒ සොබාදහමට අනුවය. ඒ වනවිට ‘විල්සන් අංකල්’ගේ වයස අවුරුදු අසූ තුනකි. ජීවිතයෙන් සමුගෙන ගියත්, විශාඛා දියණිවරුන්ට ඔහුගේ මතකය අමතක කළ නොහැකිය. ඒ ඔහු විශාඛාවේ එක්තරා සළකුණක් තරමටම එහි තබාගිය මතක සටහන් හේතුවෙනි. බාලිකා පාසලක දියණිවරුන්ට මුරකරුවෙකුට එහා ගිය එවැනි පියෙකු ලැබීම වාසනාවකි. විල්සන් අංකල්ගේ මුවරැඳි ළෙංගතු සිනහව, ආදරබර කතාව තුළින් දශක පහකට වඩා කාලයක් විශාඛා දියණිවරුන් අත්වින්දේ ඒ පීතෘ සෙනෙහසයි.

> **ගේට්ටුවේ රාජකාරි කළාට ඉස්කෝලෙ බලන බලන තැන විල්සන් අංකල් හිටියා**

කිරිකොක් රෑනක් සේ පාසල් ගේට්ටුවෙන් ඇතුල් වෙද්දිම, විශාඛා දියණියන් දකින්නේ ඒ ඉනාවක් වැනි සිනහවය. විල්සන් අංකල්ගේ රුව දැකීම දැරියන්ට ගෙදර කෙනෙකුන් දකිනවා හා සමානය. ඒ තරමටම විල්සන් අංකල්ගේ මුවින් නැගෙන ආශිර්වාදයට ඔවුන් ප්‍රියය.

“ගුඩ්මෝනිං බබා.”

ඔවුන්ගේ තරාතිරම කුමක් වුවත්, ඔහු ඒ සැවොම ආමන්ත්‍රණය කළේ එකම විලසිනි. පුංචිම පැංචියන්ගේ සිට දෙළහ, දහතුන වසර සිසුවියක වුව ඔහුට ‘බබා’ ය.

“බබා වෙලාවට එන්න ඕන, වෙලාවට කලින් එළියට යන්න බෑ” ඔහුගෙන් ලැබෙන අවවාදය ගුරුවරුන්ටත් වඩා විටෙක තදය. ඒ නිසා හදිසියකටවත් විල්සන් අංකල්ගේ ඇස්වලින් බේරියාම නම් කිසිවිටකත් කළ නොහැක්කකි.

විශාඛා ආදි සිසුවියක් ඔහු ගැන ඒ මතකය සිහිපත් කළේ මෙසේය.

“විල්සන් අංකල් කිව්වම ප්‍රින්සිපල්ටත් වඩා බලතල තියෙන කෙනෙක් විදියට තමයි අපි ඒ කාලේ දැක්කේ. නීති අකුරට ක්‍රියාත්මක වුණා. ගේට් එකෙන් ඇතුළු වෙන තැනම තිබුණු ඔෆිස් එක විල්සන් අංකල්ගේ වුණාට, ඔහු ඉස්කෝලේ හැමතැනම හිටියා. මේ ළමයා මෙහෙමයි කියන්න විල්සන් අංකල් හැම ළමයෙකුගේම පසුබිමත් හොඳින් දැනගෙන හිටියා. ඒ නිසා බොරුවක් කියන්න අමාරුයි.

ඉස්කෝලේ ගේට් එකෙන් ඇතුළට ආවට පස්සෙ මොන හේතුවකටවත් ආයේ එළියට යන්න බෑ. ඒ වගේම ඉස්කෝලෙට තිබුණු එකම කාසි දන ෆෝන් බොක්ස් එක තිබුණේ විල්සන් අංකල් හිටපු ඔෆිස් එක ඉස්සරහ කොටසේ. ඒකෙන් කෝල් ගන්නත් එයාගෙන් අවසර ඕනේ.”

ඒ සියල්ලම ඔහු කළේ සිසු දැරියන්ගේ ආරක්ෂාව ගැන සිතාය. පාසල ඇරෙන වෙලාවට හොස්ටල්වල සිටින ළමුන්ද ඇතැම්විට එළියට යාමට උත්සුක වන අවස්ථා තිබේ. එහෙත් ඔවුනට විල්සන් අංකල්ගේ දෑස් මඟහැර යාමට නොහැක්කේ ඒ මුහුණු සියල්ලක්ම වාගේ ඔහුට මතක හෙයිනි. ඒ වාගේම පාසල් වෑන්රිය මඟහැරෙන දැරියක සිටියහොත්, ඇයගේ දෙමව්පියන් පාසලට පැමිණ ඇය රැගෙනයන තුරුම පාසලේ රඳවා තබාගන්නේ විල්සන් අංකල් භාරයේය. ඔහු දැරියන්ගේ ආරක්ෂාව ගැන ඒ තරමටම කල්පනා කළ අයෙකි.

“ඒ වගේම තමයි බැරිවෙලාවත් ක්ලාස් එකක් කට් කරලා ඇවිද ඇවිද ඉඳිද්දී විල්සන් අංකල්ව දැක්කොත් අපි ෂේප් එකේ මාරුවෙන්න තමයි බලන්නේ. පොඩි පන්තිවලදී අපි ඔහුට ගොඩක් බයයි. ඒත් ඒලෙවල් කරද්දි ඔහු අපිට යාළුවෙක් වගේ. හැබැයි ඔහුගේ නීතිය අකුරටම තිබුණා. විල්සන් අංකල් එක්ක වැඩිපුරම තරහ පිරිමි ඉස්කෝලවල ළමයි. බිග් මැච් කාලෙට පිරිමි ඉස්කෝලවල ළමයි විශාඛා එක ඇතුළට පනින්න සූදානමින් ඉන්නවා. විල්සන් අංකල් තමයි ඔවුන්ට තිබුණු ලොකුම බාධකය. ඒ දවස්වලට අංකලුත් පුළුවන් හැම විදිහටම ගේට්ටුව මුර කරගෙන ඉන්නවා. ඔයඅතරේ ඉඳලා හිටලා පිරිමි ළමයි තාප්පෙන් ඇතුළට පැන්නොත් පස්සෙන් එළවගෙන ගිහින් ඔවුන්ව එළියට දනවා. ඒ දේවල් අපිට ඒ කාලේ විනෝදයක් වුණාට එහි බරපතළකම පසුවයි තේරුම් ගියේ. මට මතකයි වරක් ප්‍රසිද්ධ පාසලක පිරිමි ළමයි ටිකක් (බිග් මැච් කාලේ) ගේට් එක ළඟට ඇවිත් කැරකි කැරකි ඉඳලා අන්තිමට විල්සන් අංකල්ව උස්සගෙන ගියා. ඉස්කෝලෙන් ටිකක් එහා තැනක ඔවුන් විල්සන් අංකල්ව අතෑරලා ගිහින් තිබුණා. ඒ වගේ හිරිහැරවලට ලක්වුණත් විල්සන් අංකල් රාජකාරිය අකුරටම ඉටුකළා.”

ඇය කීවාය. බිග් මැච් කාලයට අසංවර වැකි ලියූ විවිධ පෝස්ටර් පාසල් තාප්පයේ අලවා තිබෙනු දකිද්දී, විල්සන් අංකල්ට යකා නගියි. ඔහුට ඒවා එකින් එක ඉරා දමන්නට වැඩිවෙලා යන්නේ නැත.

විල්සන් අංකල් විශාඛාවේ විදුහල්පතිවරියන් කිහිපදෙනෙකුම සමඟ සේවය කර තිබේ. ඔහු ගුරුවරයින්ට දක්වන ළෙංගතුකමේද අඩුවක් නැත. දවසම පාසලේ කාලය ගතකරන ඔහු සවස් කාලයේ සෑම ගොඩනැගිල්ලකම ඇවිද බලයි. බැරිවෙලාවත් විදුලි පංකාවක් කැරකෙමින් තිබුණේ නම් පසුවදාට බැණුම්ය.

“ඇත්තටම විල්සන් අංකල් කියන්නේ බොහොම ගුණයහපත් චරිතයක්. විශාඛා දියණියන්ට පියෙක් වගේම, ගුරුවරුන්ට ගෞරවය දී කතා කළ කෙනෙක්. ඒ වගේම වැරැද්දක් තිබුණොත් ඒ ගැන මූණටම කියන්න තරම් එඩිතරයි.

ඔහු ප්‍රායෝගිකව, තමන්ගේ වගකීම් හඳුනගෙන ජීවත් වුණ අයෙක්. අපි මුහුණ දෙන ගැටළුවකදී වුණත් ඔහුට ප්‍රායෝගික විසඳුම් තිබුණා. මම 2014 තමයි විශාඛා විද්‍යාලයට එන්නේ.

> **මැති ඇමැති කෙනෙකුගේ දරුවෙක් වුණත්, සාමාන්‍ය පවුලක දරුවෙක් වුණත් ඔහුගේ සැළකිල්ල සමානයි**

දවසක් හදිසියට අමතකවීමකින් යතුර අත්බෑගයේ තිබියදී සංගීත කාමරයට මම ඉබ්බා දලා තිබුණා. අත්බෑග් එක තිබුණෙත් කාමරේ ඇතුළේ. එදා මම වෙනත් රාජකාරියකට ඉක්මනට එළියට යා යුතුව තිබූ දවසක්. ඒ ගැන විල්සන් අංකල්ට කිව්වම යතුරු ගොඩක් තියෙන ලොකු යතුරු කැරැල්ලක් ගෙනැත් එකින් එක දලා බලලා දොර ඇරලා දුන්නා. ඒ වෙලාවට, ඉතින් පොඩි සැර පාරක් දානවා. ඒත් මේ වසර පනස් ගණන තුළ විශාඛාවට ඔහුගේ සොයාබැලීම් වගේම, කැපකිරීම් අතිමහත් බව ඔහු ගැන දන්න කවුරුනුත් බොහොම ආදරයෙන් සිහිපත් කරනවා.”

ඒ විද්‍යාලයීය සංගීත ආචාරිනී, සරෝජා හේවාවිතාරණ මහත්මියයි.



විශාඛා දියණියන් කියනා පරිදි ඔහු පාසලේ නැති වෙලාවක් සොයාගැනීමට අපහසු විය. මාස දෙකකට පමණ වරක්, තමන් උපන් ගම වූ මාතරට ගොස් පැමිණයද ඒ ඉන්නේ දිනක් හෝ දෙකකි. ඔහු අවිවාහකයෙකු වුවද, දියණිවරුන් ගොන්නකට සැබෑම පියෙකු විය.

නිතර නිල්පාට යුනිෆෝමයෙන් දැකිය හැකි විල්සන් අංකල් සුදු ඇඳුමින් දැකගන්නට හැකි දවස වන්නේ පාසලේ පිරිත සහ දානය ඇති දටය. පාසලේ කුමන කටයුත්තකදී වුවද ඔහුට හැකි උපරිම දායකත්වය ලබාදීම කරන්නේ, විටෙක බලා සිටින්නන්ද පුදුම කරවමිනි.

අනතුරුව විල්සන් අංකල් ගැන කතා කළේ විශාඛා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිවරියකි. ඇය ආදි විශාඛා දියණියකද වෙයි.

“මම ඉගෙනගන්න කාලේ ජයසිංහ මැඩම් තමයි ප්‍රින්සිපල් තනතුරේ කටයුතු කළේ. එතකොට විල්සන් අංකලුත් ඉන්නවා. අපි ඒ දවස්වල පුංචි ළමයි හැටියට විල්සන් අංකල්ට බයයි. මට මතකයි ඔහු එතකොට තරුණයි. දැන් පාසලට පෞද්ගලික අරක්ෂක අංශයක සේවය ලබාගත්තත්, එතකොට පාසලේ ගේට්ටු දෙකම බලන්නේ විල්සන් අංකල්.

ඔහු බොහොම කඩිසරව, එහා මෙහා දුවමින් ‘ඔය බබා මේ ගේට්ටුවෙන් යන්න ඕන’ කියලා ගේට්ටුව පවා කියනවා. ඔහොම කාලයක් ගිහින් මම ගුරුවරියක් හැටියට විශාඛාවට එද්දිත් විල්සන් අංකල් ඒ විදිහමයි. මම මේ අහවලා කියලා කිව්වම, ‘ආ මේ ඒ බබාද’ කියලා බොහොම සුහදව කතාබහ කරලා මාව පිළිගත්තා. ඔහු හැමෝටම ඒ වගේ සුදහශීලීයි.”

ප්‍රියමනාප කතාබහ තරමටම පිළිවෙලට ලස්සනට අඳින්නට ඔහු කැමතිය. 2020 පළමු කොරෝනා රැල්ලට පාසල් වසද්දී, විල්සන් අංකල්ටද මාතර යාමට සිදුවිය. ඔහු කොළඹ ඉන්නට කැමති

වසර පනස් තුනක් විශාඛාවට ඔහු පියෙක් වුණා

පාසල හැර ගියද විල්සන් අංකල් අමතක නොකළ විශාඛාවේ හිතවත්කම්

විල්සන් අංකල්ගේ දේහය

වුවත්, අසූ දෙහැවිරිදි වියේ සිටියෙන් ඔහුගේ ආරක්ෂාවට එය සුදුසු තීරණයක් විය. ඔහු බලාකියාගත්තේ සිය සහෝදරියගේ පුතෙකු විසිනි.

“මාතර ගියත් අපි විල්සන් අංකල්ගේ සැපදුක් විමසුවා. විල්සන් අංකලුත් හොඳටම අසනීප වෙන්න කලින් අපට කතා කරලා සැපදුක් අහනවා. ඔහු අසනීපව සිටියදීත් පාසල් ආදි ශිෂ්‍ය සංගමය වගේම පාසල් සංවර්ධන සමිතිය මගින් අවශ්‍ය දේ සපයා දුන්නා. විල්සන් අංකල්ව ගමේ යැව්වෙ කොරෝනාවෙන් බේරාගන්න තිබුණු උවමනාවත් එක්කයි. වයසත් එක්ක ඇතිවුණු සාමාන්‍ය තත්ත්වයක් අනුව ඔහු ජීවිතයට සමුදුන්නා.”

විල්සන් අංකල්ගේ මරණයෙන් පසු කරන ලද පී.සී.ආර්. පරීක්ෂණයට අනුවද ඔහුට කොරෝනා වැළඳී තිබුණේ නැත. පිනට දහමටද ලැදි ඔහු කාලයක්ම සිල් සමාදන් වීමටද අමතක කළේ නැත.

“විල්සන් අංකල්ව බලාකියාගත්ත පුතාගෙන් අපට දැනගන්න ලැබුණා, ඔහු ජීවිතේ අන්තිම කාලයෙත් විද්‍යාලයට මොනතරම් ලැදිව කටයුතු කළාද කියලා. ඔහු හිටපු ගමන් කියනවලු, ‘කෝ මගේ යුනිෆෝම් එක ගන්න, මට ඉස්කෝලෙට යන්න ඕන’ කියලා. ඒ වෙලාවට, ‘මේ ඉන්නෙ මාතර’ කියලා කිව්වම ඔහු එය මතක් වෙලා හිනාවෙනවලු. ඒ වගේ අවසන් මොහොත දක්වාම විද්‍යාලය එක්ක බැඳුනු අපූරු සම්බන්ධකමක් ඔහුට තිබුණා.”

සරෝජා ගුරුතුමිය

ඒ සම්බන්ධය ඇතිවන්නේ රජයෙන් ලද පත්වීමක් නිසා නොවේ. එහෙත්, පාසල් සංවර්ධන සමිතිය මගින් ඔහුට වැටුප් දුන්නේ ඒ වැටුපට වඩා සේවයක් ඔහු වෙතින් සිදුවූ නිසාය. වයස හැටපසෙහෙන් පසුවද ඔහු විද්‍යාලයේ කාර්යාල කටයුතුවලටද සහාය වෙමින් කටයුතු කළේය. ඔහුගේ සේවය පාසලේ තවදුරටත් තබාගනිමින් ආදි ශිෂ්‍ය සංගමය ඔහුව මියෙනතුරුම බලාගත්තේ පියෙකු තරම් ළෙංගතුවයි.

එම ළෙංගතුකම මරණයෙන් නවතින්නක් නොවේ.

මිනිසෙකුට මිනිසෙකු වන්නට පොතපතේ දැනුම වාගේම ප්‍රායෝගික දැනුමද අවශ්‍යය. විල්සන් අංකල් ඒ අතින් තමා ලොකු මිනිසෙකු බව ඔප්පු කළේය. ඒ ලොකු මිනිසාට විශාඛා දියණියන්ගේ සිත්වල ලොකු ඉඩක් තිබේ. විල්සන් අංකල් එසේ ඉතිරිකර තැබූ ඒ සියලු ගුණාංග ඕනෑම පාසල් සමාජයකට ආදර්ශයකැයි කියන්නට තරම් අප නිර්ලෝභී විය යුතුය.

දීපා වසන්ති එදිරිසිංහ

ලයිසන් නැතුව බයික් පැද්ද නෝනා කෙනෙකුට පොලිසියේ මහත්තුරු අනුකම්පා කරලා

වැඩට එන්න බැරිනම් රස්සාවෙන් අයින් වෙන්න, ආයතන ප්‍රධානියා නියෝග කරලා

නිකිණි මාසය ගෙවී යාමට ආසන්නය. හැමදාම මෙන් රජරට ගිනියම්ය. ගම්මානවල කුඩා වැව් සියල්ල සිඳී ගොසිනි. බීමට දිය පොදක් සොයා අහිංසක ගැමියන් මෙන්ම සතාසීපාවා ද අනේක වූ දුක් විඳිති. ඒ අතර වෙනදා වකුගඩු රෝගයෙන් අපා දුක්විඳ මියැදෙන්නවුන් වෙනුවට දැන් කොවිඩ් මාරයා මෙලොව එළිය නුදුටු උන්ද මරු තුරුලට යවමින් සිටී. තත්ත්වය එසේ වෙද්දී දිවයිනටම බලපැවැත්වෙන පරිදි නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක විය. අත්‍යවශ්‍ය සේවා හැරෙන්නට කිසිවකුටත් මහමඟ ගමන් බිමන් තහනම්ය. දුම්රිය ඇතුළු සියළුම පොදු ප්‍රවාහන සේවා ද නැත.

අගෝස්තු 25 හෝ ඒ ආසන්න දිනයක උදෑසන 8.15 ට පමණ හොරොව්පොතාන නගරය මධ්‍යයේ තිබූ පොලිස් මුරපොළ දෙසට තරමක් විශාල යතුරුපැදියක් එන ආකාරය එහි සිටි නිලධාරීහු දුරතියාම දුටුවෝය. යතුරුපැදිය ඒ මේ අත වැනෙමින් පැමිණෙන නිසා පොලිස් නිලධාරීහු ඒ පිළිබඳව වඩාත් විමසිලිමත් වූහ. ගමන් විලාශය අනුව පදවන්නා බීමත් යතුරුපැදිකරුවකු හෝ ආධුනිකයකු යැයි අනුමාණ කළ නිලධාරීහු මුරපොළට ආසන්න වෙත්ම නතර කරන ලෙසට සංඥා කළහ. මේ යතුරුපැදිකරු කාන්තාවක් බව පොලිස් නිලධාරීන් දැනගන්නේ එවිටය. ආරක්ෂක හිස්වැස්මක් හා මනා ලෙස මුහුණු ආවරණයක් ද දමා සිටි ඇය සාත්තු සේවිකාවකගේ නිල ඇඳුමකින් සැරසී සිටියාය.

"කොහෙද යන්නේ? දැන් ඇඳිරි නීතිය.."

ඇය මුදල් පසුම්බියේ වූ රාජකාරි හැඳුනුම්පත ඉදිරිපත් කළාය. රාජකාරි හැඳුනුම්පත පරීක්ෂා කළ පොලිස් නිලධාරියා,

"හොඳයි මිස්... හැබැයි අද අනුරාධපුරේ යන්ඩ නං මෙහෙං බස් නෑ. මොකද මෙච්චර ලොකු බයික් එකක්? හැමදාම මේකෙද යන්නේ?"

"නෑ... වෙනද බස් එකේ යන්නෙ. අද බස් නෑනෙ. ගෙදර තියෙන්නේ මේ බයිසිකලේ විතරයි."

ඇය යටහත් පහත්ව පැවසීය.

"හොඳයි... පරිස්සමට යන්න."

එසේ පැවසූ පොලිස් නිලධාරීහු ඇය ඒ මේ අත වැනෙමින් ගමන්කරන අයුරු බලා සිටියෝය.

බැරිමරගාතේ තමාට වඩා විශාල යතුරුපැදියක් පදවාගෙන ගිය මේ කාන්තාවගේ නම නාලිකා ය.

පෞද්ගලික සාත්තු සේවා ආයතනයක සාත්තු සේවිකාවක වන ඇය රාජකාරිය සිය දිවි දෙවෙනිකොට සැලකුවාය. හොරොව්පොතාන නගරයේ සිට කිලෝමීටර් 35 ක් පමණ දුරින් පිහිටි පිටිසර ගමක පදිංචි ඇය දරුවන් තිදෙනෙකුගේ මවකි. සැමියා ගමේ පාරම්පරික ගොවියෙකි. එක් කන්නයක් පමණක් වගා කරන කුඩා කුඹුරු කෑල්ලෙන් හා හේනෙන් ලැබෙන සුළු ආදායමෙන් ද නාලිකාට ලැබෙන සොච්චම් වැටුපෙන් ද ඔවුන් දිවි ගැටගසා ගනියි. මෝඩ ගඩොලින් බැඳ අඩක් නිමකර ඇති නිවස කපරාරු කර නැත. නාලිකාගේත් සැමියාගේත් එකඟතාවය මත ඔවුන් තරමක් විශාල යතුරුපැදියක් පහසු ගෙවීමේ ක්‍රමයට මිලදී ගනු ලැබුවේ අනෙකක් නිසා නොව දරු තිදෙනාත් සමඟ ඔවුන් දෙදෙනාටද ගමන් බිමන් යාමේ පහසුව සලකා ගෙනය.

කොරෝනා වසංගතය හමුවේ බිඳ වැටී ඇති ආර්ථිකය යම්තමින් හෝ පවත්වාගෙන යාම සඳහාත්, සීමිත සේවක සංඛ්‍යාවක් සේවයේ යෙදවිය යුතු බවට පළවී ඇති අණපනත් නිසාත් රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතනවලද සේවා සඳහා ගෙන්වා ගනු ලැබුවේ සීමිත සේවක සංඛ්‍යාවකි. නාලිකා සේවය කළ ආයතනයද අනුගමනය කළේ එම ක්‍රියාමාර්ගයමය. එම ආයතනයේ නව සේවා මුර ලේඛනය අනුව නාලිකා සතියකට දින 4 ක් සේවයට වාර්තා කළ යුතු විය. ඉන් වැඩි දින ගණනක සේවය නිම වූයේ පස්වරු 6.00 ටය. වෙනදා සේවා මුරය අවසන් වූයේ පස්වරු 5.00 ට නිසාත් බස් ගමනාගමනය සිදුවූ නිසාත් ඇයට අනුරාධපුරයේ සිට හොරොව්පොතානට රාත්‍රී 7.00 පමණ වනවිට පැමිණීමට හැකිවිය. එතැන් සිට තවත් කිලෝමීටර 30 ක් පමණ දුර ගෙවා වන අලි ගහන කැලෑව මැදින් සැමියා සමඟ යතුරුපැදියෙන් නිවසට යාම ඇගේ දින චරියාව විය. එහෙත් නව සේවා මුරය නිසා වැඩ නිමවී හොරොව්පොතානට පැමිණීමේදී රාත්‍රී 8.00 පසුවන බවත්, එසේ පැමිණීමට කිසිඳු පොදු ප්‍රවාහන සේවාවක් ක්‍රියාත්මක නොවන බවත් ඇය ආයතන ප්‍රධානියාට පැවසුවද ඔහු එකහෙලාම පැවසුවේ මේ මොහොතේ සෑම සේවකයෙක්ම ආයතනය වෙනුවෙන් කිසියම් කැපකිරීමක් කළ යුතු බවයි. එසේ කිරීමට අකැමති අය වෙතොත් සේවයෙන් ඉවත්ව යෑම සුදුසු බවත් ඔහු කීවේය. සැමියා සමඟ ද සාකච්ඡා කළ නාලිකා දැඩි තීන්දුවක් ගත්තාය. එනම් තමන්ට ඇති එකම වාහනය වූ යතුරුපැදියෙන් සේවා ස්ථානයට යාමටයි. ඊට ඔහුගේ එතරම් කැමැත්තක් නැතත් වෙන විකල්පයක් නොවූ තැන ඔහු කරබාගෙන සිටියේය. කුඩා දරුවන් තිදෙනා තනිකර නාලිකාගේ තනියට යාමටද හැකියාවක් ඔහුට නොවීය. කෙසේ හෝ නාලිකාගේ ගමනේ මුළු දුර ප්‍රමාණය කිලෝමීටර 85 කි. එයිනුත් කිලෝමීටර් 30ක් වන අලි තර්ජන සහිත පටු කැලෑ පාරකි. මෙසේ එක්සිත් දරාගෙන ගමන් පිටත් වුවත් විශාල යතුරුපැදියක් කිසිදින පදවා නැති ඇයට එය තරමක් නුහුරු විය.

රන්පත්විල, සීප්පුකුලම, මහකනදරාව වැව, මිහින්තලේ පසුවී අනුරාධපුර නගරයට ආසන්න මාතලේ හන්දිය පොලිස් මුලපොළේදී නාලිකා පැදවූ යතුරුපැදිය නවත්වන ලෙසට නැවතත් සංඥා කෙරිණ. නාලිකා මාර්ගය අයිනේ යතුරුපැදිය නවත්වා ඉන් බැස්සාය.

"ලයිසන් ඉන්ෂූරන්ස් අරගෙන එන්න..."

පොලිස් නිලධාරියා එක් අතක් දිගුකරමින් පැවසුවේය. නාලිකා සෙමෙන් සෙමෙන් පොලිස් නිලධාරියා අසලට ආවාය.

"බයික් එකේ ලයිසන් ඉන්ෂූරන්ස් දෙන්ඩ බලන්ඩ..."

නාලිකා නිහඬය. ඇය අසරණ ලෙසින් පොලිස් නිලධාරියා දෙස බැලුවාය.

"හරි... ඔයාගේ ඩ්‍රයිවින් ලයිසන් එක දෙන්ඩ..."

පොලිස් නිලධාරියා අත දිගු කළේය. ඊට ද කිසිත් නොකියූ නාලිකා බිම බලාගත්තාය.

"ඒකත් නෑ නේද...? අපට හිතුන ඔයා බයික් එක පැදගෙන එන හැටියෙන්ම. ඒකයි නැවැත්තුවේ. මේ බයික් එක මේ විදියට පාරට දාන්ඩ බෑනේ. බලන්ඩ වැරදි කීයක් ද?"

පොලිස් නිලධාරියා නාලිකා දෙස බලාගෙනම පැවසුවේය.

"සාජන් මහත්තයා මොකෝ?"

මඳක් එහායින් සිටි පොලිස් මුරපොළේ ප්‍රධානියා ඇසීය.

"සර්... බයික් එකේ ඩොකියුමන්ට් මොනවත් නෑ... නෝනට ලයිසනුත් නෑ."

පොලිස් නිලධාරියා උස් හඬින් කීවේය.

"එහෙමද... එහෙනං උසාවි දාන්ඩ..."

මුරපොළේ ප්‍රධානියා තීන්දුව දුන්නේය.

"අනේ සර්... එහෙම කරන්ඩ එපා. රස්සාව බේරගන්ඩ ඕන හින්ද මෙහෙම ආවේ..."

නාලිකා ඇඬුම් ස්වරයෙන් කීවාය.

"මං දන්නෙ නෑ... ලොකු සර්ට කියන්ඩකෝ. යන්ඩ. විස්තරේ කියන්ඩ..."

පොලිස් නිලධාරියා තරමක් නිවුණු ස්වරයකින් කීවේය.

ගාට ගාට පොලිස් මුරපොළේ ප්‍රධානියා වෙත ගිය නාලිකා සත්‍ය කතාවම අකුරක් නෑර පොලිස් ප්‍රධානියාට කීවාය. සියලුම දේ සාවධානව අසා සිටි පොලිස් ප්‍රධානියා,

"මට තේරෙනවා... මේ කාලේ හැටියට සෞඛ්‍ය අංශවල අය කරන්නේ ලොකු සේවයක්. අපි ඒකට ගරු කරනවා. හැබැයි ඒ වුණාට මේ විදියේ නීතිවිරෝධී දේවල්වලට ඉඩ දෙන්ඩ බෑ. මේ බයික් එක අපි චෙක් පොයින්ට් එකේ තියාගන්නවා. මහත්තයට කෝල් එකක් දෙන්ඩ මෙතෙන්ට එන්ඩ කියලා. හරිද. ඔයාගේ ආයතනේ ප්‍රධානියා මගේ මිත්‍රයෙක්. මං එයාට කියන්නං ඔයාගේ සේවා මුරේ ටිකක් එහාට මෙහාට කරල සහනයක් දෙන්ඩ කියලා. දැන් ඔය පොලිස් ජිප් එකේම ගිහිල්ල ටවුමෙන් බහින්ඩ. යන්ඩ. කොච්චර නැතිබැරිකං, අගහිඟකං තිබුණත් නීතියට පිටින් යන්ඩ එපා. ඇත්ත කියපු හින්ද අපි සහනයක් දුන්නේ.දැන් යන්ඩ..."

මේවන් අසීරු මොහොතක එවන් තේරුම්ගැනීමක් සහ හෘදයංගම බවක් පොලිස් නිලධාරියෙකු වෙතින් පලවීම ගැන අපේ ප්‍රශංසාව හිමිවිය යුතුය. ඔහුගේ උපදේශය නිවැරදිය. තත්ත්වය කොතරම් බරපතළ වුවත් අපිට නීති කඩන්නට බැරිය. ඒ නිසා මේ මොහොතේ තම සේවකයන් සම්බන්ධව සියලු ආයතන ප්‍රධානීන් වෙනදාටත් වඩා හිතන්නේනම් හොඳය.

කේ.එම්.එස්.කරුණාරත්න
- අනුරාධපුර (සංවාරක)



සංබගේ මරගාත

සංබ අමරජිත්

මාධ්‍ය රස්සාව හරි අමුතුයි. ඒ රස්සාව කරන අය ඊටත් වඩා අමුතුයි. ඒ අයගේ හදවත් වෙන අයට වඩා ලොකුයි. ඒ අයගේ කඳුළු වෙන අයට වඩා බරයි. ඒ අයගේ හිනාවත් වෙන අයට වඩා පළල්. කොටින්ම ඒ අය හරි රහයි. ඒ රහ මේ සුදු ඩිමයි කොලේ උඩ ටිකෙන් ටික තවරන්න ඉඩ දෙන්න.

ආත්මා ලියනගේ නානකොට කියන සිංදුව

රූපවාහිනී නාලිකාවක වේෂ නිරූපණ කාමරය කියලා කියන්නෙ තරු පායන තැනක්. කොවිඩ් වසංගතයත් එක්ක අමුත්තන්ට මේකප් දාන එක මේ දවස්වල තාවකාලිකව නතරවෙලා තිබ්බත්, වෙනදට නළු නිළියො, ගායක ගායිකාවො හැමෝම එන තැනක්නෙ ඔතන.

ඔන්න ඉතින් අපිට ඉන්න අතිශය ජනප්‍රිය ගායකයෙක් වන ආත්මා ලියනගේ දවසක් ප්‍රසිද්ධ රූපවාහිනී නාලිකාවක මේකප් රූම් එකට ආවා. ආත්මාට මේකප් දැම්මෙ මල්මී. ඉතින් මේකප් දනගමන්ම මල්මී, ආත්මාත් එක්ක අල්ලාප සල්ලාපයකට එළැඹුණා.

"මම පුංචි කාලෙ ඉඳන්ම අයියගෙ රසිකාවියක්. මගේ ප්‍රියතම ගායකයත් ඔයා."

"ඇත්තද නංගි?"

"නැතුව? අයියගෙ සිංදුවක් එෆ්.එම්. එකක ගියත්, ටී.වී. එකක ගියත්, මං ඔක්කොම වැඩ ටික නවත්තලා අහගෙන ඉන්නවා."

"හරි සතුටුයි නංගි."

"අනේ අයියෙ, මේකප් එක දලා ඉවර වුණහම අපි දෙන්නා සෙල්ෆියකුත් ගම්මුද?"

"ආ... ඒක මොකක්ද? ගමු ගමු."

"බලන්නකො අද ඔයා මෙහෙ එනවා කියලා දැනගෙනත් නෙවෙයි, අද උදේ ඉඳන්ම මං මුමුණ මුමුණ හිටියෙ අයියගෙ සිංදුවක්නෙ."

"අනේ ඇත්තට? මොකක්ද නංගි ඒ සිංදුව?"

"ඈත රන් විමන් තුළින් - පාට සේලයෙන් සැදී."

මේකප් රූම් එකේ වෙන වෙන වැඩ කර කර හිටපු අයත් එකපාරටම ගල් ගැහිලා ගියා.

"ඈත රන් විමන්?"

ආත්මත් පුදුම වෙලා ඇහුවා.

"ඔව්! ඔව්! අර අද රෑට... අද රෑට... අද රෑට... කියලා කියන්නෙ?"

"අනේ නංගි ඒක මගේ සිංදුවක් නෙමෙයිනෙ. ඒක මේ ප්‍රියා සූරියසේනගෙ සිංදුවක්නෙ."

"නෑ? ඒත් ඒක අයියත් කියනවා නේද?"

වටේ පිටේ හැමෝම හිනාවෙනවා. මල්මීට වෙච්ච වැඩේ ගැන ආත්මටත් දුකයි.

"ආ.. ඔව්! ඔව්! නංගි. මාත් ඒ සිංදුව කියනවා නාන වෙලාවට එහෙම."

මේකප් රූම් එකේ හිටපු කට්ටිය ඊටත් වඩා හයියෙන් හිනාවෙන්න ගත්තා.

හෙට මැරුණත් අද ආතල් එකේ ඉන්න ඕන

සැනසීම තියෙන්නේ අස් කරනකොට මිසක් රැස් කරනකොට නෙමෙයි

ඉස්සර නිවාඩු දවසට මම ගේ අස්පස් කරන්න පටන් ගන්නකොට අපේ අම්මයි තාත්තයි මූණට මූණ බලාගන්නවා හරියට 'අපෝ අද ඉවරයි' කියන්න වගේ.

වැඩේ ඉවර කරලා අනවශ්‍ය දේවල්, ප්‍රයෝජනයක් නැති දේවල් ටික එක ගොඩකට ගොඩ ගහලා විසි කරන්න හදනකොටම අපේ අම්මා දුවගෙන එනවා. ඇවිත් අහස පොළොව නුහුලන අපරාධයක් කරපු අපරාධකාරයෙක් දිහා බලනවා වගේ මගෙ දිහා බලලා, 'මේවා කොහෙද තිබ්බේ? මම මේක කොච්චර හෙව්වද? ආ මේක විසි කරන්න එපා, මේ බෝතලේ නම් මට ඕනේ, අප්පෝ මේක විසිකරලා කොහොමද? මේ පියන අර භාජනේ, මේ කෝප්පේ ඔයා ඉපදෙනකොට අපේ ගෙදර තිබ්බ එකක්...' ඔය වගේ නානාප්‍රකාර හේතු ගොඩක් කියලා, මටත් බැනලා අර විසි කරන්න හදපු ඔක්කොම ටික ආයෙත් පිහදලා තිබ්බටත් වැඩිය හොඳට පේන තැනකින් අරන් තියනවා.

අම්මට තාත්තට අනුව ගෙදර තියන සියල්ලම ඉතාම වැදගත්, පුදුම ප්‍රයෝජනවත් දේවල්. හැබැයි කැරපොත්තෝ, හූනො, මීයෝ, කාවෝ ඇරෙන්න ඒවගෙන් ගෙදර කෙනෙක් ප්‍රයෝජන ගන්නවා අපි කවදාවත් දැකලා නැහැ.

මගෙ මහගෙදර උදාහරණයට ගත්තට ලංකාවාසී බහුතර ගෙදරවල්වලත්, ජීවිතවලත් තත්ත්වය ඕක තමයි.

අතහැරීම, තණ්හාව, අල්පේච්ඡකම ගැන මොනතරම් කියෙව්වත් අපි වගේ තුන්වෙනි ලෝකේ රටවල් ඇතුළේ ඒවා නිකම්ම නිකන් වචන විතරයි. අපේ මිනිස්සු අරපරිස්සම, නාස්තිය, ජීවිතය විඳීම කියන කාරණා තුන අල්ලගෙන ඉන්නේ වැරදිම වැරදි කොණකින්.

හම්බකරන්න පටන්ගන්න දවසේ ඉඳලම කරන්නේ ඉතුරු කරන එක. තමන්ට ගෙයක්, දරුවන්ට ගෙවල්, දරුවන්ගේ දරුවන්ට ඉඩකඩම්, කව්ච්චි, අල්මාරි, පවුම් ඔන්න ඕව පස්සේ හුසේන් බෝල්ට්ලා වගේ දුව දුවා හම්බ කරන්න නොකා නොබී දුක් විඳිනවා.

ඊටපස්සේ හම්බ කරපු වස්තුව පරිස්සම් කරන්න දුක් විඳිනවා.

කකුල් දිරපු මේසේ, ඇන්ද කැඩිච්ච පුටුව පවා දුවට දෙන්න කියලා කොහේ හරි ගොඩගහගන්නවා. ගෙදරට ගේන අයිස් ක්‍රීම් කප් එකත් පස්සේ ගන්න කියලා හෝදලා කබඩ්වල පුරෝගන්නවා. මීයෝ, කැරපොත්තෝ බෝ වෙනවා. ඒ සත්තු නිසා ලෙඩ බෝ වෙනවා. ගෙදර ඉඩ ඇහිරෙනවා. ගෙවල් අපිරිසිදු වෙනවා. ඒ ඔක්කොටම වඩා වැඩකට ඕන වුණ වෙලාවට ඒවා හොයාගන්න දවස් ගානක් යනවා. මොකද අරන් තිබ්බට තිබ්බේ කොහෙද කියලා මතක නැහැ.

බහුතර මිනිස්සු ජීවිතය කියලා හිතාගෙන ඉන්නේ භෞතික දේවල්වලට විතරයි.

මං දන්න පවුලක දෙමව්පියෝ දෙන්නා ජීවිත කාලෙම හම්බකරලා, ලෝන් එහෙමත් දාලා, රටේ තියෙන හොඳම ලී දාලා, පරම්පරා ගානකට ඉන්න විශාල ගෙයක් හදලා ඒක පුතාට දුන්නා. පුතා බැන්ද ගමන්ම ගෙදර හරි පරණ පාටයි කියලා ගේ කඩලා වෙනම හැදුවා. හැබැයි අර වයසක ජෝඩුව තාම නොකා නොබී ගේ හදන්න ගත්ත ලෝන් එක ගෙවනවා.

ඔන්න ඔය වගේ සිද්ධි නිසා අපි අද වැඩිම පීඩනයෙන් ජීවත් වෙන මිනිස්සු ඉන්න රටක් වෙලා ඉවරයි.

මොකද සතුටෙන් ජීවත් වෙන මිනිස්සුන්ගේ රටාව ඕක නෙමෙයි.

අපේ මිනිස්සු මුළු ජීවිතේම ඉඩම්, පවුම්, ලී බඩු වගේ භෞතික දේවල් වෙනුවෙන් නාස්ති කරනකොට සතුටින් ජීවත්වන රටවල්වල මිනිස්සු:

ගෙදර ඉන්න සාමාජිකයින්ගේ ගානට ඉන්න ගෙයක් හදාගන්නවා, යන්න පහසු වාහනයක් ගන්නවා, හම්බ කරලා ඒ හම්බකරන සල්ලිවලින් ලස්සනට සැහැල්ලුවෙන් ජීවත් වෙනවා, කනවා බොනවා, සංචාරය කරනවා, සමාජ සේවය කරනවා, මැරෙනකම් ජීවිතේ විඳිනවා.

ඉස්සර කොට්ටාව හන්දියේ ලොකු බෝ ගහක් තිබ්බා. ඔය බෝ ගහේ හරිම ලස්සන වාක්‍යයක් ලියැවුණු බෝඩ් එකක් එල්ලලා තිබ්බා.

'වස්තු සියයකට දුක් සියයකි, යමෙකුට එක වස්තුවක්වත් නැත්ද ඔහුට එක දුකක්වත් නැත'

ඔය කියලා ඇත්තේ සංසාරේ ගැන වෙන්න ඇති කියලා ඒ දවස්වල හිතුනට ඇත්තටම ඒ කතාව ඇතුළේ බහුතර ලාංකිකයින්ගේ මුළු ජීවිතේම ලියැවිලා තිබ්බ නේද කියලා අද හිතෙනවා.

කෝටි ගණන් සල්ලි තිබ්බට පිටරටකට තියා කොළඹ රටටවත් පය ගහලා නැති මුදලාලිලා වගේම වොරන්ටි නැතිව ණයට ගත්ත ජීවිත ඇතුළේ රුපියල් පහක කන් හැන්දක් මිලදී ගන්න ගියත් වොරන්ටි හොයන මිනිස්සුත් ඕනතරම් අපි අවට ඉන්නවා.

කොච්චර සල්ලි තිබ්බත් දවසට බත් පිඟන් තුනක් කාලා, කොච්චර ලොකු ගෙයක් තිබ්බත් අඩි ගානක ඇඳක නිදියන මිනිස්සු වෙච්ච අපි ජීවිත කාලය පුරාම නොදන්නා මොනවදෝ හොයා හොයා පිස්සුවෙන් වගේ දුවනවා.

සතුටු වෙන්න, ජීවිතේ විඳින්න මේ හැමදේටම කලින් පෝසත් වෙන්න ඕනේ කියලා නීතියක් සම්මත වෙලා නැහැ කියලා ගොඩක් මිනිස්සු දන්නෙ නැහැ.

ජීවිතේ රස විඳින්න දන්න මිනිස්සු දේපළ, ඉඩම් පස්සේ පිස්සුවෙන් වගේ දුවන්නේ නැහැ.

ජීවිතේ රස විඳින්න දන්න මිනිස්සු දේපළ, ඉඩම් පස්සේ පිස්සුවෙන් වගේ දුවන්නේ නැහැ

ආදායමේ හැටියට ගෙයක් හදාගෙන, අවශ්‍යතාවල හැටියට කළමනා එකතු කරගෙන, සරල විදිහට ජීවිතේ ප්ලෑන් කරලා, හෙට වෙනුවට අද ඉඳලා ජීවත් වෙන කලාව දන්න මිනිස්සුන්ට මැරිලත් භූතයෝ වෙලා දේපළ පස්සේ එන්න හිතෙන්නේ නැහැ.

හේතුවක් නැතුව, තේරුමක් නැතුව, ලෝකේ තියන ඔක්කොම දේවල් තමන්ගේ කරගන්න දුවන එක නවත්තලා තියන දේවල්වලින් තෘප්තිමත් වෙලා, අතේ තියන හැටියට ජීවිතේ රස විඳින්න පටන්ගන්න. සතුට, සැනසීම තියෙන්නේ අස් කරනකොට මිසක් රැස් කරනකොට නෙමෙයි.

හිතපු නැති වෙලාවක කොවිඩ් ඇවිත් යං කිව්වත් 'හරි මම ලෑස්තියි' කියලා කියන්න පුළුවන් විදිහට ජීවිතේ රස විඳින්න පටන්ගන්න. එතකොට ඔය පීඩනය, අසහනය, තරහ, කළකිරීම, වෛරය වේලිලා ඒ වෙනුවට සතුට, සැනසීම, ආදරය, කරුණාව ටික ටික දැනෙන්න ගනියි.

ජීවන කුසලතා සහ පෞරුෂ වර්ධන උපදේශිකා
අනිෂා ජයකොඩි

මාර්ග ආරක්ෂාව පිළිබඳ පෝස්ටර් (චිත්‍ර) තරඟාවලිය

තරඟ නීතිරීති

වයස් කාණ්ඩ - පාසල් ශ්‍රේණි 6 - 9
පාසල් ශ්‍රේණි 10 - 13

මාතෘකාව - මාර්ග ආරක්ෂාව පිළිබඳ ඕනෑම සංකල්පයක් මූලිකව ඉදිරිපත් කල යුතුය.

පෝස්ටර් ප්‍රමාණය - A3 (මි.මි 297x420/අඟල් 11.7x16.5)

ක්‍රම - නිදහස් චිත්‍ර හෝ ඩිජිටල් නිර්මාණ.

ඉදිරිපත් කිරීම - නිර්මාණය නිදහස් චිත්‍රයක් හෝ ඩිජිටල් නිර්මාණයක් වුවත් අවසාන ඉදිරිපත් කිරීම JPEG නිර්මාණයක් ලෙසම ලබාදිය යුතුය.

දිවයිනේ සෑම වයස් කාණ්ඩයකම ජයග්‍රාහකයන්ට ත්‍යාග හිමිවේ.

පළමු ස්ථානය - ලැප්ටොප් පරිගණකයක්
දෙවන ස්ථානය - ටැබ්ලට් පරිගණකයක්
තෙවන ස්ථානය - වසරක් සඳහා අන්තර්ජාල සබඳතාවයක්

- ඉහළම නිර්මාණාත්මක පෝස්ටර් පනහ සහ සියලුම පළාත්වල මුල් ජයග්‍රාහකයන්ගේ නිර්මාණ ප්‍රදර්ශනයකට ඉදිරිපත් කෙරේ.

- පළමු ජයග්‍රාහකයන් තිදෙනාගේ නිර්මාණ මුද්‍රිත මාධ්‍ය වල සහ ප්‍රවාහන අමාත්‍යාංශයේ ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගැනේ.

අවශ්‍ය තොරතුරු

නම, වයස, පාසල් ශ්‍රේණිය, පළාත, දෙමාපිය/භාරකරුගේ නම

නිර්මාණ භාරගන්නා අවසන් දිනය - 2021 සැප්තැම්බර් 30

ඔබේ නිර්මාණ පහත විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන්න

traumacssl@gmail.com

වැඩි විස්තර සඳහා - දු.ක. 011-2695080

සංවිධානය :-
ශ්‍රී ලංකා ශල්‍ය වෛද්‍යවරුන්ගේ විද්‍යායතනයේ
අනතුරු කළමණාකරණය පිළිබඳ අනු කමිටුව

රටම කතා කරන සුබෝධනී කවුද?

මම පුංචි කලේ ඉඳලම විප්ලවකාරී චරිතයක්

පරිපාලන සේවයේ විවිධ කඩයිම් පසු කරමින් පැමිණි ඇය මේ වනවිට අධ්‍යාපන අමාත්‍යංශයේ අතිරේක ලේකම්වරියකි.

ගුරු වැටුප් ගැටළුව විසඳීම සඳහා පත්කළ සිව්දෙනෙකුගෙන් යුත් කමිටුවේ සභාපතිත්වය දැරුවේද ඇයයි. ඒ නිසාවෙන්ම එම කමිටු වාර්තාව හැඳින්වූයේ 'සුබෝධනී වාර්තාව' ලෙසය. ඒ සුබෝධනී කවුදැයි බොහෝදෙනෙකු තුළ කුතුහලයක් වූයෙන් අප ඇයගේ තොරතුරු සොයා ගියෙමු.

සොබාදහමට, සතා සිව්පාවුන්ට බෙහෙවින්ම ආදරය කරන ඇය ළමා වියේ මිහිරි මතකයන්ටද වඩාත් ඇලුම් කරන්නීය. මේ ඇය 'ධරණී' පාඨකයින් වෙනුවෙන් ඒ මතක පෙළගැස්වූ අයුරුයි.

ගුරුගෙදරක, ගුරු දෙමාපිය යුවළකගේ එකම දියණිය වූ ඇයට අම්මාගේ තාත්තාගේ පමණක් නොව මාමලා, පුංචි අම්මලාගෙත් මහා ආදරයක් එකවර භුක්ති විඳින්නට ඉඩකඩ ලැබිණි.

"ඇත්තටම ඒ කාලේ හරිම ලස්සනයි. මම පුංචිම දවස්වල හිටියේ අගලවත්ත, ලත්පඳුර කියන ගමේ. මගේ අම්මටයි, තාත්තටයි ගුරු මාරුවීම් එක්ක ලංකාවේ විවිධ ප්‍රදේශවලට යන්න සිද්ධ වුණා. මේ විදිහට තැන් තැන්වලට යද්දි මගේ ඉගෙනීමට බාධාවක් වෙයි කියලා ඔවුන් හිතුවා. ඒ හින්ද මම පුංචි දවස්වල ඉඳලම හැදුනේ අම්මගේ මහගෙදර. ඒ ආත්තම්මගේ ආදරය ලබමිනුයි. ඒ වෙනකොට පවුලට හිටපු එකම දරුවා මම නිසා අම්මගේ සහෝදර සහෝදරියන්ගේ ආදරය ලබන්නත් මට හැකි වුණා. ඇත්තටම මගේ මාමලාත් ගුරුවරු. ඒත් පොතට පතටම ඇලිලා ඉන්න ඕන කියලා මට කවුරුවත් නීති දැම්මේ නැහැ. විභාග පාස්වෙන්න ඕන, අනාගතයේ මෙහෙම කෙනෙක් වෙන්න ඕන කියලා බරපතළ කාරණා ඔවුන් මගේ ඔලුවට දැම්මේ නැහැ. ඒ නිසාම දඟකාර, ලස්සනම ළමා කාලයක් මට තිබුණා."

ගමට කලින් හිරු මුළුතැන්ගෙට වඩනා කිව්වම, මට මතක් වෙන්නේ පුංචි අම්මව

ඇයට ඒ ළමා කාලය හැඩ ගන්වා ගන්නට පානදුර වරාමුල්ලේ පිහිටි ආත්තම්මාගේ ගෙදර කදිම නැවතුමක් විණි. සහෝදරයෙක් හෝ සහෝදරියක නැති අඩුවද ඇයට එම සෙනෙහස මැද නොදැනුණු තරම්ය. කෙසේ නමුත් කුඩාවියේ සිටම ඇය විප්ලවකාරී අදහස්වලින් යුතු දැරියකව සිටියාය.

"මගේ අම්මට ඕන වුණේ මං ලොකු පුටුවකට යනවා දකින්න නෙමෙයි, මම හොඳ පුරවැසියෙක් වෙනවා දකින්නයි. ගහට කොළට ආදරය කරන, සතා සීපාවට ආදරය කරන, මිනිස් ගුණදහම් ආරක්ෂා කරගෙන ජීවත් වෙනවා දකින්නයි. කොහොම නමුත් මම ඉගෙනීමටත් දක්ෂයි. පාසලේ විෂය බාහිර කටයුතුවලට උනන්දුයි. ඒ වගේම තමයි මම පොත් ගුල්ලියක්. පුංචි කාලේ ඉඳලා තමයි ඒ කැමැත්ත හිතට ආවේ. සාමාන්‍ය පෙළ ලියනකල් ටියුෂන් පන්තියකට ගියේ නැහැ. මට හීන කියලා දෙයක් තිබුණෙත් නැහැ. උසස් පෙළ ලියද්දී වෛද්‍යවරියක් වෙන්න ඕන කියන ආසාව ඇතිවුණා."

ඇය ප්‍රාථමික අධ්‍යාපනය ලබන්නේ පානදුර යහපත් එඩේරාගේ කන්‍යාරාමයෙනි. බෞද්ධ දැරියක වුවද, තමාට ලැබුණු එම අවස්ථාව ජීවිතයේ සාර්ථකත්වයට බෙහෙවින්ම ඉවහල්ව තිබේ. පානදුර බාලිකාවෙන් ශිෂ්‍යත්වය සමත්වන ඇය කොළඹ විශාඛා විද්‍යාලයට ඇතුළත් වන්නේ ඉන්පසුය. සාමාන්‍ය පෙළ විශිෂ්ඨ අයුරින් සමත්ව පළමුවර ජීව විද්‍යා විෂයන්ගෙන් උසස් පෙළ කළත්, ඊට සුදුසුකම් නොලැබුණි.

"මට විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙලා විද්‍යාවේදී උපාධිය කරන්න අවස්ථාව තිබුණා. ඒත් මම ඒකට කැමති වුණේ නැහැ. මම ආසාවෙන් ඉගෙනගත් උද්භිද විද්‍යා විෂය එක්ක නැවත වරක් උසස් පෙළ විභාගය කළා. ඒ ප්‍රතිඵල හොඳයි. ඉන්පස්සේ මම රුහුණු විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙලා කෘෂිකර්ම විද්‍යාවේදී උපාධිය සම්පූර්ණ කළා. ඉන්පසුව මම පළමු රැකියාව විදිහට ජාතික අධ්‍යාපන ආයතනයේ බාහිර සම්පත් දායකයෙකු ලෙස සේවයට එක්වුණා."

ඇය පේරාදෙණිය කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියද ලැබුවාය.

"මං ඔය අතරේ පරිපාලන සේවා තරඟ විභාගයට ලිව්වා. එය සමත්වෙලා වසරක පුහුණුවෙන් පසුව (2000 වසරේ) බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යංශයේ සහකාර ලේකම්වරියක් විදිහට පත්වීම් ලබනවා. එහි වසර හතක සේවයෙන් පසු මම තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යංශය, වාරිමාර්ග හා සැලසුම් අමාත්‍යංශය, සමාජ සේවා අමාත්‍යංශයේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කළා. දැන් මම අධ්‍යාපන අමාත්‍යංශයේ අතිරේක ලේකම් (ආයතන) ලෙස සේවය කරනවා."

පරිපාලන සේවයේ වසර විසි එකක අත්දැකීම් සහිත ඇයට විවිධ අභියෝගවලටද මුහුණ දෙන්නට සිදුවූ අවස්ථා තිබේ. එහෙත් තමන් අභිමුවට එන අභියෝගවලට මුහුණ දෙන්නට තරම් ඇයට කුඩා වියේ සිටම ශක්තිමත් පදනමක් හිමිවුණි.

"ඇත්තටම ආත්තම්මගේ සෙවනේ සුන්දර ළමා කාලයක් මට හිමිවුණා වගේම, ජීවිතයේ අභියෝගවලට සාර්ථකව මුහුණ දෙන්න ඉගෙනගත්තා. අපි හුස්ම ගන්න ජීවිත. මිනිස්සුන්ට වගේම ගහකොළවලටත් සතුන්ටත් ඒ අයිතිය තිබෙනවා. ආත්තම්මා ඉන්න කාලේ ඉඳලම අපේ ගෙදර අවට පරිසරය අභය භූමියක් වගේ. සර්පයෙක් ආවත් මරන්නේ නෑ.

අපේ ගෙවත්ත සතුන්ට අභය භූමියක්. කාලයක් ඌරෙකුටත් රැකවරණය දුන්නා

දවසක් කිට්ටුව ගෙදරක මරන්න ගෙනාපු ඌරෙක් අපේ වත්තට පැනලා හැංගිලා. මරණ බයේ වත්තට ආව සතාව අරන් යන්න ආත්තම්මා ඉඩ දුන්නේ නෑ. අයිතිකාරයා නොවන කෙනෙකුට ඌරව දෙන්නේ නෑ කියලා ආත්තම්මා කිව්වා. එහෙම කාරණා එක්ක හැප්පෙන්න පෞරුෂයක් එයාට තිබුණා. ඔය විදිහට අපේ වත්තේ ඒ සතා මාස අටක් විතර හිටියා. පස්සේ ඌරාගේ සැබෑම අයිතිකාරයා ග්‍රාමසෙවක මහත්තයා එක්ක ආවා ඌරා ගෙනියන්න. ඒ නිසා සතාව එදා දුන්නා. සතුන්ට දක්වන ආදරය, කරුණාව ගැන හැඟීමක් මට ආවේ ආත්තම්මාගෙන්. පාරේ තුවාල හැදුනු බල්ලෙක් හිටියත්, ගෙදර ගෙනැත් ආත්තම්මා බෙහෙත් කරනවා. මමත් ඒවට උදව් වෙනවා. ඒ වගේම අදටත් මම පාරේ ඒවගේ සතෙක් හිටියොත් ඒ සතාට මගේ අත්දෙකෙන්ම බෙහෙත් කරනවා. අපේ ගෙදර දැනට ඉන්න පූස් සුරතලාත් පාරෙන් ගෙනාව කෙනෙක්."

ඇයගේ ආත්තම්මා මෙන්ම දෙමාපියන්ද දැන් ජීවිතයෙන් සමුගෙන ගොසිනි. නෑසියන්ගේ නොමඳ ආදරය ලැබුණෙන්, විවාහයක් ගැනද ඇය සිතුවේ නැත. අදටත් පුංචි අම්මා ඇයට සෙවණැල්ලක් මෙන් ආදරය දෙන්නීය.

"පුංචි අම්මට දැන් වයස අසූවක් විතර. ඒත් එයා මාව බලාගන්නේ අර ඉස්සර බලාකියාගත්තා වගේ. අර 'ගමට කලින් හිරු මුළුතැන්ගෙට වඩනා' සින්දුව ඇහෙද්දී මට මතක් වෙන්නේ අම්මව නෙමෙයි පුංචි අම්මව. මොකද රැකියාව එක්ක අම්මා හිටියේ දුර. ඒත් පුංචිඅම්මා ඒ අඩුව නොදැනෙන තරමටම සෙනෙහස පෑවා. අදටත් ඇය හරිම ක්‍රියාශීලීයි."

වැඩිහිටි වයසේදී දෙමාපියන්ට ආදරය කොතරම් වැදගත් දැයි ඕ අත්දැකීමෙන් දන්නීය. ඒ ඇය වැඩිහිටි ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරිය ලෙස සේවය කරද්දී, දරුවන් නොසළකන දෙමාපියන්ගේ දුක් ගැනවිලි හොඳින් අසා තිබුණු නිසාය. ඉන් ඇතම් දෙමාපියන් සේසතම දරුවන් නමට ලියාදී පාරට වැටුණු අයය.

"ඇත්තටම මම මගේ අම්මා තාත්තාට ජීවතුන් අතර හිඳිද්දී සියලු යුතුකම් කළා. මම හැම දරුවෙකුටම කියන දෙයක් තමයි මොන රාජකාරි තිබුණත් තමන්ගේ දෙමාපියන් පළමු තැන තියාගන්න. ඒ වගේම මිනිසුන් හැටියට අපි හිතින් සුන්දර විය යුතුයි. තව කෙනෙක් දිහා ආදරණීයව හිතන්න පුළුවන් වෙන්නේ එතකොට. ඒ වගේම කාන්තාවෝ ලස්සනට අඳින්න පළඳින්න කැමතියි. මමත් එහෙමයි. හැබැයි එතැනදී තමන්ට ගැළපෙන දේ තෝරා බේරාගන්න අපි දක්ෂ විය යුතුයි."

ජීවිතය සරලව ගෙවන්නට කැමති ඇයට, රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යද්දී ගෙන යන්නට ඇත්තේ ජනතාවගේ හොඳ හිත පමණක් බව ඇය කීවාය. එතෙක් තම යුතුකම්, වගකීම් මනාව ඉටු කරන්නට සැදී පැහැදී සිටින බවද ඇය අපට කීවාය.

දීපා වසන්ති එදිරිසිංහ

පුංචි දරුවන්ව බය කරන්න නෙවෙයිලු එන්නේ, කිරි පොවන්නලු

බාලගිරි යකින්නට ඉංගිරිසිත් තේරෙනවද?

'බාලගිරි දෝෂය අද නොවේ හෙට' යනුවෙන් සඳහන් පුවරු ඇතැම් නිවෙස්වල ප්‍රධාන දොර උළුවස්සේ ප්‍රදර්ශනය කොට තිබෙනු ඔබ බොහෝවිට දැක ඇත. නොඑසේ නම් ඔබේ නිවසේද එවැනි පුවරුවක් සවිකොට තිබෙනවා වෙන්නට පුළුවන.

ජන සම්මතයට අනුව 'බාලගිරි' යනු යක්ෂණියකි. මේ යක්ෂ, යක්ෂණියන් පිළිබඳ විශ්වාසය අතීත ගැමි සමාජයෙන් නවීන නාගරික සමාජය වෙතද සම්ප්‍රේෂණය වී ඇත. පසුගිය කාලයේදී මට ඒ සඳහා කදිම නිදසුනක් සපයාගත හැකි විය. ඒ මගේ හිතවතෙකු විසින් එවන ලද ඡායාරූපයකිනි. මාළඹේ හෝ බත්තරමුල්ලේ මධ්‍යම පාන්තික නිවාස පද්ධතියකට අයත් නිවාසයක බාලගිරි සඳහා වන මෙම සිංහල දැනුම්දීම වෙනුවට Balagiri Not Today It's Tomorrow යනුවෙන් ඉංග්‍රීසියෙන් සඳහන් කොට තිබිණි. 'බාලගිරිට ඉංග්‍රීසිත් පුළුවන් බව මම දන්නේ අදනේ' එම ඡායාරූපය සමඟ ඔහු එවූ විද්‍යුත් පණිවිඩයේ සඳහන්ව තිබිණි.

මේ දිනවල දරුවන් සම්බන්ධ රූපවාහිනී දැන්වීම්වලද බිළිඳු දරුවන් හිඳිනා නාගරික මධ්‍යම පාන්තික නිවාසවල උළුවස්සේ 'බාලගිරි අද නොවේ හෙට' යනුවෙන් දැක්වෙන පුවරු අප දැක ඇත. එසේම 'බාලගිරි අද නොවේ හෙට' යන වදන සඳහන් වර්ණවත් ඩිජිටල් ස්ටිකර් කොළඹ පිටකොටුවේ පීපල්ස් පාක් පොදු වෙළෙඳ සංකීර්ණයේ තොග පිටින් අලෙවි කරන බවද හිතවතෙකු මගින් මට දැනගත හැකි විය.

ජන සම්මතයේ එන බාලගිරි යක්ෂණිය වෙත කරනු ලබන ඉහත දැනුම්දීම සිදු කරනුයේ බිළිඳුන්ට වැළඳෙන 'බාලගිරි දෝෂය' මුල්කර ගනිමිනි. එබැවින් බාලගිරිට පෙර බාලගිරි දෝෂය නම් රෝග තත්ත්වය පිළිබඳව දැනසිටිය යුතුය.

ඉපදී සතියක් දෙකක් ගතවූ සමහර බිළිඳුන් සවස හිරු බැස යන යාමයේදී අත් පා හකුළුවා ගුලි වන්නට වෙර දරන්නාක් මෙන් සිදුකරන මෙම හැඬීමේදී දරුවාගේ මුහුණද එක්තරා ආකාරයකට විරූපී වෙයි. සාමාන්‍යයෙන් බිළිඳකු හඬන විට වැඩිහිටියන්ට නලවාගත හැකි වුවද මේ අසාමාන්‍ය හැඬීමේදී එවැන්නක් පිළිබඳව සිතාගන්නටවත් බැරිය. එහිදී බිළිඳු හති වැටී මළානික වන තෙක්ම පැය බාගයක් හෝ ඊට වැඩි කාලයක් නොකඩවා හඬයි. මෙහිදී බිළිඳු පළකරන අසාමාන්‍යතා සහ හඬන වෙලාව මළහිරු බසිනා වෙලාව වීම මත මෙය අමනුෂ්‍ය දෝෂයක් මත සිදුවන්නකැයි පැරණි ගැමියෝ විශ්වාස කළහ. බාලගිරි නම් යක්ෂණිය පිළිබඳ කතා ප්‍රවෘත්තියට අප පිවිසිය යුත්තේ එතැනිනි.

බාලගිරි පිළිබඳ විශ්වාසය වඩාත් ප්‍රචලිත අප රටේ වුවද එහි පුරාණෝක්තිය ඉන්දියාව හා සම්බන්ධ වූවකි. දඹදිව දන්තපුරයේ සිංහ කුමාර නම් රජුට හා හංසවතී නම් දේවියට දූව කුමරකු සහ කුමරියක් උපන්නාය. එම කුමරු දළ කුමරු ලෙසින් නම් ලද්දේය. රජගෙදර අනාවැකිකරුවන් විසින් මේ කුමරා සහ කුමරිය සම්බන්ධ බිහිසුණු අනාවැකි පළකරමින් කියා සිටියේ කවද, නමුත් දිනෙක එම කුමරිය හා කුමරුන් අඹු සැමියන් ලෙස හැසිරෙන බවය. පසුව මේ විපතින් කුමරිය බේරාගැනීම පිණිස රාජකීය මාපිය යුවළ ඇය ඉතා ආරක්ෂා සහිතව මහ වන මැද ගල් ලෙනක් තුළ සඟවා තැබූහ. නමුත් කෙමෙන් වයසින් මෝරා වැඩුනු දළ කුමරා තමන්ට නැගෙණියක සිටින බවත් තම දෙමාපියන් විසින් ඒ වනවිට ඇය මහ වනයේ ගල් ලෙනක් තුළ සඟවා සිටින බවත් දැන මහත් කම්පාවකට පත්විය. තමන්ට නැගණියව එක්වරක් දැක ගැනීමට අවශ්‍ය බව දළ කුමරුන් සිය මාපියන්ට කියා සිටියද ඔවුන්ගෙන් ඊට කිසිඳු ඉඩක් නොලැබිණ. අවසානයේ ඒ දුකින් රෝගී වූ දළ කුමරුන් ආහාර ගැනීම පවා අත්හළ අතර අවසානයේ ඔහුගේ කැමැත්තට ඉඩ දෙන්නට මාපිය යුවළට සිදුවිය. ඒ අනුව වහා නැගෙණිය වෙසෙන ගල් කුළ වෙත ගිය දළ කුමරුන්ට ඇගේ රූපශ්‍රීය දැකීමෙන් සහෝදරකම් අමතකව ගියේය. පසුව රාජකීය අනාවැකිකරුවන් කී අන්දමටම කුමරු ඒ මොහොතේම කුමරිය සහවාසයට පොළඹවා ගත්තේය. මෙම සිද්ධියෙන් දැඩි මානසික කම්පාවට පත් කුමරිය ඇසළ ගසක ගෙල වැළලාගෙන මිය ගියාය. පසුව නැගෙණිය සිදුකරගත් විපත අසා දැනගත් දළ කුමරු සොයුරු පෙමින් උන්මාදයට පත්ව ඇගේ සිරුර සොයමින් දසත පීරන්නට විය. එහෙත් දළ කුමරු පිළිබඳ දැඩි කෝපයක් සිත තුළ දරාගත් ශක්‍ර දේවේන්ද්‍රයා කුමරුට සොයාගත නොහැකි ලෙස කුමරියගේ මළසිරුර සඟවා තැබීය. නමුත් කුමරුන්ගේ ආවේගාත්මක උන්නදුව කොතෙක් ප්‍රබල වීද යත් තමන් නිසා දිවි නසාගත් කුමරියගේ සිරුර සොයාගත් බව ගිරිදේවි අස්න, ගිරිදේවි උපත සහ ගිරිදේවි කව ආදී ජනශ්‍රැති මූලාශ්‍රවල සඳහන්ය. පසුව මරණයට පත් දළ කුමරුන් 'ගරා' නමින්ද, කුමරිය 'ගිරි' නමින්ද යක්ෂ ආත්ම භාවයන් ලැබූ බව සඳහන්ය. පසුව මෙම ගරා යකු අවතාර දොළහක් ලෙසින්ද, ගිරිදේවි අවතාර දොළහක් ලෙසින්ද සමාජයට වින කරන්නට පටන්ගත් බව පැවසෙයි. කොටගම වාචීස්සර හිමියන් විසින් රචිත සරණංකර සංඝරාජ සමය නම් කෘතියේ එන පරිදි මෙම ගිරි දේවියගේ අවතාර දොළහකි. එනම් මදනගිරි, හපුමල්ගිරි, මෝලන් ගිරි, භූතගිරි, රත්නගිරි, හඳුන්ගිරි, පට්ටිගිරි, කොටගිරි, අඳුන්ගිරි, වලියක්ගිරි සහ බාලගිරි යනුවෙනි.

මෙහිදී බාලගිරි නමින් හැඳින්වෙන ගිරිදේවි අවතාරය සැන්දෑ සමයට කුඩා බිළිඳුන් වෙත පැමිණෙනුයේ ඔවුන් කෙරෙහි ඇති දරු සෙනෙහසින් තම කිරි පෙවීමට මිස බිළිඳුට අනතුරක් කිරීමට නොවේ. එහෙත් වන ඇතුන් හා දිවියන් වැනි වන සතුන් පිරිවරා එන බාලගිරි දකින බිළිඳු මහත් සේ බියපත්ව හඬන්නට පටන් ගනී. මව්පියන්ට කවර ලෙසකින්වත් නලවාගත නොහැක්කේ බිළිඳු එසේ අධික ලෙස බියට පත්ව සිටින බැවිනි. එහෙත් ඒ සඳහා කළ යුත්තේ බාලගිරි ප්‍රයෝගාත්මක ලෙස බිළිඳුගෙන් වෙන්කොට තැබීමය. 'අද එපා හෙට වරෙන්' යන අදහස සහිත පුවරු නිවසේ හෝ බිළිඳු සිටින කාමරයේ උළුවස්සක ප්‍රදර්ශනය කිරීමට අප ජන සමාජය පුරුදුව ඇත්තේ එනිසාය.

එහෙත් ලොව පුරා ව්‍යාප්ත බටහිර වෛද්‍ය ක්‍රමයට අනුව නම් මෙය බිළිඳුන්ට වැළඳෙන එක් රෝගී තත්ත්වයකි. ළමා රෝග විශේෂඥ වෛද්‍ය අජිත් අමරසිංහ පවසන අන්දමට ඉහත සඳහන් බාලගිරි දෝෂ ලක්ෂණ එලෙසින්ම දක්නට ලැබෙන මෙම රෝගය හැඳින්වෙනුයේ බිළිඳු ආමශූලය (Infantile Colic) යනුවෙනි.

මේ රෝගයේදී බිළිඳුන්ගේ උදරය සවස් කාලයන්හි වාතයෙන් පිරී යාමක් දක්නට ලැබෙන අතර අම්ල ප්‍රදාහයක්ද නොවන එම තත්ත්වයට නිශ්චිත හේතුවක් මෙතෙක් ආනාවරණය වී නැත. ආමාශය වාතයෙන් පිරී යාම මුල්කොට හටගන්නා වේදනාව දරාගත නොහැකිව ඉහත සඳහන් අන්දමටම බිළිඳුන් පැය බාගයක් හෝ ඊට වැඩි කාලයක් වුව හැඬීම මුල්කොට මහත් බියට පත්වන මාපියන් එම බිළිඳුන් වෛද්‍යවරුන් වෙත පමුණුවන බවද වෛද්‍ය අමරසිංහ කියයි. ඔහු වැඩිදුරටත් පවසන්නේ එලෙස ඖෂධ නියම නොකළද මෙය දින කිහිපයක් තුළ ඉබේටම සුව වන රෝග තත්ත්වයක් බවය.

ඒ කෙසේ වුව බාලගිරිට අද නොවේ හෙට යන්න ඉංග්‍රීසියෙන් සඳහන් කළ පුවරුව සහිත ඡායාරූපය මා වෙත යොමු කරමින් 'බාලගිරිට ඉංග්‍රීසිත් පුළුවන්' යැයි කියූ මිතුරාට මම කීවේ ඉන්දීය සම්භවයක් ඇති බාලගිරි ඇමතීමට සිංහලට වඩා ජාත්‍යන්තර භාෂාවක් වන ඉංග්‍රීසි යෝග්‍ය බැවින් මට නම් එහි කිසිඳු වරදක් නොපෙනෙන බවය.

මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ

බාලගිරි කියන්නේ ලංකාවේ යකින්නක් නෙවෙයි

දිනන්න ඔන්න මෙන්න තියෙද්දී අපිට ලයිට් ගිහින් මගේ ZOOM සබඳතාවය බිඳ වැටුණා

ඔන්ලයින් ක්‍රමයට තරඟ කර ලෝක යොවුන් චෙස් ශූරතාවලිය දිනූ දේවින්ද්‍යා ඔෂිනි ගුණවර්ධන

අක්කාගේ දඟය අඩු කිරීමට හඳුන්වා දුන් චෙස් ක්‍රීඩාවෙන් නංගී ලෝකයක් දින්නාය. දේවින්ද්‍යා ඔෂිනි ගුණවර්ධන එම නැගණියයි. ඇය 'ඔන්ලයින් ෆිඩේ' ලෝක යොවුන් චෙස් ශූරතාවලියේ වයස අවුරුදු 10න් පහළ බාලිකා ප්‍රථම ස්ථානය හිමිකර ගත්තාය. රටවල් සියයක් පමණ නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ ඊට සහභාගි වූහ. ලෝක චෙස් සම්මේලනය සහ ජෝර්ජියා චෙස් සංගමය එය සංවිධාන කළේය. තරඟාවලිය සාමාන්‍යයෙන් පැවැත්වෙන්නේ ජෝර්ජියාවේදීයි. එහෙත් කොවිඩ් වසංගතය හේතුවෙන් මෙවර එය මාර්ගගත ක්‍රමය යටතේ පැවැත්විණ. අවසාන වටයේදී ඔෂිනි හමුවේ පරාජයට පත්වූයේ ඇමරිකාවේ මේගන් ඇල්තියා යි.

චන්දිමා රත්නායක සහ උපේන්ද්‍ර ගුණවර්ධන යුවළගේ දෙවන දරුවා ලෙස දේවින්ද්‍යා ඔෂිනි උපත ලබන්නේ 2012 පෙබරවාරි පළමුවනදාය. කුඩා කාලයේ සිටම ඇය ඉතා තැන්පත්ය. ඔෂිනිගේ ප්‍රධානතම විනෝදාංශය වූයේ චිත්‍ර ඇඳීමයි. කෙළි සෙල්ලමට ඇගේ එතරම් උනන්දුවක් නොවීය. කෙතරම් කලබලකාරී පරිසරයකදී වුවද වගේ වගක් නැතිව ඇය චිත්‍ර ඇන්දය.

ඔෂිනිගේ වැඩිමහල් සොයුරිය, පැහැසරණී අරුණෝද්‍යා ඊට හාත්පසින්ම වෙනස්ය. ඇගේ දඟකාරකම් නිමක් නැත. එනිසා ඇය චෙස් ක්‍රීඩාවට යොමු කිරීමට දෙමාපියෝ තීරණය කළහ. චෙස් ගුරුවරයකු නිවසට ගෙන්වා ගැනීමට පියවර ගැනෙන්නේ ඒ අනුවයි. ඒ වනවිට නැගණියට වයස අවුරුදු හතරකි. අවසානයේ ගුරුවරයා අක්කාට උගන්වන දෑ දෙරට මුවා වී උකහා ගැනීමට නැගණිය දක්ෂ වූවාය. ඒ අතර නොදන්නා දේ සම්බන්ධයෙන් ඇය මවගෙන් උපදෙස් පැතුවාය. ඒ අනුව පාසලට ඇතුළු වීමට පෙරම චෙස් ක්‍රීඩාවේ මූලිකාංග ඉගෙනීමට ඔෂිනිට හැකියාව ලැබිණ.

පළමු ශ්‍රේණිය වෙනුවෙන් ඇය ඇතුළත් වූයේ රත්නපුර ෆර්ගියුසන් උසස් බාලිකා විද්‍යාලයටයි. එම විද්‍යාලයේ පළමු වසරේ සිටම චෙස් ඉගැන්වීම සිදුකරයි. සෙනසුරාදා දිනය ඒ වෙනුවෙන්ම වෙන්කර ඇත. වාසනාවකට මෙන් පාසලේ චෙස් ගුරුවරයා වූ ජගත් කෙතලවල ඔෂිනිගේ දක්ෂතා හඳුනාගත්තේය. පළමු ශ්‍රේණියේ අවසන් වාරයේ සිට ඇගේ දක්ෂතා මතුවුවද ඊට පසු වසර යහපත් වූයේ නැත. ඒ පාස්කු ප්‍රහාරය හේතුවෙන් පුහුණුවීම් නවතා දැමීමට සිදුවූ බැවිනි. අපේක්ෂිත අරමුණ ඉටු වී තිබූ බැවින් ඒ වනවිට වැඩිමහල් දියණිය වෙනුවෙන් පැවති පෞද්ගලික චෙස් පන්තියද නවතා තිබුණේය.

නමුත් දෙයක් ආරම්භ කළහොත් එය අත්නොහරින ගුණයක් කුඩා ඔෂිනි සතුවිය. ඇය නිවසේදී සහෝදරිය සමඟ දිගටම පුහුණුවීම් කළාය. නැගණිය හමුවේ එකදිගට පරාජය වනවිට අක්කා ටිකෙන් ටික පසෙකට වෙද්දී කුඩා දියණියගෙන් මවට ගැලවීමක් නොවීය. ඒ නිසා ඇය සමඟ ක්‍රීඩා කිරීමට චෙස් ක්‍රීඩාවේ වැඩි යමක් නොදැන සිටි මවටද එය හැදෑරීමට සිදුවිය. ඇය දියණිය සමඟ ගොස් ඊට අදාළ පොත පත පවා මිලදී ගත්තාය. එහෙත් පුංචි හපනිය හමුවේ ඈ සැමවිටම පරාජය වූවාය. දිනීමට බොහෝ මනාප ඔෂිනි ඉන් ලැබූයේ ඉමහත් තෘප්තියකි.

දෙවන ශ්‍රේණියේ දෙවන වාරය අවසන් වනවිටම ඔෂිනි චෙස් තරඟ සඳහාද සහභාගි වූවාය. පවුලේ හිතවතෙකු වූ රසික සමරනායකගෙන් පුහුණුවීම් සඳහා ඔෂිනිට සහාය හිමිවිය. ඔෂිනි ප්‍රථමයෙන් සහභාගි වූයේ පාසල් චෙස් සංගමය සංවිධානය කළ තරඟවලටයි. රත්නපුර දිස්ත්‍රික්කයේ දෙවන ස්ථානය දිනීමට ඇය ආරම්භයේදී සමත් වූවාය. සමස්ත ලංකා මට්ටමින් හිමිවූයේ දසවන ස්ථානයයි. අනතුරුව පැවති තරඟාවලි කිහිපයකදීම ඇය විවිධ ජයග්‍රහණ ලැබුවාය. ජාතික යොවුන් චෙස් තරඟාවලියේ සමස්ත ලංකා ශූරතාවක් දිනීමට ඔෂිනි සමත් වන්නේ ඊට පසුවයි. චෙස් ක්‍රීඩාවට දක්වන දක්ෂතාව මත ඔෂිනිට තවත් සහාය ලබාදිය යුතු බවට දෙමාපියන් තීරණය කළේ ඒ අනුවය. දක්ෂ චෙස් පුහුණුකරුවකු වන අකිල කාවින්ද වෙත ඔෂිනි යොමු කෙරෙන්නේ එනිසාය.

"සර් පන්ති කරන්නේ කොළඹ. ඒ නිසා සිකුරාදට පාසල් නිමාවුණාම මම දුව අරගෙන කොළඹ එනවා. සිකුරාද පන්තිය ඉවර වෙන්නෙ රෑ 9ට. අපි කොළඹ කාමරයක් අරගෙන එදාට නවතිනවා. පහුවෙනිදටත් පන්තියට ගිහින් එහෙමම ආයෙ රත්නපුරේ යනවා. ලොකු දුව මගේ අම්මා ගාව නවත්තලා එන්නේ. අපි එයාටත් මේ ක්‍රීඩාව පටන්ගත්තේ ලොකුවට තරඟ කරන්න හිතාගෙන නෙවෙයි. ඒත් පොඩි දුව ඒකට ගොඩක් දක්ෂයි කියලා අපට තේරුණ නිසා ඒකට අවශ්‍ය සියලු පහසුකම් ලබා දුන්නා. ඒ වෙනුවෙන් අපිත් කැපවුණා."

ඇගේ මව පවසන පරිදි, තරඟයක් කොතැනද ඔෂිනි එතැනය. චෙස් මෙන්ම ටෙනිස් ක්‍රීඩා කිරීමටද ඔෂිනි බොහෝ ප්‍රිය කරයි. ෆර්ගියුසන් විද්‍යාලයේ ඇගේ වයස් කාණ්ඩයේ පාසල් ටෙනිස් කණ්ඩායමේ නායිකාව ලෙසද ඇය කලක් කටයුතු කළාය. එහෙත් චෙස් සහ ටෙනිස් තරඟාවලි එකම කාලසීමාවල පැවතීම හේතුවෙන් තෝරාගැනීමක් කිරීමට ඇයට සිදුවිය. චෙස් ක්‍රීඩාවට පමණක් ඇගේ අවධානය හිමිවූයේ ඒ අනුවය. එහෙත් පසුකාලීනව ටෙනිස් ක්‍රීඩා කිරීමේ බලාපොරොත්තුවද ඈ සතු බව මව කියන්නීය.

"එයාට හීනයක් තියෙනවා කොළඹ විශාඛා විද්‍යාලයට ඇතුළු වීමට. ඒකට ශිෂ්‍යත්වය හොඳින් සමත් වෙනවා කියලයි දුව කියන්නේ. දැන් චෙස් විතරක් කරලා කොළඹ ආවට පස්සෙ ටෙනිස් ක්‍රීඩාවත් කරනවලු. අපි ඉතින් එයාට කැමති විදියට, එයා දක්ෂ දේ කරන්න ඉඩ දෙනවා මිසක් කිසිම බලපෑමක් කරන්නෙ නෑ."

අකිල කාවින්ද ගුරුවරයාගේ මග පෙන්වීම යටතේ අන්තර්ජාතික තරඟවලට ඔෂිනි සහභාගි වන්නේ අනතුරුවයි. මේ වනවිට මාස කිහිපයක සිට ඔෂිනි සිය මව සහ සොයුරිය සමඟ කොළඹ නැවතී සිටී. ඒ මාර්ගගත ක්‍රමය යටතේ තරඟාවලි කිහිපයක් පැවැත්වෙන බැවිනි. ලෝක යොවුන් චෙස් ශූරතාවලියට ඇය සහභාගි වූයේද ඒ අතරතුරය. අවසන් පූර්ව වටයේදී රුසියාවේ ඩයනා ප්‍රෙබ්‍රසෙන්ස්කයා සහ ඔෂිනි අතර වූයේ තියුණු තරඟයකි. අන්තර්ජාතික ශ්‍රේණිගත කිරීම්වලදී ඩයනා ප්‍රසාද ලකුණු 300 කින් පමණ ඔෂිනිට වඩා ඉදිරියෙන් සිටී. එහෙත් පුහුණුකරුගේ විශ්වාසය තහවුරු කරමින් ඔෂිනි ජය ගත්තාය. අවසන් තරඟය ඇයට අභියෝගයක් නොවීය. ජයග්‍රහණය පෙනි පෙනී විනාඩි දෙකකට ආසන්න කාලයක් ඉතිරිව තිබියදී අනපේක්ෂිත සිදුවීමකි. විදුලිය විසන්ධි වීමෙන් ඔෂිනිගේ සූම් සබඳතාව බිඳවැටිණ. එහෙත් කලබල නොවූ ඇය බේරුම්කරු දැනුවත් කර, තරඟයට නැවත සම්බන්ධ වූවාය. ඉතිරි තත්පර කිහිපයේදී ජය තහවුරු කරගත් ඇයට මගදී ඉවත්වීම ගැන විරෝධතා මතු නොවුණේ ඒ වනවිටද පැහැදිලිව ඉදිරියෙන් සිටි බැවිනි.

මං කවදහරි වර්ල්ඩ් චෙස් චැම්පියන් වෙනවා. ඊටපස්සෙ ඩොක්ටර් කෙනෙක් වෙනවා

කෙතරම් විශාල ජයකදී වුව ඇය තෑගි භෝග ඉල්ලා කරදර නොකිරීමද විශේෂත්වයකි. මව පවසන්නේ ඇය ඉල්ලන ත්‍යාග කිසිවක මිල රුපියල් 150 ඉක්මවා නොයන බවයි.

"මේ වයසෙ දරුවකු නොහිතන තරම් දුව අපි ගැන හිතනවා. මේ ක්‍රීඩාව කිරීමට අපි කරන වියදම්, කැපවීම් දුවට හොඳට තේරෙනවා. ඕල් අයිලන්ඩ් යූත් මීට් එක දිනලා එයා ඉල්ලුවෙ පොප්කෝන් පැකට් එකක්. ඇඳුමක් ගන්න ගියත් මට කියනවා වියදම් වැඩි නිසා මිල අඩු එකක් ගමු නේද කියලා. මටත් හිතාගන්න අමාරුයි, එයාගෙ විදිය. ඒ වගේමයි හරිම සැලැස්මක් ඇතුව දුව වැඩ කරන්නේ. එයාගේ අරමුණ තමයි අඩුම වයසින් ලෝක ශූරිය වෙන එක. නවය වසරෙදි ඒක කරන්න බැරි වුණොත් සම්පූර්ණයෙන්ම අධ්‍යාපනයට මුල්තැන දෙනවා කියනවා."

ඒ බව දේවින්ද්‍යා ඔෂිනි ද තහවුරු කරයි.

"මේ දිනුම ගැන මට ගොඩාක් සතුටුයි. මං කවදහරි වර්ල්ඩ් චෙස් චැම්පියන් වෙනවා. ඊටපස්සෙ ඩොක්ටර් කෙනෙක් වෙනවා."

ඔෂිනිගේ කාමරයේ අපූරු සිතුවමක් ඇත. ඒ ඈ විසින්ම චිත්‍රයට නගනු ලැබූ ඇගේ සිතිවිල්ලයි. එහි පඩිපෙළකි. පඩියෙන් පඩිය චෙස් ක්‍රීඩාවේ විවිධ මට්ටම් ලකුණු කර ඇත. පුහුණුකරු ඇය ඉහළ රැගෙන යනු අයුරු එහි ඇත. උස් පඩියේ ඔෂිනි සිටින්නේ ශ්‍රී ලංකා ධජය සහ කුසලානයක් සමඟිනි. "WORLD CHAMPION" යනුවෙන් චිත්‍රයේ ලියා ඇත.

පුංචි හීන බොහෝ විශාලය. ඔවුන් දකින හීනයට රුකුල් දුන්විට අවසානය විශිෂ්ට වනු නොඅනුමානය.

රජනිකා ලියනගේ

දුව කවදාවත් රු.150 ට වැඩි තෑග්ගක් ඉල්ලලා නෑ. ඕල් අයිලන්ඩ් යූත් මීට් එක දිනලා එයා ඉල්ලුවෙත් පොප්කෝන් පැකට් එකක්

WORLD CHAMPION වීමට ඇයගේ තිබෙන සිහිනය ගැන ඇය ඇඳ ඇති චිත්‍රය

කවරයේ කතාව

ගුවන් සේවිකාවක් වෙන්න බය වෙන්න ඕන නෑ

ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ජ්‍යෙෂ්ඨතම කාන්තා මැදිරි කළමනාකාරිණී ලක්මිණී ජයසූරිය

"ශ්‍රී ලංකන් ගුවන් සේවයේ අපේ නිල ඇඳුම ඇඟට දාගෙන වෙනත් රටවල මිනිස්සු ඉස්සරහට යද්දී හිතට දැනෙන හැඟීම වචනවලට පෙරළන්න බැහැ. විදෙස් රටවල අය අපේ නිල ඇඳුමට ලස්සනයි කිව්වම ඒක දැනෙන්නේ හරියට අපේ රට ලස්සනයි කිව්වා වගෙයි. එතකොට නම් හරි ආඩම්බරකමක් දැනෙනවා."

එසේ පවසන්නී, ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ජ්‍යෙෂ්ඨතම කාන්තා මැදිරි කළමනාකාරිණී ලක්මිණී ජයසූරියයි.

මේ දිගහැරෙන්නේ අද 'ධරණී' කවරය දරාසිටින ගුවනේ හැඩකාරිය, ලක්මිණී අපට කියූ සුවිශේෂී කතාවයි.

"ගුවන් සේවිකාවක් වෙන්න ඕනේ කියන හීනය මගේ හිතට කාවැදුනේ ඉස්කොලේ යන කාලෙදිමයි. මගේ හොඳම යාළුවගෙ අක්කා ගුවන් සේවිකාවක්. ඉතින් අක්කා එයාට කියන ලස්සන අත්දැකීම් ගැන යාළුවා මටත් කියනවා. ඒ කතා අහනකොට මටත් කවදහරි ගුවන් සේවිකාවක් වෙන්න ඕන කියලා හිතුණා. ඒ හැඟීම තමයි මාව ගුවන් සේවිකාවක් කළේ."

ලක්මිණී මුලින්ම ශ්‍රී ලංකන් ගුවන් සේවයේ පුහුණුවට බැඳෙන්නේ 1990 වසරේදීය.

"ඒත් ඒ වෙලාවේ පුහුණුවට යන්න වුණේ මාස දෙකයි. මගේ අම්මා ගණකාධිකාරිනියක්. තාත්තා රජයේ උසස් පරිපාලන නිලධාරියෙක්. මගේ උසස් අධ්‍යාපනය ගැන ඔවුන් ගොඩක් හීන දැක්කා. ඒ නිසා මමත් ගුවන් සේවිකා පුහුණුවෙන් ඉවත් වෙලා අධ්‍යාපනයට වැඩි අවධානයක් දුන්නා."

නමුත් ඇය නැවතත් 1995 වසරේදී පමණ ගුවන් සේවිකාවක් ලෙසින් ශ්‍රී ලංකන් ගුවන් සේවයට එක්වන්නීය.

"ගොඩක් අය හිතන්නේ ගුවන් සේවිකාවක් වෙන්න ලස්සන විතරක් තිබුණම ඇති කියලනේ. හැබැයි ඒක වැරදියි. ගුවන් සේවිකාවක් විදිහට පුහුණු වෙනකොට මෘදු කුසලතා සහ දැඩි කුසලතා කියන අංශ දෙකක පුහුණුවීම් ලබාදෙනවා. ඒ පුහුණුවීම් ඇතුළෙදි පෞරුෂය ගොඩනගාගන්න හැටි, ගුවනේදී මගීන්ගේ ආරක්ෂාව සලසන හැටි පුහුණු කරනවා. ඒ විතරක්ම නෙවෙයි අනපේක්ෂිත අනතුරු, භයානක අවස්ථා වගේ දේවලට හොඳින් මුහුණදෙන හැටි, ආහාර පරිපාලනය, මගියෙකුට වෛද්‍ය ප්‍රථමාධාර ලබාදීමට අවශ්‍ය දැනුම වගේ පුළුල් පරාසයකට ඔය පුහුණුව විහිදෙනවා.

ගුවන්යානයක් ගිනි ගත්තොත් එහෙමත් නැත්නම් මුහුදට කඩා වැටුණොත් ගුවන් සේවිකාවක් විදිහට කටයුතු කරන්න ඕන විදිහත් ප්‍රායෝගිකව අපිට කියලා දෙනවා. පරණ ගුවන්යානයක් ගිනි ගන්න සලස්වලා එහෙම තමයි මේ ප්‍රායෝගික පුහුණුවීම් කරන්නේ. ඉතින් ඒවත් එහෙම ලෙහෙසි පහසු පුහුණුවීම් නෙවෙයි."

ගුවනේදී මගීන්ගේ ආරක්ෂකයින්, වෛද්‍යවරුන් සේම උපදේශකවරුන් වන්නේද මැදිරි කාර්යය මණ්ඩලයයි. ගුවන් සේවිකාවක් වීමට මේ සියල්ල මාස තුනක පුහුණුවකින් උගත යුතු අතර, ඉන්පසු පැවැත්වෙන සම්මුඛ සහ ලිඛිත පරීක්ෂණ සමත්වීමද අනිවාර්යය.

"ඒ ටෙස්ට්වලට ලකුණු 99ක් ගන්න එක අනිවාර්යයි. ඊටපස්සේ අපිට පුහුණු ගුවන් සේවිකාවක් විදිහට ගුවන්වාර තුනක් යන්න අවස්ථාව ලැබෙනවා. ඒ ගුවන්වාර තුනෙන් පස්සේ තමයි ගුවන් සේවිකාවක් විදිහට බලපත්‍රය ලැබෙන්නේ. මගේ පළවෙනිම ගුවන් ගමන යෙදුණේ සෞදි අරාබියේ දහරාන් නගරයට. එදා දැනුණු සතුට නම් මට තවමත් අමතක නැහැ."

ගුවන් සේවිකාවක ලෙස සේවය කරන අතරතුරම කලා උපාධිය, ශාස්ත්‍රපති උපාධිය සහ නීතිවේදී උපාධි සම්පූර්ණ කරමින් මාපිය සිහින සැබෑ කිරීමටද ඇය සමත් වූවාය.

"සේවයට බැඳිලා අවුරුදු තුනකින් කැබින් සුපවයිසර් තනතුරට අයැදුම් කරන්න පුළුවන්. සුපවයිසර් කෙනෙක් විදහට වසර පහක් සේවය කළාට පස්සේ තමයි කැබින් මැනේජර් කියන තනතුරට යන්න පුළුවන් වෙන්නේ. 2011 අවුරුද්දේ තමයි මම කැබින් මැනේජර් කෙනෙක් විදිහට වැඩ බාරගත්තේ. දැන් ශ්‍රී ලංකන් ගුවන් සේවයේ කැබින් මැනේජර්වරුන් එකසිය ගානක් ඉන්නවා. එයින් 22ක් කාන්තාවන්."

ලක්මිණීගේ නිල ඇඳුම ගුවන් සේවිකාවන්ගෙන් අප නිතර දකින නිල් පැහැති නිල ඇඳුම නොවේ. ඇය හැඩවන්නේ මැදිරි කළමනාකාරිණියන් සඳහා වෙන්වූ තැඹිලි පැහැති ඔසරියකිනි.

"ගුවන් නියමුවන්ගෙන් පස්සේ ගුවන්යානයේ සියලුම වගකීම් පැවරෙන්නේ කැබින් මැනේජර්ට. යානයේ මගීන් සම්බන්ධ ගැටළු, පියාසරියේදී මගීන්ගේ සියලුම කටයුතු කළමනාකරණය කිරීම සහ කාර්යය මණ්ඩලය හැසිරවීම වගේ විශාල වගකීමක් මෙතැනදී අපට පැවරෙනවා."

ගුවන් සැරියේදී සිදුවන අනපේක්ෂිත සිදුවීම්වලදී නොබියව කටයුතු කරමින් ගුවන් මගීන්ව සන්සුන් කිරීමද ඇයට පැවරෙන ප්‍රධාන රාජකාරී අතරින් එකක්ය. ඒ පිළිබඳ ඈ සතු සුවිශේෂී මතකයන් ලක්මිණී දිගහැරියේ මෙසේය.

"එකපාරක් අපි ගිය ගුවන්යානයක එන්ජින් එකක ප්‍රශ්නයක් වෙලා නැවත ගොඩබාන්න සිද්ධ වුණා. මේක නිවේදනය කළාම ගොඩක් මගීන් හරියට කලබල වුණා. ඉතින් පස්සේ කොහොමහරි එයාලව සන්සුන් කරලා ගුවන්යානය ගොඩබෑමට සූදානම් කළා. මේ සේරටම ලැබෙන්නේ විනාඩි කිහිපයක් විතරයි. වාසනාවකට එදා අපි කිසිම කෙනෙක්ට අනතුරක් වුණේ නැහැ."

එවැනි සිදුවීම්වලට අමතරව ඇතැම් මගීන්ගේ ක්‍රියාකලාපයන් නිසා අපහසුතාවලට පත්වන අවස්ථාද ඇති බව ඈ කියයි.

"මම බොහොම නිහතමානී විදිහට මගේ සේවය ලබාදෙන කෙනෙක්. හැබැයි එකම දේ කිහිපවරක් කිව්වත් තේරුම් ගන්නේ නැති මගීනුත් නැතුවම නෙවෙයි. එහෙම වෙලාවට අපි මුලින්ම වචනයෙන් අවවාද කරනවා. පස්සේ ලිඛිතව අවවාද කරන්න සිද්ධ වෙනවා. ඒ කරලත් බැරිවෙන තැනදී පුංචි මාංචු කුට්ටමක් වගේ එකක් දාන්න සිද්ධවෙනවා. සිඩ්නිවල ඉඳලා එනකොට දවසක් එක පුද්ගලයෙක් බොහොම කලහකාරී විදිහට හැසිරෙන්න පටන්ගත්තා. ඔහුගේ අත්වලට මාංචු දාන්න යද්දී ඔහු ඉතාම වැරෙන් ඔහුගේ කකුලෙන් මට පහර දුන්නා. පස්සේ තමයි ඔහු යම් මානසික ගැටළුවකින් පීඩා විඳින පුද්ගලයෙක් කියලා අපි දැනගත්තේ."

වෘත්තීමය ජීවිතය තුළ අයහපත් අත්දැකීම්වලට වඩා යහපත් අත්දැකීම් වැඩි බව ඈ කීවේ සතුටු සිතින්ය.

"සුවිශේෂී පුද්ගලයින් අපිට දිනපතාම වගේ හමුවෙනවා. ශිල්පා ශෙට්ටි, මධුරි දික්සිත් වගෙ නළු නිළියන් ඕනෑතරම් මට මුණගැහිලා තියෙනවා. එතනින් ගියහම වෙනත් රටවල ක්‍රීඩක ක්‍රීඩිකාවන්, දේශපාලන නායකයින්, ජනාධිපතිවරුන් සහ ජනප්‍රිය චරිත අපට හමුවෙනවා. අපිත් එක්ක ඡායාරූප ගන්න පවා ඔවුන් හරි කැමැතියි."

ඇය කියන්නේ එවැනි හමුවීම් ඇය ජීවිතයේදී ලද සුවිශේෂී අත්දැකීම් බවය.

කොවිඩ් ව්‍යසනයෙන් රට රටවල ශ්‍රී ලාංකිකයන් අසරණ වුණු මොහොතේදී ජාතික මෙහෙවරක යෙදෙන පිරිස අතර ලක්මිණී ඇතුළු ශ්‍රී ලංකන් ගුවන් කාර්යය මණ්ඩලයද වූ බව නොකියාම බැරිය.

"අපේ ශ්‍රී ලාංකිකයින් වෙනත් රටවල හිරවෙලා අසරණ වුණු අවස්ථාවක් තිබුණානේ. ඒ වෙලාවේ අපි එයාලව ගන්න ගියහම ප්ලේන් එකට නැග්ග හැටියෙම ගොඩක් අය කිව්වේ 'ලංකාවට ගියා වගේ දැනෙනවා' කියලයි. සමහරු ඒ වෙලාවේ අපිව බදාගෙන ඇඬුවා. ඇත්තටම ඒක හරිම සංවේදී කාලයක්. අපිත් මේ රටට ලොකු සේවයක් කරනවා නේද කියන හැඟීම ඒ වෙලාවෙදි මගේ හිතට නම් තදින්ම දැනුණා."

> **ගුවන් ගමනකදී කලහකාරී විදියට හැසිරුණොත් අපි මුලින්ම වචනයෙන් අවවාද කරනවා. පස්සේ ලිඛිතව අවවාද කරන්න සිද්ධ වෙනවා. ඒ කරලත් බැරිවෙන තැනදී පුංචි මාංචු කුට්ටමක් වගේ එකක් දාන්න සිද්ධවෙනවා**

ශ්‍රී ලංකන් ගුවන් සේවය සැමවිටම දෙස් විදෙස් ගුවන් මගීන්ට වඩා උසස් සේවයක් ලබාදීමට බැඳී සිටින බව පැවසීමටත් ඈ අමතක නොකළාය.

"සමහර විදේශීය මගීන් පවා වෙනත් ගුවන් සේවාවල යන්නේ නැතුව වේටින් ලිස්ට්වල ඉඳලා අපේ ගුවන් සේවය එක්ක එකතු වෙනවා. එකපාරක් අපේ සේවය ගැන පැහැදුනු කුවේට්වල කුමාරයෙක් අපේ සේවයට කරන ගෞරවයක් විදිහට ගුවන්යානයේ මුළු කාර්යය මණ්ඩලයටම ඒ රටේ තියෙන ලොකුම රෙස්ටුරන්ට් එකක භෝජන සංග්‍රහයකට ආරාධනා කළා. ඉතින් ශ්‍රී ලංකන් එයාලයින් අපේ ගුණාත්මකබව ගැන පැහැදිලි කරන්න ඒ උදාහරණයම ප්‍රමාණවත් කියල මම හිතනවා."

ඒ සියල්ල මැද රැකියාවත්, පෞද්ගලික ජීවිතයත් සමබර කරගැනීමට ඇයට සැමියාගෙන් නිබඳවම සහාය ලැබුණු බවත් ලක්මිණී මතක් කළාය.

ඇයගේ ඉදිරි බලාපොරොත්තුව ගුවන් මැදිරි කළමණාකාර තනතුරට පසුව තිබෙන ගුවන් මැදිරි සේවා උපදේශක තනතුර සඳහා අයැදුම් කිරීමයි. මැදිරි කාර්යය මණ්ඩලයට අවශ්‍ය උපදේශන සහ පුහුණුවීම් ලබාදීම එම තනතුරේ ස්වභාවයයි. එසේම ගුවන් සේවිකාවක ලෙස සේවයට බැඳීමට කැමැත්තක් දක්වන තරුණියන් වෙනුවෙන් වචන කිහිපයක් පැවසීමටද ඈ අමතක නොකළාය.

"ශ්‍රී ලංකන් ගුවන් සේවයේ මැදිරි කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් 1,100ක් වගේ ප්‍රමාණයක් ඉන්නවා. එතනිනුත් 750ක්ම කාන්තාවන්. සමහර අය කියනවනේ ගුවන් සේවිකාවක් වෙන එක ඒ තරම් හොඳ රැකියාවක් නෙවෙයි කියලා. ඒ කතාව සම්පූර්ණයෙන්ම වැරදියි. කවුරුහරි මේ රැකියාව තෝරගන්න ඉන්නවා නම් බය නැතුව මේක තෝරගන්න. ඇත්තමයි ඔයාට දවසක හදවතින්ම ආඩම්බර වෙන්න පුළුවන් කියලා මම කියනවා."

සෙව්වන්දි හෙට්ටිආරච්චි

ඡායාරූප - මධුසංක සිරිවර්ධන

පඹයෙක් මිසක් හරි පිරිමියෙක් ගෑනුන්ගේ හැම උද්දච්චකමක්ම ඉවසන්නෙ නෑ

පුහු මාන්නයෙන් ඔලුව උදුම්මවාගෙන ජීවත්වන අයගේ කතා බොහෝවිට අවසාන වන්නේ වෙන්වීම්වලින් නැත්නම් තනිවීම්වලින්

අද කතාවේ කතා නායිකාව නෙළුම් ය. කතා නායකයා සරත් ය.

බැලූ බැල්මට වයස හතළිහක් පමණ පෙනුණත් නෙළුම් ඉතා සොඳුරු රුවක් හිමි කාන්තාවකි. ඇය සමඟම කාර්යාලයට ඇතුළු වූ අනෙක් පුද්ගලයා ඇගේ සැමියා විය හැකි බව මම අනුමාන කළෙමි.

"මේ ඉන්නේ මම බැඳලා හිටපු කෙනා... අපි දික්කසාද වෙලත් දැන් අවුරුදු හතක් විතර වෙනවා..."

සංවාදයට ප්‍රවේශය ලබාගත්තේ නෙළුම්ය. බොහෝ අඹු-සැමියන් පවුල් උපදේශන සේවාවන් ලබාගන්නේ එකිනෙකාගෙන් වෙන්වීමට පෙරාතුවය.

නමුත් දික්කසාදයට පසු උපදේශන ලබාගැනීමට පැමිණි යුවළක් මෙයට පෙර මට හමුවී නොතිබුණු නිසා මම තරමක් පුදුමයෙන් මෙන් නෙළුම් දෙසත් සරත් දෙසත් බැලුවෙමි.

මා සිතූ දේ වටහාගත් නිසාදෝ නෙළුම් නැවතත් ඇගේ හඬ අවදි කළාය.

"අපි ආයෙමත් කසාද බඳින්න යන්නේ... ඒකයි අපි මිස්ව හම්බවෙන්න ආවේ..."

කාරණය පැහැදිලිය. නෙළුම්ටත් සරත්ටත් අවශ්‍යව තිබුණේ නැවත විවාහ වීමට පෙර පූර්ව විවාහ උපදේශනයක් ලබාගැනීමටයි. ඒ සඳහා ඔවුන්ගේ කතාවේ මුල, මැද, අග හොඳින් ගැටගසා ගත යුතු නිසා මෙයට පෙර ඔවුන් වෙන්වූයේ ඇයි දැයි මා විමසා සිටියෙමි.

"මම ඒ තරම් සල්ලි තියෙන පවුලක කෙනෙක් නෙවෙයි. මම උත්සාහයෙන් ගොඩ ආව කෙනෙක්. මේ වෙනකොට මට මගේම කියලා බිස්නස් දෙක තුනක්ම තියෙනවා."

එවර හඬ අවදි කළේ සරත්ය.

"මෙයාලා නම් ඉතින් උපතින්ම වලව්කාරයෝ..."

ඉතා උසස් යැයි සම්මත පවුලක එකම දියණිය වන නෙළුම්ට බොහෝ දේපළ, ඉඩකඩම් හිමි බව සරත් කියයි.

"අපි කසාද බැන්දේ විවාහ යෝජනාවකින්. මාව බඳින්න කලින් ගෙදරින් හිසේ කෙස් ගාණට මෙයාට මඟුල් හොයලා තියෙනවා."

වංශවත් බව නිසා නෙළුම් බොහෝ මඟුල් තුලාවල අඩුපාඩු දැක තිබුණු අතර, අවසානයේදී ඇය සරත්ගේ යෝජනාවට කැමති වී ඇත්තේද විවාහ වන වයස පසුවන දෝෂයක් නිවසේ සිටීම නිසා තමාගේ පවුලේ නම්බුවට හානියක් වනු ඇතැයි සිතාය.

"කසාද බඳින්න කලින් ඉඳලම මෙයා උද්දච්ච කෙනෙක් කියලා මට තේරුණා. ඒත් බැන්දට පස්සේ ඕවා හරියයි කියලා හිතලා තමයි මම මෙයාව කසාද බැන්දේ..."

විවාහ වී දින කිහිපයක් ගතවීමටත් පෙරාතුව නෙළුම් තම පරම්පරාවේ පම්පෝරිය ගසමින් වංශය කබල් ගෑමට පටන්ගත් බව සරත් කීවේය.

"පවුල ගැන පම්පෝරි ගහන එක නම් ඇත්තටම මම ගණන් ගත්තේ නැහැ. ඒත් මෙයා හැමවෙලාවෙම මාව හෑල්ලු කරලා කතා කළා. 'ඔයාලා ඉතින් ඊයේ පෙරේද සැප විඳින්න පටන්ගත්ත මිනිස්සුනේ. අපි එහෙමද? අපෙ හත්මුතු පරම්පරාවම ඉතින් රජ කාලේ ඉඳලම සැප සම්පත් විඳපු අයනේ' කියලා තමයි මෙයා හැමවෙලාවෙම කිව්වේ."

විවාහයෙන් පසු තමාගේ නෑදෑ හිතමිත්‍රාදීන් සමඟ වැඩි ඇයි හොඳයියක් තබා නොගන්නා ලෙසත් නෙළුම් තමාට පැවසූ බව සරත් කියයි.

"එහෙමයි කියලා කියන්න සල්ලියක් නැති නෑයොත් මට ඉන්නවා. ඉතින් මම එයාලව ආශ්‍රය කරනවටත් මෙයා කැමති නැහැ. ඒ අයගේ මඟුලක්, මරණයක් වුණොත් 'අපෝ ඔය තර්ඩ් ක්ලාස් මිනිස්සු අස්සේ මට රිංගන්න බැහැ' කියලා මෙයා ඒවා මඟ ඇරියා.

අනික මම මෙයාට අතට පයට වැඩ කරන්න අය පවා දීලයි තිබ්බේ. ඒත් ඉතින් ආසාවට මෙයාගේ අතින් හදපු තේ එකක් ඉල්ලුවොත් 'මම මෙච්චර දාවැද්දක් අරන් ආවේ තමුන්ට තේ හදලා දෙන්නද' කියලා අහන වෙලාවලුත් තිබුණා."

නෙළුම්ගේත් සරත්ගේත් පවුලට තවත් අමුත්තෙකු එකතු වෙන ලක්ෂණ පහළ වී තිබුණේ ඔය අතරය. දරුවා ලැබුණු පසු නෙළුම්ගේ මේ අහංකාර ගති ලක්ෂණ පහව යනු ඇතැයි තමා විශ්වාස කළ බවත් සරත් කීවේය.

"ඒත්... දුව ලැබුණා කියලත් මෙයාගේ වෙනසක් වුණේ නැහැ... ඉතින්..."

පුහු ආඩම්බරකම් පසෙකලා එකිනෙකාට ගෞරව කිරීම, සම සිතින් සැලකීම, සැමියා බිරිඳ සමඟ ආදරණීයව සතුටින් ජීවත්වීමට හේතුවන බව වටහාගැනීම වැදගත්ය

දියණියට වසර පහක් පමණ ගත වනවිට ඉවසාගත නොහැකි වන තරමටම නෙළුම්ගේ පරම්පරා කයිවාරුවේ සහ තමාව පහතට හෙළා කතා කිරීමේ පීඩනය තමාට දැනුණ බව සරත් කියයි.

"දවසක් මම හොඳටම බීලා ගිහින් කයිවාරුව දෙපිටින් යන්න මෙයාට හොඳටම බැන්නා. ඒ වෙලාවෙම මෙයා මගේ දරුවවත් අරගෙන ගෙදරින් යන්න ගියා."

පසුව සරත්ගෙන් නීතියෙන් වෙන්වීමටද නෙළුම් තීරණයකොට තිබිණි.

"මෙයා එහෙම තීරණයක් ගනී කියලා නම් මම හීනෙකින්වත් හිතුවේ නැහැ. පස්සේ ඉතින් අපි වෙන්වුණා. ඊටපස්සේ ඉඳලා හිටලා මම දුවව බලන්න මෙයාලගේ ගෙදරට ගියත් මෙයා මට මුලිච්චි වෙන්න ගෙයින් එළියටවත් ආවේ නැහැ."

වසර ගණනකට පසු නෙළුම්ගේත් සරත්ගේත් නැවත හමුවීම සනිටුහන් වන්නේ දියණියගේ වැඩිවිය පැමිණීම වෙනුවෙන් නෙළුම්ගේ නිවසේ පැවති සාදයේදීය.

"පවුල, වත්පොහොසත්කම්, රූපය මේ හැමදෙයින්ම අන්ධ වෙලා තමයි ඒ කාලේ මම ජීවත් වුණේ. කාලයක් යනකොට මටම මගේ වැරදි තේරුණා. ඒ නිසා තමයි මෙයාගෙන් සමාව අරන් ආයෙත් මෙයත් එක්කම එකතු වෙන්න මම තීරණේ කළේ."

ඒ වනවිටත් නෙළුම් කරුණු කාරණා හොඳින් වටහාගෙන සිටියාය. ඒ නිසාම ඔවුන්ගේ බැඳීම තව තවත් ශක්තිමත් කිරීමට මට අපහසු නොවීය.

පරම්පරාවේ උජාරුව, නම්බුනාම, ධනවත්කම් නිසා හිස උදුම්මාගෙන ජීවත් වන මෙවැනි කාන්තාවන් පමණක් නොව පිරිමින්ද මේ සමාජයේ හිඟ නැත.

ඔබේ පවුල, තාන්න මාන්න, සමාජ තත්ත්වය කුමක් වුවත් විවාහ ජීවිතයක් තුළට ඒවා ඈඳාගැනීම නුවණට හුරු නැත. මෙවැනි හේතු සාධක නිසා සැමියා, බිරිඳ පහත්කොට සැලකීම ඉතා විහිළුසහගතය.

පුහු මාන්නය හිස මත තබාගෙන ජීවත්වන මෙවැනි අයගේ කතාවල අවසානය සනිටුහන් වන්නේ වෙන්වීම්වලින් සහ තනිවීම්වලිනි.

මේ කතාවේ එන සරත් ඉතා වෙහෙස මහන්සි වී ධනවත් වූ අයෙකි. නෙළුම්ට පරම්පරාවෙන් හිමි වූ ධනයට වඩා සරත් වෙහෙස මහන්සි වී හරි හම්බකරගත් මුදල්වල වටිනාකම වැඩි බව පෞද්ගලිකව මම සිතමි. එය ඔහුව පහත්කොට සැලකීමට නොව අගය කිරීමට හේතුවක් බව මම නෙළුම්ටද වටහා දුන්නෙමි.

එපමණක් නොව කෙතරම් වංශවත් වුවත්, ධනවත් වුවත් තවත් මනුෂ්‍යයෙකුට මනුෂ්‍යත්වයෙන් සැලකිය නොහැකි නම් ඒ සියලු දේවල වටිනාකමක් නැතැයි පැවසීම නිවැරදිය. තමා සන්තක එවැනි දේ ගැන පාරම්බෑමට යාමෙන් ඔබ නොදැනුවත්වම ඔබේ පෞරුෂය ගැන වැරදි චිත්‍රයක් සමාජගත වීමට වුවත් ඉඩ ඇත.

පුහු ආඩම්බරකම් පසෙකලා එකිනෙකාට ගෞරව කිරීම, සම සිතින් සැලකීම, සැමියා බිරිඳ සමඟ ආදරණීයව සතුටින් ජීවත්වීමට හේතුවන බව වටහාගැනීම වැදගත්ය.

විවාහය කටුගා දැමීමට පෙර නිසි පවුල් උපදේශන සේවාවක් වෙත යොමු නොවීම නෙළුම්ගේත් සරත්ගේත් මා දුටු තවත් දුර්වලතාවයක්ය. එසේ වූවා නම් ඔවුන්ට අවුරුදු ගාණක් වෙන්ව ජීවත්වීමටත්, ඔවුන්ගේ දියණියට වසර ගණනාවක් පිය සෙනෙහස අහිමි නොවීමටත් ඉඩ තිබුණි.

එසේම අවසාන වශයෙන් මතු කරලිය යුතු තවත් අතුරු කාරණාවක්ද ඇත. ඒ මවක, පියෙකු ලෙස ඔබ තුළ ඇති ගතිගුණවලින් ඔබේ දරුවන් ආදර්ශ ලබාගන්නා බවයි.

විවාහයෙන් වසරකට පමණ පසු මේ යුවළ නැවත මා හමුවට පැමිණියේ ඔවුන්ගේ දියණිය, නෙළුම්වත් සරත්වත් පහත්කොට සැලකීමට පටන්ගෙන ඇති බව පවසමින්ය.

මව සමඟ බොහෝ කාලයක් ගතකර තිබුණු නිසා ඈ කෙරෙන් එවන් ගති ලක්ෂණ ගම්‍යවීම සාධාරණය.

මතු වැඩිහිටියන් බවට පත්වන දරුවන්ට යහපත් ආදර්ශ ලබාදීම ඔබගේ වගකීමක් බව වටහාගෙන ජීවත්වීම වැදගත්ය. කෙසේ වෙතත් යම් යම් උපදේශන මඟින් නෙළුම්ගේත්, සරත්ගේත් දියණියගේ එවන් ගතිගුණ යටපත් කිරීමටද මම කටයුතු කළෙමි.

(මෙය රත්නා පුෂ්ප කුමාරි මහත්මියගේ වෘත්තීය ජීවිතයේ අත්දැකීම් ඔස්සේ සේවාලාභීන් හඳුනාගත නොහැකි පරිදි නිර්මාණාත්මක ලෙස වෙනස් කරන ලද කතාවකි.)

මානව හැකියා ප්‍රවර්ධන විශේෂඥ හා ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශිකා
රත්නා පුෂ්ප කුමාරි

සෙව්වන්දි හෙට්ටිආරච්චි

මික්ස් නූඩ්ල්ස්

අවශ්‍ය ද්‍රව්‍ය

- තම්බාගත් රයිස් නූඩ්ල්ස් 400g
- තම්බාගත් සෝයා බෝංචි 100g
- මුංපැළ බීජ 100g
- ග්‍රීන් පීස් 100g
- හීනියට කපාගත් ලූනු 50g
- සුදුලූනු 20g
- කපාගෙන බැදගත් ඉඟුරු කෑල්ලක්
- කරපිංචා
- මසාලා පවුඩර් 50g
- ගම්මිරිස් කුඩු 50g
- ලුණු රස අනුව
- වතුර කෝප්ප 1
- සෝයා සෝස්
- තක්කාලි සෝස්
- බටර් 150g

සාදාගන්නා ආකාරය

- භාජනයක් ලිප තබා බටර් දමා දියවනවිට ලූනු, සුදුලූනුත්, ඉඟුරු සහ කරපිංචා දමන්න.
- ඒවා බැදුනු විට මුංපැළ බීජ, තම්බාගත් සෝයා බෝංචි සහ ග්‍රීන් පීස් දමා කලවම් කරන්න.
- මසාලා පවුඩර්, ලුණු ටිකක්, ගම්මිරිස් කුඩු වතුර තේ හැඳි 3ක මිශ්‍රකර එයට එකතු කරන්න.
- නූඩ්ල්ස් ටිකද එකතු කර හොඳින් කලවම් කරන්න.
- සෝයා සෝස් සහ තක්කාලි සෝස් ටිකක් එකතු කරන්න.
- ලිපෙන් බා කපාගත් තක්කාලි ගෙඩියක්, පාස්ලි සහ මිංචිවලින් සරසා පිළිගන්වන්න.

මික්ස් නූඩ්ල්ස් හදන හැටි බලන්න මෙම QR කෝඩ් එක ස්කෑන් කරන්න

සුදුලූනු බත්

අවශ්‍ය ද්‍රව්‍ය

- හාල් 750g
- සුදුලූනු 200g
- බැදගත් ඉඟුරු
- ලොකු ලූනු ගෙඩි බාගයක්
- කරපිංචා
- රම්පේ
- ගම්මිරිස් 10g
- ලුණු රස අනුව
- සෝයා සෝස් තේ හැඳි 1
- බටර් 50g

සාදාගන්නා ආකාරය

- මුලින්ම හාල් සෝදා ගන්න.
- භාජනයක් ලිප තබා බටර් දමා කපාගත් ලූනු, කරපිංචා, රම්පේ සහ ඉඟුරු දමන්න.
- මිශ්‍රණය හොඳින් තෙම්පරාදු වූ විට හාල්වලට දමන්න.
- ලොකුවට කපාගත් සුදුලූනුත් හාල්වලටbදමන්න.
- ලුණු, සෝයා සෝස්, ගම්මිරිස් කුඩුත් එකතු කරන්න.
- බත ඉදීමට අවශ්‍ය ප්‍රමාණයට වතුර දමා සාමාන්‍ය පරිදි බත පිසගන්න.

සුදුලූණු බත් හදන හැටි බලන්න මෙම QR කෝඩ් එක ස්කෑන් කරන්න

බණ්ඩක්කා සම්බෝලය

අවශ්‍ය ද්‍රව්‍ය

- බණ්ඩක්කා
- බැදගත් අමුමිරිස්
- බැදගත් සුදුලූනු
- ලොකු ලූනු ගෙඩියක්
- ගම්මිරිස්
- කෑලිමිරිස් — තේ හැඳි 3
- ලුණු රස අනුව
- දෙහි ගෙඩි — 1 ක යුෂ

සාදාගන්නා ආකාරය

- බණ්ඩක්කා හීනියට පෙති කපා ගැඹුරු තෙලේ බැදගන්න.
- බැදගත් බණ්ඩක්කා, අමුමිරිස්, සුදුලූනුවලට හීනියට කපාගත් ලූනු එකතු කරන්න.
- කෑලිමිරිස්, ලුණු, ගම්මිරිස් සහ දෙහි යුෂ එකතු කරන්න.
- හොඳින් අතින් පොඩි කර අනාගන්න.

බණ්ඩක්කා සම්බෝලයහදන හැටි බලන්න මෙම QR කෝඩ් එක ස්කෑන් කරන්න

පයිනැපල් අප්සයිඩ් ඩවුන් පුඩිම

අවශ්‍ය ද්‍රව්‍ය

- ලොකු අන්නාසි — ගෙඩි 1
- බිත්තර — 4
- සීනි — 200g
- පිටි — 200g
- දියකරගත් බටර් — 150g
- කිතුල් හකුරු — 100g

අවශ්‍ය ද්‍රව්‍ය

- බිත්තර සුදුමදවලට සීනි ටික ටික දමමින් බීට් කරගන්න.
- ඉන්පසු පිළිවලින් පිටි සහ බටර් එකතු කරගෙන බීට් කරන්න.
- තැටියක් හෝ බොල් එකක් ගෙන හොඳින් බටර් ගාගන්න.
- එහි අන්නාසි පෙති අතුරාගන්න.
- එයට උඩින් ග්‍රේට් කරගත් හකුරු දමන්න.
- බීට් කරගත් මිශ්‍රණය එය මතට වත්කරගන්න.
- ප්‍රී හීට් කරගත් අවන් එකක 140-150C⁰ උෂ්ණත්වයේ විනාඩි 20-25ක් පමණ බේක් කරගන්න.

පයිනැපල් අප්සයිඩ් ඩවුන් පුඩිම හදන හැටි බලන්න මෙම QR කෝඩ් එක ස්කෑන් කරන්න

උළුඳු වඩේ

අවශ්‍ය ද්‍රව්‍ය

- උඳු 400g
- හීනියට කපාගත් ලූනු ගෙඩියක්
- හීනියට කපාගත් අමුමිරිස් කරල් 4-5
- හීනියට කපාගත් කරපිංචා ඉති 3
- ගම්මිරිස් තේ හැඳි 1
- මහදුරු ස්වල්පයක්
- ලුණු රස අනුව
- බැදීමට තෙල්

සාදාගන්නා ආකාරය

- උඳු ඇට හොඳින් සෝයා පැය 5ක් පමණ පෙගෙන්න හැර, වතුර ටිකක් සමඟින් බ්ලෙන්ඩ් කරගන්න.
- එය වෙනත් භාජනයකට දමා හීනියට කපාගත් ලූනු, අමුමිරිස්, කරපිංචා එකතු කරන්න.
- ලුණු, ගම්මිරිස්, මහදුරු එකතු කර අතින් හොඳට අනාගන්න.
- පැය 1-2ක් පිපෙන්න හරින්න. (අත්‍යවශ්‍ය නොවේ)
- තාච්චියක් ලිපේ තබා තෙල් දමා හොඳින් රත්කරගන්න.
- අතේ වතුර ගාමින් සාදගත් මිශ්‍රණයෙන් බෝල ආකාරයට රැගෙන මැදින් හිලක් සාද තෙලට දමා බැදගන්න.

කොළ පාට සම්බෝලය

අවශ්‍ය ද්‍රව්‍ය

- ගාගත් පොල් සම්බෝලයට අවශ්‍ය පමණට
- රතුලූනු ගෙඩි 1 1/2
- සුදුලූනු බික් 3
- අමුමිරිස් කරල් 5
- ඉඟුරු කෑලි 3
- කරපිංචා ඉති 3
- ගම්මිරිස් තේ හැඳි 1
- ලුණු රස අනුව
- දෙහි ගෙඩියක යුෂ
- වතුර කෝප්ප 1/2

සාදාගන්නා ආකාරය

- ඉහත සඳහන් සියල්ල එකට දමා බ්ලෙන්ඩ් කරගන්න.

වණ්ඩු

අවශ්‍ය ද්‍රව්‍ය

- හාල්පිටි 500g
- පාන්පිටි 250g
- මහදුරු 50g
- සීනි 150g
- පැණි කෝප්ප 1/2
- පොල්කිරි කෝප්ප 3

සාදාගන්නා ආකාරය

- හාල්පිටි, පාන්පිටි, මහදුරු එකට දමා හොඳින් කලවම් කරන්න.
- සීනි සහ පොල් කිරි එකතු කරන්න.
- ඉන්පසු පැණි දමා හොඳින් කලවම් කර පැය පහක් පමණ පිපෙන්න හරින්න.
- ස්ටීම් කළ හැකි කෝප්පවලට කැන්ද කොළ දමා එයට මිශ්‍රණය වත් කරගන්න.
- විනාඩි 7-8ක් ස්ටීම් කරගන්න.

ගොටු පිට්ටු

අවශ්‍ය ද්‍රව්‍ය

- හාල්පිටි 500g
- පාන්පිටි 250g
- මහදුරු 50g
- සීනි 150g
- පොල් කිරි කෝප්ප 3
- පැණි කෝප්ප 1/2
- පැණි පොල් සඳහා (ගෙඩියක පොල් සහ සීනි 100g)

සාදාගන්නා ආකාරය

- සීනි කැරමල් කර පැණි පොල් සාදගෙන නිවෙන්න හරින්න.
- වණ්ඩුවලට සාදගත් ආකාරයට මිශ්‍රණය සාද පිපෙන්න තබන්න.
- එයට සාදගත් පැණි පොල් දමා කලවම් කරන්න.
- කොස් කොළ ගොටු ආකාරයට නවා ඉරට්ටක්/ටූත් පික් ගසාගන්න.
- මිශ්‍රණය ඒවාට පුරවා විනාඩි 7-8ක් ස්ටීම් කරගන්න.

අද බොහෝ කාන්තාවන් කාර්යබහුලය. ඒ නිසාම දැනුවත්ව හෝ නොදැනුවත්ව ඒ අයගේ ජීවිතවලින් සතුට සහ ආදරය අන් හැමදේටම පෙර පලා යයි. නමුත් පුංචි පුංචි දේවල්වලින් සතුටු වෙන්නට පුරුදු විය හැකිනම් ඒ ඕනෑම කෙනෙකුගේ ජීවිතය හිතනවාට වඩා සුන්දර එකක් වනු ඇත. විදෙස් රටක ජීවත් වන හෂිනි මේ කියන්නේ ඕනෑම අම්මා කෙනෙකුට, ඕනෑම බිරිඳකට එසේ සතුටින් දිවි ගෙවිය හැකි ආකාරයයි.



Busy! Busy! Busy! කියන අය මේ විදියත් try කරලා බලන්න

පහුගිය සුමාන දෙක ගොඩක් කාර්යබහුල වුණා අපිට. මැලේසියා ඉඳන් ආපහු අපි ජපානේ පදිංචියට යන නිසා අත්‍යාවශ්‍ය දේවල් ආපහු ජපානෙට යවන්න ඕන වැඩකටයුතු පිළිවෙලක් කළා. ඒ දේවල් වැඩ පටන් ගන්න කලින් මං එක පාර දවස් තුනකට විතර උයාගත්තා. ශීතකරණයේ තිබ්බ එළවළු ටික ඔක්කොම වගේ මං ඉව්වා. එහෙම කරේ ඉදිරි දවස්වල උයන්න අපහසු දවස් එන නිසා.

පරිප්පු කිරෙන්ම තම්බලා උයාගත්තා. බෝංචි කිරට ඉව්වා. බීට්රූට් තෙලෙන් මලවලා කිරි දාලා හින්දලා උයාගත්තා. කුකුල් මස් මිරිසට උයාගෙන, තිබ්බ සැමන් ටින් එක තෙල් දැම්මා. පෝර්ක් කළුවට ඉව්වා. මාළු මිරිසට ඉව්වා.

මේ හැමදේම උයලා නිවෙන්න තියලා ප්ලාස්ටික් කන්ටේනර්වල දාලා ෆ්‍රිජ් එකේ දැම්මා. අධිශීතකරණයේත් දාන්න පුළුවන්. මං දැම්මේ පහල කොටසේ. දවස් තුනකට වගේ හදාගත්තු නිසා.

මං මෙහෙම දවස් තුනකට එක පාරටම උයාගත්තේ උයන්න කම්මැලි නිසා නෙවෙයි. මගේ ඉදිරි දවස් කාර්යබහුල වෙන නිසා සහ එදිනෙදා උයන්න අපහසුව වෙන නිසා. කාර්යබහුල දවස්වල වේලාව ඉතුරු කරගන්න ඕන නිසා.

මේ විදියට එකපාර කෑම ගොඩක් හදාගන්න එකට කියන්නේ bulk cooking කියලා. තවත් විදියකට කිව්වොත් කාලය ඉතුරු කරගෙන, නරක් වෙන්නැති වෙන්න දවස් කීපයකටම උයාගෙන කෑමට ගන්න පුළුවන් ඉවීමේ රටාවක් විදියටත් සරලව විස්තර කරන්න පුළුවන්. මේ ක්‍රමය ගොඩක් ප්‍රසිද්ධ නැති වුණාත් ලංකාවෙත් මේක කරන අය ඕනෑතරම් ඉන්නවා මං දන්න. විශේෂයෙන්ම රස්සාවට යන, පුංචි දරුවෝ ඉන්න අයට කුස්සියේ වැඩවලට ගොඩක් වේලාව වෙන්කරන්න අපහසුයි. එහෙම වෙලාවක මේ ක්‍රමය ගොඩක් පහසු වෙනවා.

ඉතින් මේ කියන bulk cooking වලදී දවස් කීපයකට ඇති වෙන්න මේ විදියට කෑම උයලා ඒවා ප්ලාස්ටික් පෙට්ටිවල දාලා අධිශීතකරණයේ දානවා. කෑමට ගන්න පැය බාගෙකට කලින් එදා කෑමට ගන්න දේවල් ටික එළියෙන් තියලා මයික්‍රෝවේව් එකේ දාලා රත් කරගන්නවා. නැත්තන් උයපුවා ඇතිලියක දාලා ලිපේ තියලා රත් කරලා ගත්තත් හරි. මයික්‍රෝවේව් එකක්ම ඕන වෙන්නේ නෑ.

හැබැයි මේ දේ කරනවා නම් දැනගන්නම ඕන වැදගත් දේවල් කීපයක් තියනවා. ඒවා ගැන තමයි මං දැන් මේ කියන්නේ.

මේ විදියට කෑම උයලා කනකොට එදා දවසට කන්න ගත්තු දේවල් ටික රත් කරලා එදාම කාලා ඉවර කරන්න ඕනේ. රත් කරාට පස්සේ ආපහු ශීතකරණයේ දාන්නේ නෑ. එහෙම රත් කර කර ශීතකරණයේ දාලා කෑමට ගන්න හොඳ නෑ. මේ එකක්.

අනික් දේ, එදා දවසට කෑමට ගන්න ව්‍යංජන වර්ගවල ප්‍රමාණය වැඩි නම්, අධිශීතකරණයෙන් එළියට අරන් පැය බාගයක් විතර එළියෙන් තියලා කෑමට ගන්න උවමනා ප්‍රමාණය විතරක් වෙන භාජනේකට දාගෙන ඉතුරු ටික නැවත අධිශීතකරණයට දාන එක. එතකොට වෙන් කරගත්තු කොටස රත් කරලා ආහාරයට අරගෙන ඉවර කරන්න පුළුවන්. අධිශීතකරණයට දාපු ඉතුරු ටික නැවත දවසක පාවිච්චියට ගන්න පුළුවන්.

මං කරන්නේ උයපු බත් ටික පිඟානට බෙදාගෙන, පස්සේ උයලා ශීතකරණයේ දාලා තියන දේවල්වලින් එදා කෑමට ගන්න මස්, එළවළු වර්ග ටික අරන් පොඩ්ඩ වේලාවක් එළියෙන් තියලා කූල් එක අඩු වුණාම පිඟානට බෙදලා ඊට පස්සේ මයික්‍රෝවේව් එකට දාලා විනාඩියක් රත් කරලා ගන්න එක.

අනික් දේ මේ විදියට කෑම හදද්දී එළවළු වර්ග, මස් මාළු වර්ග ඉව්වට මැල්ලුම වර්ග දවස් ගනන් හදලා තියලා කෑමට ගන්නේ නෑ. එහෙම හදලා තියලා මැල්ලුම් රත් කරලා කෑමට ගන්න එකෙන් මැල්ලුමේ පෝෂණ ගුණය අඩුවෙනවා වගේම පාටත් වෙනස් වෙනවා.

මේ විදියට ව්‍යංජන, මස්, මාලු සකස් කරන් එදිනෙදා අහාරයට ගනිද්දී මැල්ලුමක් සලාදයක් ඕන වෙන නිසා, මැල්ලුමට ඕනවෙන කොළ සෝදලා කපලා zip lock බෑග් එකක දාලා ශීතකරණයේ සාමාන්‍ය කොටසේ තිබ්බාම කන වේලාවට ඉක්මනින් මැල්ලුමක් හදාගන්නත් පුළුවන්.

තවත් මේ ක්‍රමේදී වැදගත් වෙන කරුණු ටිකක් ලියන්නම්.

උයන්න ගන්න එළවළු හොඳම ඒවා තෝරලා ගන්න ඕනේ. සෝදලා වතුර බේරලා වෙනදා විදියටම කිරට තෙලට උයාගන්න. බය වෙන්න එපා පොඩ්ඩක්වත් නරක් වෙන්නේ නෑ.

මස්, මාළු වර්ගත් එහෙමයි හොඳින් සෝදලා වතුර හොඳින් අයින් වුණාම කැමති විදියකට උයාගන්න පුළුවන්.

අනික් දේ තැලිච්ච පොඩි වෙච්ච එළවළු, පරණ මස්, මාළු ගන්න එපා. පුළුවන් තරම් නැවුම් එළවළු, මස්, මාළු පාවිච්චි කරන්න.

ශීතකරණයේ දානකොට, මං පාවිච්චි කරේ ප්ලාස්ටික් පියනෙන් වහන්න පුළුවන් භාජන. හොඳින් පිරිසිදු කරපු පියනකින් වහන්න පුළුවන් වීදුරු භාජනත් පාවිච්චි කරන්න පුළුවන්. අධිශීතකරණයේ ගොඩක් ඉඩකඩ තියනවා නම්, ඒ දවසට ගන්න ව්‍යංජනය මස්, මාළු වෙනම වෙනම දාලා ලේබල් කරලා පිළිවෙකට අධිශීතකරණයේ අසුර ගන්න පුළුවන්.

උදාහරණයක් විදියට හදපු පරිප්පු ව්‍යංජනය ප්ලාස්ටික් භාජන දෙකට දාලා වෙන් කරලා තිබ්බාම දවස් දෙකකට කෑමට ගන්න පුළුවන්. නැත්නම් පිසපු ඔක්කෝම පරිප්පු ටික එක ප්ලාස්ටික් භාජනේකට දාලා අධිශීතකරණයට දාලා අවශ්‍ය දවසට පැයකට කලින් එළියට අරන් කූල් ගතිය අඩු වුණාම අවශ්‍ය ප්‍රමාණය අරන් ඉතුරු ටික වහලා ආපහු අධිශීතකරණයට දැම්මාම හරි. තවත් පැහැදිලි වෙන්නයි මේ විදියට පරිප්පු උදාහරණයකට අරන් ලිව්වේ.

> සමහර කෙනෙක්ට හිතෙන්න පුළුවන් මේ මොන 'පිස්සු වැඩක්' ද කියලා. ඒත් පුංචි දරුවෝ ඉන්න අම්මලාට, රැකියාවට යන අයට මේ විදිය ගොඩක්ම ලේසි වෙයි

අනික් වැදගත්ම දේ සැරෙන් සැරේට ශීතකරණය අරින එකත් පොඩ්ඩක් අඩු කරන්න ඕනෙ.

මං මේ bulk cooking ක්‍රමය ප්‍රයෝජනයට ගත්තේ, මට වැඩ අධිකව තිබුණ දවස්වල විතරයි. මට ඒ නිසා කාලය ඉතුරු කරගන්නත් වෙනදා වගේම රස කෑමවේලක් උණුවෙන්ම කන්නත් පුළුවන් වුණා. සමහර කෙනෙක්ට හිතෙන්න පුළුවන් මේ මොන 'පිස්සු වැඩක්' ද කියලා. ඒත් පුංචි දරුවෝ ඉන්න අම්මලාට, රැකියාවට යන අයට මේ විදියට උයාගන්න එක ගොඩක්ම ලේසියි.

ඉවීමට දවසේ වේලාවක් වෙන්න කරන්න අමාරු කෙනෙක්ට වුණාත් ගැහැනු පිරිමි භේදයක් නැතුව මං මේ කියන්නේ, සුමානෙට එක දවසක් කෑම ටික හදාගන්න වෙන් කරගත්තාම සුමානෙම හිතේ නිදහසින් වැඩ කරගන්න පුළුවන් වෙයි. උයන එකෙන් විනෝදයක් දැනෙයි.

මේ දේ මං ගොඩක්ම කළේ මගේ දූලා දෙන්නා ඉපදුන අලුත. දෙන්නාම ලැබුණේ එක ළඟ. අපි පරිප්පු ටිකක් යහමින් උයාගන්නවා. කුකුල්මස් ටිකක් වැඩිපුර ලොකු භාජනේකට උයාගන්නවා. අල තෙල් දාගන්නවා. බණ්ඩක්කා තෙල් දාගන්නවා. පස්සේ නිවෙන්න තියලා ලොකු ප්ලාස්ටික් භාජන හතරක දාලා වහනවා. පස්සේ ශීතකරණයේ දානවා. දවස් තුනකට වගේ හදාගන්න නිසා ශීතකරණයේ සාමාන්‍ය කොටසෙන් දානවා. මෙහෙම උයන වේලාවට දහම් මස් කපලා දීලා, ලූනු කපලා දීලා මට උදව් කරනවා. එයා තමා මට මේ ක්‍රමේ මුලින්ම කියලා දුන්නේ. ඒ කාලේ අපිට ලේසිම විදිය වුණේ මේ ක්‍රමය. අවුරුද්දෙ දරුවෙකුයි, මාස තුනක්වත් නැති චූටි කිරිකැටියෙකුයි එක්ක උයන්න මට කාලය කළමනාකරණය කරගන්න අපහසු වුණා.

පිටරටවල නම් මේ bulk cooking ක්‍රමය ගොඩක් ප්‍රසිද්ධයි. ගොඩක් වෙලාවට උසස් අධ්‍යාපන කටයුතුවලට ඕස්ට්‍රේලියාව, ඇමරිකාව වගේ රටවලට ගිහින් ඉන්න අපේ තරුණ ළමයින්ට මේ ක්‍රමය සෑහෙන්න ප්‍රයෝජනවත් කියල මම අහල තියනවා. මොකද එයාලත් ඉගෙනගන්න ගමන් part time රැකියා එහෙමත් කරන අයනේ. ඉතින් උයන්න වෙලාව නැති නිසා කඩෙන්ම කන කවුරුහරි ඉන්නවනම් මේ ක්‍රමය ටිකක් අත්හදා බලන්න. ඒකෙන් ජීවිතය පහසු වෙයි වගේම වෙනස්ම අත්දැකීමක් වෙයි කියලත් මට විශ්වාසයි.

සුබ සතියක් ප්‍රාර්ථනා කරනවා.

හෂිණී මනමේන්ද්‍ර

නැත්තා වගේ සිටියාට පිරිමින්ටද රකින්නට සීලයක් ඇත්තේය. ඒ කුමර බඹසරය

ලේලිගේ සුදු පිරුවටය හොයන නැන්දම්මලාට

පුතාගේ කුමර බඹසර ගැනත් හිතන්න කියමුද?

කන්නගී තනේ කඩා ගිණිලූයේ පඩිපුරය. ඒ තමා හැරපියා නාට්‍යාංගනාවක් හා රති කෙළියේ යෙදී දරුවෙකු ද ජාතක කළ කෝවුලන් කෙරෙහි ඇති වූ අපිරිමිත පතිභක්තිය නිසාය. අපිරිමිත පති භක්තිය කන්නගීට නම් දේවතාවියක් වීමට පාර කියුවේය. එහෙත් තනේ කඩා ගිණි නොතැබුවත් කෝවුලන් ලා නිසා හද ගිණි අවුලාගත් මෙකල කන්නගීලා දෙසනම් දෙවියන්වත් හැරී නොබැලුවේය. පති භක්තිය ඇත්තේ පතිනියන් ළඟය. පතිනියක් වීමට පතියෙක් හා පතිකුලයට යා යුතුය. පතිකුලයට යන්නට පෙර ඇය කුමරියක්ය. පතිනිය රකින්නේ පතිවතය. කුමරිය රකින්නේ කුමරි බඹසරය.

ඔයා දන්නවද මට වර්ජිනිටි එකක් නෑ. අපේ අම්මටත් තිබිල නෑ. අත්තම්මටත් තිබිලා නෑ. සීයයි අත්තම්මයි, නෑනායි මස්සිනයි නිසා එයාලා පුංචි කාලෙ ඉඳන්ම දන්නවා. ඒ නිසා සීයට ඒකෙ ප්‍රශ්නයක් වෙලා නෑ

පතිනි සළුවලද ඇත් තුත්තිරි එමටය. එහෙත් කුමරියකගේ සළුව පිරුවටයක් විය යුතුමය. පතිනි දෙවියන්ගේ ආභරණ පළන්ද, පිරුවට අන්ද පෝරුවට නැඟිය යුත්තේ කුමරි බඹසර රැකි කුමරියක්ය. හතර වරිගය බලා හිඳින්නේ කුල කුමරිය දෙසය. ඇය රැකිය යුත්තේ සනුහරේ අභිමානයය. මංගල යහනට පිරුවට එළන්නේ රිදී නැන්දය. නැන්ද කුකුළා අතැතිව මනාල යුවලගේ සිරියහන් ගබඩාවට රිංගන්නේ ඇය රැකි කුමරි බඹසරේ සලකුණු බලන්නටය. රිදී නැන්ද යන්නේ සාක්ෂිකාරියක් ද සමඟින්ය. සාක්ෂිකාරිය කුමරියගේ පැත්තේය. නැන්දගේ ඇසට වැලි ගැසීම නම් සිහිනයක්මය. ගමේ ගොඩේ හැම කුමරියකගේම පිරුවටය පිරික්සූ රිදී නැන්දගේ කණෙන් රිංගන්නට නම් ඇය කඩුළු හත පැන්න සුත්තරකාරියක් විය යුතුමය. පිරුවටයේ රැඳි සලකුණේ සැක සංකා ඇත්නම් ඒ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට රිදී නැන්දට බලය ඇත්තේය.

නැන්දට ඒ බලය හිමි වෙන්නේ දෙර රෙද්දට මුවා වෙමින් සිටින කුමරියගේ නැන්දම්මාගෙන්ය. නැන්දම්මා මේ හග්ගිස්සන්නට තනන්නේ ගම්මැද්දේ ඇවිදින කළ වැලක වනා ඇති මල් චීත්තයක් දුටු විටත් වතුර පිපාසාව දැනෙන තම පුතුගේ කරකාර බැඳගත් මනාලියගේ කුමරි බඹසර ගැනය. රතු මලක් සමඟ මනමාලයාගේ ගෙදරින් දූතයෙක් පැමිණෙන තෙක් දෙමෝලනේ කොටන්නේ පෙකණි වැල කැපූ ද සිට ඔක්කේ දමා රැකගත් කුමරිය වැදූ අම්මාගේ හදවතය.

මේ දේවල් මේ විදියට සිද්ධ වූයේ අපේ ආත්තම්මලාගේ කාලයේය. ඒ ආත්තම්මලාගේ දූවරු දීග දෙන විට රිදී නැන්ද නොහොත් රෙදි නැන්ද අනුන්ගේ පිරුවටයේ අඩුපාඩු හෙව්වේ එහෙමත් තැනකය. මංගල රාත්‍රිය ගත කරන්න මනමාලයාගේ ගෙදර යනවා වෙනුවට නව යුවළ හෝටල් කාමරයට ගියේ මධුසමය ගත කරන්නටය. හෝටල් කාමර රිදී නැන්දලාට අකැපය. නැන්ද රිදී නොවුණත් පිරුවට බලන්නට හෝටල් කාමරයට යන්නට නැන්දලා ඉදිරිපත් වෙන්නේ ස්ව කැමැත්තෙන්මය. තමාගේ දියණියගේ පිරුවටය කෙසේ වෙතත් ඥාති දියණියගේ පිරුවටේ ශුද්ධිය ගැන ඒ නැන්දලාට ඇත්තේ පුදුම කැක්කුමක්ය.

එදට වඩා අද කාලේ තවත් වෙනස්ය. මංගල දිනයෙන් පසු අද යෞවන යෞවනියෝ මධුසමයට යන්නේ ට්‍රිප්ය. ඇත්තෝ ලෝකෙ වටේ යන්නෝය. නැත්තෝ පුළුවන් විදිය රට වටේවත් යන්නෝය. නැන්දම්මාට ඔවුන් යනෙන තැන්වලට රිදී නැන්දලා තබා නැන්දලාවත් එවන්නට විදියක් නැත්තේය. එහෙත් දෙවනි ගමන ද ලේලියගේ පිරුවට හොයන නැන්දම්මලා අද ද ඇත්තේය.

"මඟුලට නැකත් දෙන්න ඇවිත් අපේ නැන්දම්මා කිව්වා පෝරුවට ඇඳපු ඇඳුම පිටින්ම මනමාලයාගේ ගෙදර එන්න ඕනෑ කියලා. එතකොට අපේ හනිමූන් එක මනමාලයාගේ ගෙදර. අම්මෝ... මට එළොව පොල් පෙනුණා. ඒත් මට මුකුත්ම කියන්න බෑ. මොකද මම විරුද්ධ වුණොත් නැන්දම්මා සැක කරනවා. අනිත් එක මේක යෝජිත විවාහයක්. අපේ අම්මත් හරියට අසරණ වුණා. තාත්තත් නැතුව එයා අපිව හැදුවෙ පුදුම කැපකිරීමක් කරලා. මගේ වාසනාවට එද අපේ ඥාති අක්කා කෙනෙක් ඇවිත් හිටියා. එයා මුලින්ම මනමාලයාගේ හිත වෙනස් කළා. ඊට පස්සේ දෙවනි දවසේ අන්දන එකයි, ෆොටෝ ගහන එකයි, අනිත් අපහසුතා ගැනයි කියලා යන්තම් හෝටලයකට යන්න නැන්දම්මාව බලෙන්ම කැමති කරගත්තා. අපි හෝටලයකට නම් ගියා. ඒත් පහුවෙනිද උදේ පාන්දර නැන්දම්මා ඇරෙන්න හත්මුතු පරම්පරාවෙම ගෑනු ටික හෝටල් කාමරේ දොර ළඟ හිටියා. නැන්දලටයි, පුංචි අම්මලටයි, පුතාටයි ඕන මඟුලක් කරගන්න කියලා මම බාත්රූම් එකට රිංග ගත්තේ පුදුම තරහකින්."

මේ මීට වසර දහයකට දෙළහකට පෙර උගුව පළාතට දීග ගිය පතිනියකගේ මංගල දිනයේ අමරණීය සැමරුම්ය. වාසනාවට ඈ පටලයක් සහිත කන්‍යාවක් වූවාය. උපතින් එම පටලය අහිමි වී තිබුණේ නම් ඇයට පත්තිනි දෙවියන්ගේම පිහිටය.

"මම ටික කාලයක් රට හිටියා. රස්සාවකට ගිහින්. ලංකාවට ආවට පස්සේ අපේ අම්මලා මට මනමාලයො හෙව්වා. ඉස්කෝලෙ කාලෙ නම් පොඩි සම්බන්ධයක් තිබුණා. ඒත් කාලයත් එක්ක ඒකත් එහෙම්මම නැතිවෙලා ගියා. ඔය අතරෙ තමයි අපේ ගෙවල් ළඟ අක්කා කෙනෙක් විවාහ වුණේ. එයා බැන්දෙ එහා ගමින්. හැබැයි ඒකත් යෝජිත විවාහයක්. පහුවෙනිද දෙවනි ගමන යන්න මනමාලිගෙ පැත්තෙන් ලෑස්තිවෙද්දි මනමාලි අඬාගෙන ගෙදර ආවා.

ගෙදර ආවා කිව්වට එයාව එක්කගෙන ආවා. ඒ අක්කට එයාගේ පිරිසිදුකම ඔප්පු

විවාහ වෙලා අවුරුදු ගාණක් ගියත් මංගල දවසේ රෑ අත්දැකීම විඳගන්න ආසයි කියලා බිරිඳගේ කන්‍යාපටලය හදලා දෙන්න පුළුවන්ද කියලා අහන මොළේ අමාරුකාරයොත් ඉන්නවා

කරගන්න බැරි වෙලා. අක්කාව එක්කගෙන ආවා විතරක් නෙමෙයි අම්මලාටත් දෙස් කියලා, අහල පහළටත් කතන්දරේ කියලයි ඒ අය ආපහු ගියේ. අනේ අම්මේ මට නම් එද බඳින එකත් එපා වුණා."

කොතරම් රැක්කත් රැකවල් බිඳ තම පෙම්වතා හා පෙම් කෙළින්නට උන්මාද චිත්‍රාගේ සනුහරේ උන් දක්ෂය

මේ සිදුවීමෙන් වසර දෙකකට පසු විවාහ වී, හෙට අනිද්දට දීග යන දියණියක් ඇතුළුව තුන්දරු මවක් වන ඇය උඩරට පළාතේ මැණිකේ කෙනෙක්ය. පළාතෙන් පළාතට ඉසදිය මංගල්‍යයේ චාරිත්‍ර වෙනස්ය. ඉසදිය මංගල්‍යය ද හැඬූ කඳුළින් ගෙදර ආ යුවතියන් සේම නොකළ වරදකට මුළු ජීවිතයම කඳුළට දිය කළ යුවතියෝ ද බොහෝය.

"ඔයා දන්නවද මට වර්ජිනිටි එකක් නෑ. අපේ අම්මටත් තිබිල නෑ. අත්තම්මටත් තිබිලා නෑ. සීයයි අත්තම්මයි, නෑනායි මස්සිනයි නිසා එයාලා පුංචි කාලෙ ඉඳන්ම දන්නවා. ඒ නිසා සීයට ඒකෙ ප්‍රශ්නයක් වෙලා නෑ. ආත්තම්මා බයේ ඉඳලා තියෙන්නෙ අපෙ අම්මා ගැන. අත්තම්මටත් උපතින්ම පිහිටලා නැති නිසා එයා අම්මා මැරි කරන්න කලින් ඒ ගැන කියලා තියනවා. ඇත්තටම අම්මටත් තිබිලා නැහැ. අපේ තාත්තා පටු විදියට හිතන එක්කෙනෙක් නෙමෙයි. ඒත් අම්මා බැන්දට පස්සෙ තාත්තාත් එක්කම ගිහින් ඩොක්ටර් කෙනෙක් හම්බවෙලා. ඩොක්ටර් තමයි කියලා තියෙන්නේ අපේ අම්මගෙ උපතින්ම කන්‍යා පටලය පිහිටලා නෑ කියලා. ඔය සැකේට අම්මා පොඩි කාලේ මගෙත් චෙක් කරලා. මගෙත් උපතින්ම පිහිටලා නෑ. සීයයි, තාත්තයි පොළොවෙ පය ගහලා රටේ ලෝකෙ ගැන අවබෝධයක් තිබුණට මට හම්බවෙන එකා මොන ජාතියෙ එකෙක්ද කියලා දන්නෙ නැති නිසා අම්මා කෝකටත් මෙඩිකල් රිපෝට් එකක් අරගෙන."

මම මගේ කන්‍යාපටලය ඉවත් කළේ සැත්කමකින්. මංගල දවසේ රෑ මගේ පිරුවටේත් ඔය කියන සලකුණු තිබුණෙ නෑ. ඒත් මගේ හස්බන්ඩ්ට ඒක ප්‍රශ්නයක් වුණේ නෑ.

කොළඹ ජනප්‍රිය බාලිකා විද්‍යාලයක ඉගෙනුම ලැබූ ඇය මගේ මිතුරු ලැයිස්තුවට එක් වූයේ උසස් පෙළ සිංහල පංතියේදීය. තත්ත්වයෙන්, තරාතිරමෙන්, වත්පොහොසත්කමින් අඩුවක් නැති ඇය ඇගේ ඇති එකම අඩුව ගැන කිව්වේ ද බොහෝ සැහැල්ලුවෙන්ය. ඇය සැහැල්ලුවෙන් සිටියද මා සිටියේ අපහසුවෙන්ය. කන්‍යාභාවය උපතින් නොපිහිටීම ගැන පොතින් පතින් කියවා තිබුණත් එහෙම එකියක් මට මේ සැබෑ ජීවිතේ මුණ ගැසුණාමය.

වෛද්‍ය විද්‍යාවට අනුව කන්‍යා පටලය සෑදෙන්නේ මව් කුස තුළදීය. එය මවගේ ගර්භාෂ තරලය බිළිඳියගේ යෝනි මාර්ගය හරහා ගමන් කිරීම වළක්වනු ලබන පටලයක් වැනි ආවරණයක්ය. ඇතැම් යුවතින්ගේ මෙම පටලය ඉතා සියුම්ය. තවත් එකියකගේ ඉතා ඝනය. කිසිදු පටලක් නොපිහිටන යුවතියෝද ඇත්තේය. ඝන කන්‍යාපටලයක් පිහිටි යුවතියකටද මංගල යහන සුව යහනක් නොවන්නේය.

"මම මගේ කන්‍යාපටලය ඉවත් කළේ සැත්කමකින්. මංගල දවසේ රෑ මගේ පිරුවටේත් ඔය කියන සලකුණු තිබුණෙ නෑ. ඒත් මගේ හස්බන්ඩ්ට ඒක ප්‍රශ්නයක් වුණේ නෑ. අපි ඩොක්ටර් කෙනෙක් ළඟට ගියේ ලිංගික එක්වීමේදී මට දැනෙන වේදනාවට හේතු හොයන්න. එතකොටයි දැනගත්තේ ඒකට හේතුවත් කන්‍යාපටලය ඝනවීම කියලා. මොනවා වුණත් එක අතකට ඩොක්ටර් ළඟට ගිය එක හොඳයි. මගේ හස්බන්ඩ්නුත් පිරිමියෙක්නේ. පෙන්නුවෙ නැති වුණාට මොනවා හිතනවාද දන්නෙ නැහැනේ."

කන්‍යාපටලය නොමැති වීම, කන්‍යාභාවය අහිමි වීම දූපතක් තුළ ජීවත්වන අපට මහා අරුමයක්ය. එහෙත් යුරෝපීය සමාජයේ කන්‍යාපටලයක් සහිත වීම මහා අරුමයක්ය. මංගල යහනේදී කන්‍යාභාවය අහිමි කරගන්නේ එහෙමත් මනාලියක්ය. එවැන්නියක් දෙස සමාජය බලන්නේ යුග දිවියට අත්දැකීම් රහිත ඇත්තියක් සේය. විවාහයට පෙර එකගෙයි වසන්නේ යුග දිවියට පෙරහුරුවක් සේය. දෙතුන් දෙනෙකු සමඟ එක ගෙයි වාසය කර හෝ ඔවුන් නීතියෙන් ගැට ගහගන්නේ සුදුසුම කෙනාය. ප්‍රසිද්ධියේ නොවුණාට අපේ රටටත් යුරෝපයෙන් මේ විලාසිතාව බෝවී දැන් ටික කලක්ය.

යෞවනයේ හිනි පෙතේ සිටින සම වයසේ මිතුරියෝ එක් වූ විට කතා නොකරන දෙයක් නැත්තේය. ගැටවුන්ගේ ඇල්ම බැල්ම ලැබෙන කාලයේ ඒ ඇත්තියන්ගේ වැඩි කැමැත්ත ආදරය ගැන කතා කරන්නටය. ආදරයත් කැස්සත් හංගන්නට බැරි බව හිරිමල් වියේ ගැටිස්සියෝ නොදන්නේය. හැංගි හැංගි වෙස් බැන්දත් නටන්න වෙන්නේ එළිපිටය. නැටූ නැටුම් එළි වූ විට අම්මාගෙන් ඉලපත් පාරක් නොකා බේරුණේ එහෙමත් ගැටිස්සියක්ය. අම්මලා දූවරු මෙතරම් රකින්නේ යම් වැරැද්දක් සිදුවුවොත් වැදූ මවට නිවනක් නැති නිසාය. මනුස්සයන් වන කා අතිනුත් වැරදි සිදුවන්නේය. ඒ නිසා දෙවියන්ගේ ගතිය සිහිකර වැරැද්ද කළ එකාට සමාව දෙන්නේය. එහෙත් මනුස්ස දුවක් සිදුකරනා ලොකුම වැරැද්දට නම් දේව සභාවම ගෙනාවත් ලංකාව වැනි රටක සමාවක් නැත්තේය. සමාව දීමට වඩා වෙච්ච වැරැද්ද හදගැනීම වටින්නේය. අතීතයේ නම් හෙළ දුවකට වැරදුනොත් වැරදුනාමය. එහෙත් මේ කාලයේ ඕනෑම වැරැද්දක් සේ මේ වැරැද්ද හද ගැනීමට ද ක්‍රම ඇත්තේය.

"තාමත් ලංකාවෙ මිනිස්සු කොච්චර පටු තැනකද ඉන්නෙ කියලා හිතෙන්නේ අපි ළඟට එන සේවාදයකයො නිසා. මම සේවාදයක කියන වචනය පාවිච්චි කළේ එයාලට රෝගියෝ කියන්න බැරි නිසායි. මොකද එයාලා ප්‍රතිකාර ගන්න එන්නෙ රෝගයකට නෙමෙයිනේ. පුංචි කාලේ අපයෝජනයට ලක්වෙච්ච ගෑනු දරුවො අරගෙන අම්මලා එනවා. පෙම්වතියට තමන්ගෙන් වෙච්ච වැරැද්ද හදලා දෙන්න පෙම්වතුන් එනවා. වංචාකාර පෙම්වතුන්ට අහුවුණ යුවතියො විවාහයට පෙර වෙච්ච වැරැද්ද හදගන්න එනවා. ඒ අතර මොළේ අමාරුකාරයොත් ඉන්නවා. විවාහ වෙලා අවුරුදු ගාණක් වෙනවා. මංගල දවසේ රෑ අත්දැකීම විඳගන්න ආසයි කියලා බිරිඳගෙ කන්‍යාපටලය හදලා දෙන්න පුළුවන්ද කියලා අහන අයත් ඉන්නවා. මේක හරි පුංචි සැත්කමක්. හැබැයි රජයේ රෝහල්වල සිද්ධ වෙන්නෙ නෑ. බොහොම පෞද්ගලිකව තමයි සිද්ධ වෙන්නේ."

මේ දියාරු වන්නේ අප මහා ලොකුවට කබල් ගානා අපේ මහා සංස්කෘතියය. සදචාරයය. කන්‍යාභාවය නොතකා හැරීම වෙනත් කාරණයක්ය. වෛද්‍ය විද්‍යාව ද අලුයම ලූ කෙළ පිඩක් සේ බැහැරලන එය අපටද අවශ්‍යම නැත්තේය. නමුත් බොදු සංස්කෘතියත්, සදචාරයත් මත හැදී වැඩුණු අපට රකින්නට විලි බියක් ඇත්තේය. හෘද සාක්ෂියක් ඇත්තේය. ආදරයට මුවා වී ගැහැනියගේ පවිත්‍රත්වය කෙලෙසන්නේ පිරිමින්මය. පිරිමියෙක් අතින් කෙලෙසුණ ගැහැනිය කන්‍යාපටල සැත්කමින් පසු රවටන්නේ තවත් පිරිමියෙක්ය. රැවටෙන්නට කිසිම පිරිමියෙක්වත්, ගැහැනියකවත් කැමති නැත්තේය. කන්‍යාපටලය ඉන්දියන් සාගරයට විසිකර දැමුවත් තමන් ආදරය කරන ගැහැනියට, පිරිමියාට වටිනාකමක් නොදෙන තාක් මේ රැවටිල්ලේ සාඩම්බර කොටස්කරුවෙක් වීමට ඔබට ද සිදුවන්නේය. එද අම්මලා ලොකු මහත් වූ ගැටිස්සියෝ ගේ මුල්ලට ද හෝ දීග දෙන තුරු රැක්කාය. කොතරම් රැක්කත් රැකවල් බිඳ තම පෙම්වතා හා පෙම් කෙළින්නට උන්මාද චිත්‍රාගේ සනුහරේ උන් දක්ෂය. පෙම් කෙළියාට වරදක් නැත. වරැද්ද ඇත්තේ සීමා මායිම් හඳුනාගැනීමය. ඇටෙන් පොත්තෙන් එළියට එන විටම අධ්‍යාපනය ආදී නොයෙක් හේතු නිසා ගේ කඩුල්ල පණින දැරිවිය, නැවත පැමිණිය යුත්තේ විලි බිය ආරක්ෂා කරගෙනය. මන්ද තවමත් මනාලියගේ පිරුවටය හොයන මනමාල මහත්වරුන් සේම ඔවුන්ගේ මෑණිවරුන් ද සිටින නිසාය.

නිසි වයස පැමිණි විට යුවතියක හා පෙමින් බැඳීම ද වරදක් නොවන්නේය. වරද ඇත්තේ හෝටල් කාමර ගානේ රිංගීමය. තවමත් මනාලියගේ පිරුවට හොයන සමාජයක පෙම්වතිය සමඟ හෝටල් කාමරයකට රිංගීමට පෙර පෙම්වතා සිහියේ තබා ගත යුතු කාරණයත් ඇත්තේය. ඒ තම මංගල දිනයේ වෑල්ඩින් කළ කන්‍යාපටලයක් ඇති මනාලියක් සමඟ මධුසමය ගත කරන්නට තමාටද සිදුවිය හැකි බවය.

නැත්තා වගේ සිටියාට පිරිමින්ටද රකින්නට සීලයක් ඇත්තේය. එය කුමර බඹසරය. කුමරි බඹසර රකිනා කන්‍යාපටලය නම් පුදුම එකක්ය. දන්නා උප්පරවැට්ටි සියල්ල දමා පිරිමින්ගෙන් ආරක්ෂා කර එක පිරියෙක්ටම විනාශ කරන්නට දෙන අරුම පුදුම තෑග්ගක්ය. මේ තෑග්ගද පිරිමින්ටමය. ඒ අතින් පිරිමි හරි වාසනාවන්තයෝය. කකුළුවා නටන්නේ හැලියේ දිය රත්වනතුරුය. මනාලියගේ පිරුවටයේ ඇඳ කුඳ හොයන කුලවත් පුත්‍රයන්ගේත්, ඔවුන් වැදූ මව්වරුන්ගේත් ඉහ මොළ ගිණිගන්නේ දියණියන් වැදූ අම්මලා තම බෑණාගේ කුමර බඹසර සොයන්නට පටන් ගන්නා දවසටය. ඒ දවස උදවන තෙක් පුතුන් වැදූ මව්වරුන්ට ලේලියගේ පිරුවටය මහමෙරක්ය.

කන්‍යාපටලය නොමැති වීම, කන්‍යාභාවය අහිමි වීම දූපතක් තුළ ජීවත්වන අපට මහා අරුමයක්ය. එහෙත් යුරෝපීය සමාජයේ කන්‍යාපටලයක් සහිත වීම මහා අරුමයක්ය

හිමේෂා සවන්තී රාජපක්ෂ

මැරිලා ගොඩ එන්නත් පුළුවන් ඇවිත් රන් පදක්කම් දිනන්නත් පුළුවන්

ජීවිතය නැවතී යළි ඇරඹෙන අවස්ථා ඇත. මියගියා යැයි විශ්වාස කෙරුණු අයෙකු යළි නැගිටීම තරමක් වෙනස්ය. කෝමා තත්ත්වයේ සිටි අයෙකු පියවි සිහිය ලැබීමද විශේෂය. අනතුරකින් අත් පා බිඳී ගිය අයෙකු පසුකාලීනව ඔලිම්පික් බිමේ දිවයාම ඊටත් වඩා අපූරුය. ඒ දිවීම රන් පදක්කමකින් අවසන් වීම කෙතරම් සොඳුරු විය හැකිද? බෙටී රොබින්සන් යනු ඒ සොඳුරු අත්දැකීමට මුහුණ දුන් කෙනෙකි. මේ ඇගේ කතාවයි.

1911 අගෝස්තු 23 වනදා බෙටී රොබින්සන් උපත ලැබුවේ ඇමරිකාවේ ඉලිනොයිස් ප්‍රාන්තයේ රිවර්ඩේල්හිදීය.

උසස් පාසලට ඇතුළත් වීමෙන් පසු බෙටී පාසල් ගියේ දුම්රියෙනි. දිනක් ඇය නිවසින් පිටත්වීමට ප්‍රමාද විය. තමාව දමා යාමට සූදානම් වන දුම්රිය වෙත ගොඩවීමට ඈ දිව ගියාය. ඒ වනවිටත් දුම්රියට නැගී සිටි ඇගේ පාසලේ ජීව විද්‍යා ගුරුවරයා මේ පුංචි කෙල්ල දුවනයුරු බලා සිටියේය. ඇය නියමිත වේලාවට පාසල් නොඑනු ඇතැයි ඔහු අනුමාන කළේ ඒ වනවිටද ඇය සිටියේ දුම්රියට බොහෝ දුරින් බැවිනි. නමුත් ගුරුවරයා විස්මයට පත් කරමින් මද වේලාවකට පසු බෙටී ඔහු අසල අසුන් ගත්තාය. ඒ වනවිට ඇගේ වයස අවුරුදු 16 කි.

සිය ප්‍රථම ඔලිම්පික් තරගාවලියෙන්ම රන් සහ රිදී පදක්කම් දෙකක් ලබාගත් බෙටී මව් රටට පැමිණි පසු ඇයට ලැබුණු ජනතා හරසර

ගුවන් යානා අනතුරෙන් පසු ප්‍රතිකාර ලබන බෙටී

නමුත් ජීව විද්‍යා ගුරුවරයා මේ දැරිවිය පිළිබඳව එතැන් පටන් විශේෂ අවධානයක් යොමුකළේය. පසුදම ඇගේ දිවීමේ කාල ගණනය කිරීමට ඔහු පියවර ගත්තේය. බෙටී දුව ගියේ පාසල් කොරිඩෝවකයි. ඇගේ හැකියාව තහවුරු කරගත් ගුරුවරයා මලල ක්‍රීඩාවට යොමුවන ලෙස බෙටීට දැනුම් දුන්නේය.

"ඒ වෙනතුරු මං දැනගෙන හිටියෙ නෑ කාන්තාවන්ට රේස් තියෙනවා කියලා."

මේ සිදුවීම ගැන බෙටී රොබින්සන් පසුකාලීනව ප්‍රකාශ කළේ එහෙමය.

සිදුවීමෙන් සති තුනකට පසු ක්‍රීඩා පාවහන් යුගලක් (spiked shoes) මිලට ගත් ඈ ගියේ ඉලිනොයිස් මලල ක්‍රීඩා සමාජයටයි. එහි ක්‍රීඩිකාවන් සමඟ තරඟ වැදී දෙවන ස්ථානය දිනා ක්‍රීඩා සමාජ සාමාජිකත්වය ලබා ගත්තාය. පුහුණුව සතියට දින තුනකි. ඉලිනොයිස් ක්‍රීඩා සමාජය නියෝජනය කරමින් ඇය ඔලිම්පික් සුදුසුකම් ලැබීම වෙනුවෙන් තරඟ වැදුනාය. ඉන්පසු ඔලිම්පික් බිමේ මීටර සියය ඉසව්ව ජය ගැනීමෙන් නොනැවතුණු බෙටී එහි ලෝක වාර්තාවද තමා සතුකර ගත්තාය.

මීටර සියය කාන්තා ඉසව්ව ප්‍රථම වරට ඔලිම්පික් තරඟාවලියට ඇතුළත් කෙරුණේ 1928 වසරේදීය. එවර තරඟාවලිය පැවතියේ නෙදර්ලන්තයේ ඈම්ස්ටර්ඩෑම්හිදීය. ක්‍රීඩාවට අවතීර්ණ වී මාස හතරක් ගතවන විට බෙටී මීටර සියය ප්‍රථම ඔලිම්පික් කාන්තා ඉසව්වට සුදුසුකම් ලබා තිබුණාය. නමුත් මේ නව ඉසව්වේ අවසන් තරඟය ලෙහෙසි නැත. තරඟ රීති උල්ලංඝණය කළ ක්‍රීඩිකාවක් දෙදෙනෙකු ඉවත් කිරීමට සිදුවිය. කැනේඩියානු ක්‍රීඩිකාවන් දෙදෙනාගෙන් අයෙකු රන් පදක්කම හිමිකර ගනු ඇති බව බහුතරයකගේ විශ්වාසය විය. එහෙත් තත්පර 12.2 කින් තරඟය නිමකළ ඇමරිකාවේ බෙටී රොබින්සන් මීටර සියය කාන්තා පළමු ඔලිම්පික් රන් පදක්කම තමා සතුකර ගත්තාය. කැනඩාවේ ෆැනී රෝසන්ෆෙල්ඩ් සහ එතෙල් ස්මිත් රිදී සහ ලෝකඩ පදක්කම් දිනූහ. බෙටී සහ රෝසන්ෆෙල්ඩ් අතර පැවති තියුණු තරඟය විනිසුරන් අතර මතගැටුම්වලටද හේතුවිය. කැනඩාවෙන් විරෝධතා මතුවිය. නමුත් අවසානයේ බෙටීගේ ජය තහවුරු විය.

බෙටී පුහුණුව ලබමින් සිටි ගුවන්යානය මඩ වගුරකට කඩා වැටී තිබූ අයුරු

"මම දිනුවා කියලා ප්‍රකාශ කෙරුණා. මට හරිම සතුටුයි. ඒ හින්ද මං පොඩි ළමයෙක් වගේ ඇඬුවා."

ඒ තරගය පැවැත්වෙන විට බෙටීගේ වයස අවුරුදු 16 යි මාස 11 යි දින 08 කි. ඒ අනුව මේ දක්වා මීටර 100 ඉසව්වේ ඔලිම්පික් රන් පදක්කම දිනූ ළාබාලතම ක්‍රීඩකයා හෝ ක්‍රීඩිකාව වන්නේ බෙටී රොබින්සන් ය.

1928 ඔලිම්පික් මීටර 100 කාන්තා සහාය දිවීමේ ඉසව්වේ රන් පදක්කම හිමිවූයේ කැනඩාවටයි. ඇමරිකාව රිදී පදක්කම දිනා ගත්තේය. ඒ අනුව බෙටී රොබින්සන් සිය ප්‍රථම ඔලිම්පික් තරඟාවලිය රන් සහ රිදී පදක්කම් දිවිත්වයක් සමඟ නිම කළාය.

බෙටී රොබින්සන්ගේ ජයග්‍රහණය ඇමරිකාවේ දැඩි ප්‍රීතියට හේතු විය. ඈම්ස්ටර්ඩෑම් සිට නැවත මව්රට පැමිණීමෙන් පසු බෙටී වෙනුවෙන් විවිධ උත්සව සංවිධාන කර තිබිණි. ඇමරිකානු ඔලිම්පික් කමිටු සභාපති ඩග්ලස් මැක්ආතර් රන් ආලේපිත ලෝක ගෝලයේ අනුරුවක් ඇයට තිළිණ කළේය. ක්‍රීඩාලෝලීන්ගෙන් බෙටී රොබින්සන් දියමන්ති එබ්බවූ අත් ඔරලෝසුවක් ලැබුණාය.

ඇමරිකාව පුරා ජනතාවගේ ආදරයට පාත්‍ර වූ බෙටී ඉන් වසර තුනකට පසු නොසිතූ සිදුවීමකට මුහුණ දුන්නාය. 1932 ඔලිම්පික් තරගාවලිය පැවැත්වීමට නියමිතව තිබුණේ ලොස් ඇන්ජලීස්හිදීයි. ඇය ඊට පුහුණුවීම් කළේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදාරන අතරය. ඒ වනවිට ඇය ගුවන්යානා පැදවීමේ බලපත්‍රයක් ලැබීමේ අපේක්ෂාවෙන් පසුවූවාය. ඒ සඳහා පුහුණු වන අතරේ 1931 ජුනි මාසයේදී බෙටී ගුවන් ගමනකට එක්වූවාය. යානය ගුවන්ගත කර ටික වේලාවකින් හදිසියේම වගුරු බිමකට කඩා වැටිණ. ඒ අසලින් ගමන් කරමින් සිටි ට්‍රක් රථ රියැදුරෙක් බෙටීගේ සිරුර සොයාගත්තේය. ඔහු සිරුර ට්‍රක් රථයට දමා ගත්තේ ඇය මියගොස් ඇතැයි විශ්වාස කරමිනි. එහෙත් බෙටී ජීවතුන් අතර බව පසුව තහවුරු කර ගැනිණ. ඇය මාස තුනක් පමණ රෝහල්ගතව සිටියාය. ඉන් මාස දෙකක් පමණ කෝමා තත්ත්වයෙනි. අතක් සහ පාදයක් බිඳී තිබිණ. ඇගේ පාදයට ලෝහමය ආධාරකයක් යෙදීමට සිදු වූ අතර උකුලේ සිට විලුඹ තෙක් වාත්තුවකි. තවත් මාස හතරක කාලයක් ඇයට ගමන් කිරීමට වූයේ රෝද පුටුවේ සහ කිහිලිකරුවල ආධාරයෙනි. ආබාධයට ගොදුරු වූ පාදය අනෙක් පාදයට වඩා අඟල් එකහමාරක් උසින් අඩුවිය. මේ අනතුර ඇයව ක්‍රීඩාපිටියෙන් දුරස් කළේය. නැවත දිවීම පිළිබඳ බලාපොරොත්තු තැබිය නොහැකි තරම් ඇය මුහුණ දුන් අනතුර බරපතළ විය.

නමුත් වසර කිහිපයක් ගතවෙද්දී බෙටී රොබින්සන් දෛවයට අභියෝග කරන්නට තීරණය කළාය. බිඳී ගිය පාදය, අත හෝ දෙපාවල උසෙහි වෙනස ඇයට ගැටළුවක් කර නොගනිමින් ඇය යළි තරඟ බිමට පිවිසියාය.

1936 ඔලිම්පික් සත්කාරකත්වය හිමිවූයේ ජර්මනියටයි. තරඟාවලිය බර්ලින්හි පැවැත්විණ. ඒ සඳහා සූදානම් වන බෙටී තවත් අභියෝගයකට මුහුණ දුන්නාය. අබාධයට ලක්වූ පාදය නැවීම ඇයට අපහසු විය. එනිසා ආරම්භය ලබාගැනීමට සිදුවන්නේ සිටගැනීමේ ඉරියව්වෙනි. එසේ තිබියදීත් ඔලිම්පික් කාන්තා සහාය දිවීමේ ඇමරිකානු කණ්ඩායම නියෝජනයට බෙටී සමත් වූවාය. සිය ප්‍රථම ඔලිම්පික් නියෝජනයේදී අහිමි වූ ජය බර්ලින්හිදී ලැබීමට බෙටීට හැකියාව ලැබිණ. කාන්තා සහාය දිවීමේ ඉසව්වේ ජය ඇමරිකාව සතුවිය. වසර අටකට පසු බෙටී රොබින්සන් තවත් ඔලිම්පික් රන් පදක්කමකට හිමිකම් කීවේ එලෙසිනි.

ක්‍රීඩා දිවිය අවසන් කරන විට ධාවන ඉසව් කිහිපයකම වාර්තා ඇය සතුවිය. ඇමරිකාවේ ජවන හා පිටිය විශිෂ්ටයන් අතරට ඇගේ නමද ඇතුළත් කෙරිණ. තරඟ බිමෙන් සමුගත්තද ක්‍රීඩාව කෙරෙහි ඇගේ ඇල්ම අඩු වූයේ නැත. පුහුණුකාරියක මෙන්ම ප්‍රසිද්ධ දේශකවරියක ලෙස බෙටී සිය මෙහෙවර ඉටු කළාය. 1996 ඇට්ලන්ටා ඔලිම්පික් වෙනුවෙන් ගිනිසිළුව රැගෙන යන චාරිකාවටද ඇය සම්බන්ධ වූවාය. පිළිකාවෙන් සහ අපස්මාරයෙන් පීඩා විඳි බෙටී රොබින්සන් 1999 මැයි 17 වනදා ජීවිතක්ෂයට පත්වූවාය. නමුත් සිය දක්ෂතා වෙනුවෙන් ඇය කිසිදින ගෞරවයක් අපේක්ෂා නොකළාය.

"මට වීරවරියක වීමට අවශ්‍ය වුණේ නැහැ. මට ඕන වුණේ තරඟය දිනීම පමණයි."

එසේ පැවසුවද කැපවීම සහ අධිෂ්ඨානය මත ලැබූ ජය, ඇයව වීරවරියක බවට පරිවර්තනය කර තිබේ.

රජනිකා ලියනගේ

බෙටී 1988 දී

යානය ගුවන්ගත කර ටික වේලාවකින් හදිසියේම වගුරු බිමකට කඩා වැටිණ. ඒ අසලින් ගමන් කරමින් සිටි ට්‍රක් රථ රියැදුරෙක් බෙටීගේ සිරුර සොයාගත්තේය. ඔහු සිරුර ට්‍රක් රථයට දමා ගත්තේ ඇය මියගොස් ඇතැයි විශ්වාස කරමිනි

රජනිකා ලියනගේ

> ඕ.අයි.සී. මහත්තයා ඇහුවා උඹේ ළමයව වැදුවෙ මමද කියලා

> මට සිහිය එනකොට එයාලා මාව හිටපු තැනටම ගෙනත් දාලා තිබුණා

දියණියගේ නිරුවත් පින්තූර ගැන පැමිණිලි කරන්න ගිය මවට පාදුක්ක පොලිසියේ නිලධාරීන් අතවර කරලා

පසුගිය දිනක පාදුක්ක පොලිසියට පැමිණිල්ලක් දැමීමට ගිය තිස්පස් හැවිරිදි කාන්තාවකට පොලිස් නිලධාරීන් පිරිසක් පහර දී, ලිංගික අතවර කිරීමට ගිය බව කියන වීඩියෝවක් සමාජ මාධ්‍ය හරහා කරළියට පැමිණියේය. එම කාන්තාවගේ කතාව ඇසූ බොහෝ අය කියා සිටියේ යුක්තිය පසිඳලීමට සිටින පොලිස් නිලධාරීන් මෙසේ හැසිරීම ඉතාමත් ඛේදනීය තත්ත්වයක් බවයි. කෙසේවෙතත් මේ කතාවේ ඇත්ත නැත්ත දැනගැනීමට අප මෙම සිදුවීමට මුහුණපෑවා යැයි කියන ලිලානි දයාරත්න සමඟ කතා කළෙමු.

"අපි එච්චර ඇති හැකි පවුලක් නෙවෙයි. අපිට දරුවො තුන්දෙනෙක් ඉන්නවා. මේ වෙනකොට ලොකු දුවට අවුරුදු දසයක්. මමයි, මහත්තයයි යන්තම් දරුවන්ගේ ඕනෑ එපාකම් පිරිමහගන්නෙ සුළු රැකියාවල් කරලා. අපි දෙන්නම හම්බ කරන්න ගිහාම අපේ මහගෙදරින් තමයි වැඩි හරියක් දරුවො ගැන හොයලා බලන්නෙ. එදා ජූනි 20 වෙනිදත් මමයි, මහත්තයයි ගෙදර ආවහම අපේ නෑදෑ වෙන පුතෙක් කිව්වා අපේ ලොකු දුව කාත් එක්කදෝ ෆෝන් එකෙන් කතාබහ කරන ගමන් ෆොටෝ පවා හුවමාරු කරගන්නවා දැක්කා, පොඩ්ඩක් හොයලා බලන්න කියලා..."

එසැණින් තම වැඩිමහල් දියණියගේ ජංගම දුරකතනය සෝදිසි කර බැලූ ලිලානිටත්, සැමියාටත් දකින්නට ලැබුණු දෙයින් දෙදෙනාම ඇස් උඩ ඉන්දවා ගත්තාහ.

"ඒ වෙලාවෙ අපි දැක්කා දුවගේ ෆෝන් එකට පිරිමි ළමයෙක් නිරුවත් ෆොටෝ එවලා තියෙනවා. අනිත් පැත්තට අපේ දුවත් එයාගේ නිරුවත් ෆොටෝ යවලා තියෙනවා දැක්කම අපි දෙන්නාට පොළොව පලාගෙන යන්න හිතුනා..."

ඔවුන් විසින් සිය දියණියගෙන් මේ ගැන විමසූ පසුව, ඇය හඬමින් කියා සිටියේ තමා ෆේස්බුක් හරහා දිල්ශාන් නමැති පිරිමි ළමයෙකු සමඟ පෙම් සබඳතාවයක් ඇති කරගත් බවත්, ඔහුගේ බලවත් පෙරැත්තය නිසා මෙවැනි දෙයක් කිරීමට පෙළඹුණු බවත්ය.

"මමයි, මහත්තයයි ඒ ගැන අහන්න ඒ පිරිමි ළමයට කෝල් කරාට පස්සෙ අපිට කැත විදිහට බැනලා , රෑ එළිවෙන්න කලින් ගෙට පැනලා දුවව අරන් යනවා කියලා තර්ජනය කරා."

හරි වැරැද්ද හොයන්නට පෙර තම දරුවාගේ ආරක්ෂාව තර කිරීමට සිතූ ඔවුහු මේ සම්බන්ධව පාදුක්ක පොලිසියේ පැමිණිල්ලක් දැමීමට ඒ මොහොතේම නිවසින් පිටත් විය.

"පස්සෙ අපි පුළුවන් ඉක්මණට පාදුක්ක පොලිසියට ගිහිල්ලා දුවගේ ෆෝන් එකේ තිබුණ ෆොටෝ, මැසේජ්, වීඩියෝ සේරම පෙන්නලා පැමිණිල්ලක් දාන්න ඕන කියලා කිව්වා. ඒත් ඒ වෙලාවෙ කාන්තා පොලිස් කාර්යාංශයේ කවුරුත් නෑ කියලා එයාලා අපිට පහුවදාට එන්න කිව්වා. අපේ දුවව අරන් යනවා කියපු නිසා අපිට පහුවදා වෙනකන් ඉන්න පුළුවන්කමක් තිබුණෙ නෑ. අපි ඒ වෙලාවෙම මිරිහාන පොලිසියට ගිහිල්ලා මේ ගැන පැමිණිල්ලක් දැම්මා."

මිරිහාන පොලිසියේ පැමිණිල්ලක් දැමූ බව කියා සිටීමටත්, පහුවදාට නැවත පැමිණීමට අවශ්‍යද කියා දැනගැනීමටත් ඔවුන් නැවතත් පාදුක්ක පොලිසිය වෙත ගියේ මිරිහාන පොලිසියේ සිට ආපිට නිවසට යන අතරතුරය.

"ඒත් එතකොට පාදුක්ක පොලිසියෙන් අපිට කිව්වා මිරිහානේ පැමිණිලි දැම්මට වැඩක් නෑ ගමේ පොලිසියෙත් පැමිණිලි කරන්න ඕනේ කියලා. ඒත් අපි ඇහුවාම ඒ වෙලවෙත් කාන්තා පොලිස් කාර්යාංශයේ කිසිම කෙනෙක් හිටියෙ නෑ. ඊටපස්සෙ පොලිසියෙ අය එයාලට ඕන විදිහට පැමිණිල්ලක් ලියලා මහත්තයට කිව්වා අත්සන් කරහන් කියලා. අත්සන් කරලා තප්පරයක් යන්න කලින් ඒ අය මහත්තයට කිව්වා උඹ පලයන් කූඩුව ඇතුළට කියලා. ඊටපස්සෙ උඹ ළමයි එක්ක එළියෙන් වාඩිවෙලා හිටපන් කියලා මට පුටුවක් ගෙනත් දුන්නා. ඒ වෙලාවෙ මමයි, මහත්තයයි කෑගහලා ඇහුවා පැමිණිල්ලක් දාන්න ආපු අපිව කූඩු කරන්නේ මොන වරදක් කරාටද කියලා. ඊටපස්සෙ කිව්වා කූඩුවෙ දාලා පොලිසියේ තියාගන්නෙ අපේ ආරක්ෂාවට කියලා. කෑගහලා, පින්සෙන්ඩු වෙලා බැරිම තැන මහත්තයා කිව්වා එයාව තියාගෙන මාවයි දරුවන්වයි ගෙදර යවන්න කියලා. ඒත් කිසිම කෙනෙක් අපිව කනකට ගත්තෙ නෑ. අන්තිමට මහත්තයාට කූඩුවෙම බිම වැටිලා නින්ද ගියා. දරුවොන්ටත් එයා ළඟම කූඩුවෙන් එළියේ නින්ද ගියා."

ඒ වනවිටත් මධ්‍යම රාත්‍රියට ආසන්න වෙමින් තිබූ අතර, ලිලානි පොලිස් නිලධාරියෙකුගේ සහාය පැතුවේ වැසිකිළිය තිබෙන තැන සොයාගැනීමටය.

"ඒ වෙලාවෙ මම හිටියෙ බඩගින්නටයි, මහන්සියටයි හෙම්බත් වෙලා. පොලිසියෙ කෙනෙක් කිව්වා වැසිකිළිය තියෙන තැන පෙන්නන්න එයාගෙ පස්සෙන් එන්න කියලා. මම වැසිකිළියට යද්දි ඒ හතරවටේම දාලා තිබුණ ලයිට්, එළියට එනකොට සේරම නිවලා දාලා තිබුණා. එකපාරටම මාව එක්කගෙන ආපු පොලිස් නිලධාරියා කළුවරේම මගේ ළඟට ඇවිත් මගෙ අත් දෙකෙන් තද කරලා අල්ල ගත්තා. මං ඒ මොකද කියලා ඇහුවහම කිව්වා මිනිහව නිදහස් කරගන්න ඕනෙ නම් මගේ උවමනාවක් තියෙනවා ඒක කරලා දීපන් කියලා. ඒ වෙලාවෙ මං බයට හයියෙන් කෑගහද්දි ඒ මනුස්සයා මගේ කට තදකරලා වහගත්තා. ටික වෙලාවක් යද්දි තවත් සිවිල් පොලිස් කට්ටියක් එතෙන්ට දුවගෙන ආවා. ඊට පස්සෙ මේකිට මේවා මෙහෙම කියලා හරියන්නෑ කියලා කට්ටියම මට පොලුවලින් ගහන්න ගත්තා. ඒත් එක්කම තව කෙනෙක් මගෙ කොන්දට පයින් පාරක් ගැහුවා. ඒ වෙලාවෙ මගෙ ඇස් දෙක නිලංකාර වෙලා ගිහින් ටැප් එක ළඟ වතුර ගොඩේ ලිස්සලා වැටුණා.

මට ආපහු සිහිය එනකොට එයාලා මාව හිටපු තැනටම ගෙනත් දාලා තිබුණා. පස්සෙ මම කූඩුව ළඟට ගිහින් මහත්තයාව ඇහැරවලා වෙච්ච දේ කිව්වම එයා කිව්වා උදේට ඕ.අයි. සී. මහත්තයා ආවහම කියමු කියලා."

පසුදින ස්ථානාධිපතිවරයා කැඳවූ පසුව සියල්ල පවසා සාධාරණයක් ලබා ගැනීමට බලපොරොත්තු වුවද සියල්ල සිදුවූයේ කණපිටටය.

"ඕ.අයි.සී. මහත්තයා අපිව දැක්ක ගමන් කැත විදිහට අපිට බනින්න පටන්ගත්තා. අපි ආවෙ කොහෙන්ද, මොකට ආවද ඒ කිසිම දෙයක් කියන්න ඉඩක් දුන්නෙ නෑ. උඹේ ළමයව වැදුවෙ මමද? හැදුවෙ මමද? කියලා ඇහුවා. උඹේ ළමයට ෆෝන් දීලා ඇඟ වීඩියෝ කරලා පිරිමින්ට යවන්න කිව්වෙ මමද කියලා ඇහුවා. උඹේ මිනිහගෙ කට වැඩියි, අවුරුදු ගානකට ඇප ගන්න බැරි වෙන්න හිරේ යවනවා කිව්වා."

පසුව ඔවුන්ව නිදහස් කළද, පැමිණිල්ලක් දැමීමට ගිය ඔවුන්ට සැකකරුවන් ලෙස පොලිස් ඇප පිට එළියට ඒමට සිදුවීම පුදුමසහගතය.

"මගේ ෆෝන් එක තාම තියෙන්නෙ පාදුක්ක පොලිසියෙ. එයාලා ඒක නඩු භාණ්ඩයක් විදිහට උසාවි දනවා කියලා තියන් ඉන්නවා. ඒත් නඩු දනවද, නැද්ද, මොකටද කියලා අපිට පැහැදිලිව කියන්නෙ නෑ."

ලිලානි පවසන්නේ ඔවුන් මේ පිළිබඳව ළමා හා කාන්තා කාර්යාංශයත්, පොලිස්පති කාර්යාලයත් දැනුවත් කර පැමිණිලි කළද මේ වනතුරුත් නිශ්චිත විසඳුමක් ලැබී නොමැති බවයි.

පසුව අප පාදුක්ක පොලිසිය ඇමතුවේ මේ පිළිබඳව වැඩිදුර තොරතුරක් දැන ගැනීමටය. එහිදී පාදුක්ක පොලිසියේ පොලිස් නිලධාරී උදය කුමාර මහතා (97016) පවසා සිටියේ මෙවැනි දෙයකි.

"ඔය කියන පවුලේ මිනිස්සු එච්චර හොඳ මිනිස්සු නෙවෙයි. අපි දන්න තරමින් ඒ ගෑනු ළමයත් එච්චර හොඳ චරිතයක් තියෙන කෙනෙක් නෙවෙයි. ඒ අය පොලිසියත් එක්ක තියන මොන තරහකට මෙහෙම කරාද කියාලා අපි දන්නෙ නෑ. කොහොම වුණත් අපිට කියන්න තියෙන්නෙ මේක බොරු පැමිණිල්ලක්, අපි මේක ප්‍රතික්ෂේප කරනවා කියලා තමයි."

නඩුත් හාමුදුරුවන්ගේ වී බඩුත් හාමුදුරුවන්ගේ වූ කල මීට වඩා දෙයක් නීතිය තුළින් බලාපොරොත්තු විය නොහැකිය. මේ 'SYSTEM ' එක කවද කොතැනකදී කොහොම වෙනස් වේදැයි කියන්නට අප දන්නේද නැත. ඒ නිසා විශේෂයෙන්ම තරුණ ගැහැණු දරුවන් මෙවැනි සිදුවීම්වලින් පාඩම් උගෙන කටයුතු කරන්නේ නම් හොඳ බව අපේ අදහසයි. එසේම යුක්තිය පසිඳලන ආයතනවලදී මෙවැනි අකටයුතුකම් සිදුවන්නේ නම් ඔබ කළ යුතු තවත් යමක් ඇත. එනම් ඔබට සිදුවන අසාධාරණය පිළිබඳ කිනම් හෝ ඩිජිටල් සාක්ෂියක් ඉතිරි කරගැනීමයි. එවිට බෝල පාස් කිරීම තවදුරටත් කිසිවෙකුටත් පහසු නොවනු ඇත.

ලිහිණි මධුෂිකා

කුකුළෙක් කෑවා කියලා මගේ ලියෝන්ව වහ දීලා මැරුවා

තිරිසන් ගති ඇති මිනිසකුගේ නීච ක්‍රියාවක් නිසා මිය යන්නට පෙර ලියෝන් විඳවමින් සිටි අයුරු

ලියෝන්ගේ මළ සිරුර

ලියෝන් නොමැති සොවෙන් තැවෙන ලූගෝ

"ඒ මනුස්සයා කුකුල්ලු හදන්නෙ බිත්තරවලටයි, මසට විකුණන්නයි වුණාට මම ලියෝන්ව හැදුවේ දරුවෙක් වගේ. ලියෝන් ඒ මනුස්සයාගේ කුකුළෙක් අල්ලලා කෑවා කියල මම දැනගෙන හිටියේ නෑ. ලියෝන් එහෙම කරානම්, එදා ඒ මනුස්සයාට තිබුණා මට ඇවිල්ල කියන්න. එහෙනම් මං ඒ වෙලාවෙම කුකුළගෙ අලාභය වගේ දෙගුණයක් වුණත් ගෙවනවා. ඒත් එහෙම නොකර මගේ සතාට වහ දීලා මරලා දැම්මා. එයා මැරෙන්න කලින් පැය ගණනාවක් පුදුම විදිහට විඳෙව්වා. ඒක ආයේ, ආයෙ මතක් වෙනවටවත් මං කැමති නෑ... මට ඉවසන්න බෑ..."

ඒ ලියෝන්ගේ හිමිකරු වුණ සීගිරියේ සාලින්ද සම්පත් රත්නායකගේ හඬයි. සාලින්දත්, බිරිඳ ෂෙහානි සහ පුංචි තිසවිත් ඇසුරේ ලියෝන් හැදුණේ හරිම ආදරණීය විදිහටයි. ලියෝන්ට පමණක් නොව ලියෝන්ගේ සහෝදරයා ලූගෝටත් ඔවුන්ගේ ආදරය නොඅඩුවම ලැබුණි.

මේ දෙදෙනාම රොට්වයලර් වර්ගයේ බලු සුරතලුන් දෙදෙනෙකි. වයස අවුරුදු දෙකහමාරක් වන ලියෝන් සහ ලූගෝ සාලින්දලාගේ පවුලට එකතු වන්නේ අහම්බෙනි. සාලින්ද සීගිරිය ප්‍රදේශයේ විදේශිකයන් වෙනුවෙන් කෑම, බීම, ඉඳුම්, හිටුම් සහිත නවාතැන්පොළක් පවත්වාගෙන යන අතරතුර සංචාරකයන් එහා මෙහා කැටුව යන්නෙක් ලෙසද කටයුතු කරයි.

"අපි දෙන්නා ඉස්කෝලෙ යන කාලෙ ඉඳලම සත්තුන්ට හරි ආදරෙයි. මේ පැත්තේ මහමග අසරණ වෙලා, ලෙඩවෙලා හිටපු සත්තුන්ට මම පුළුවන් විදිහට පිහිට වුණා. විශේෂයෙන් මුහුණුපොත හරහා. මුහුණුපොතින්ම දැනගත් ජාඇල පැත්තේ එක්තරා කාන්තාවකට මම මුලින් මුලින් ඒ විදියට අසරණ වෙලා හිටපු සත්තු ගැන දැන්නුවාම ඇය ඒ සත්තුන්ව ගෙන්න ගත්තා. සමහර සත්තුන්ගේ කොඳු කැඩිලා. සමහර සත්තු තුවාල වෙලා. මහමග විතරක් නෙවෙයි සමහර ගෙවල්වලත් ප්‍රතිකාර නැතුව ලෙඩවෙලා හිටපු සත්තුන්ටත් මං ඇය හරහා පිහිට හෙව්වා. ඒ කාලේ ඒ විදියට අසරණ තත්ත්වයේ සිටි සත්තු තිහක් විතර යොමු කළා. ඒත් ඈ තුළ කිසිම විනිවිදභාවයක් නැති නිසා අන්තිමට නොහොඳ නෝක්කාඩු වුණා..."

සාලින්ද කියන්නේ ඔහු ඇයට භාරදෙන සතුන් පිළිබඳව ඉන්පසු කිසිම තොරතුරක් ඇය ලබා නොදෙන බවයි. ඒ නිසා සත්තු සුවවීමෙන් පසු යළි ගෙවල්වලට ගන්නට කැමැත්තෙන් සිටි අයටද සාලින්ද බොරුකාරයෙක් වුණේය. ඒ නිසා සතුන් ගැන ඇය තොරතුරු නොදී මගහැරීම සාලින්දට ඉවසුම් නොදුන්නේය. ඒ සත්තු තිහෙන්ම ගෙවල්වලට යළි ලැබුණේ සුව වූ බල්ලන් දෙදෙනෙක් පමණි.

"ඊටපස්සේ මමම එවැනි සතුන්ට ප්‍රතිකාර කරන්න පටන් ගත්තා. ඒ වෙනකොට සංචාරක ව්‍යාපාරයට අත තියලා තිබුණ නිසා මගේ අතේ සල්ලිත් තිබුණා. අද වෙනකොට ඒ වගේ සත්තු තිස්දෙනෙක් මං ගාව ඉන්නවා. ඒ ගොල්ලො හිටියෙ මගේ ගෙස්ට් හවුස් එක ඇතුළෙමයි. මගේ ගෙස්ට් හවුස් එකට ආව, ගිය විදේශිකයන් ඒ වැඩේ ගොඩක් අගය කළා. ඒ අතරෙ එක විදේශික යුවළක් ඔවුන් ළඟ හිටපු රොට්වයලර් පැටවුන්ගෙන් දෙන්නෙක් මට දුන්නා. ඒ තමයි ලියෝන් සහ ලූගො."

සාලින්ද ෂෙහානි පවුලට ඒ බලු පැටවුන් දෙන්නා ලැබුණේ 2019 වසරේ අප්‍රේල් මාසයේය.

කොළඹ ගෙවල් ඇතුළෙත්, කූඩු ඇතුළෙත් 'රොට්වයලර්' බල්ලන් සිරකරුවන් සේ හැදෙද්දී ලියෝන් සහ ලූගෝ ගමේ නිදහස හොඳින්ම භුක්ති වින්දහ. රොට්වයලර් බල්ලන් ස්වභාවයෙන් සැරපරුෂ වූවත් කූඩු නොවී නිදහසේ හැදුණ නිසා ඒ සතුන් එතරම් සැරපරුෂ වූයේ නැත.

"ලියෝනුයි ලූගොයි ලැබිලා අවුරුද්දකට පස්සෙ තමයි අපිට දුව ලැබෙන්නෙ. දුව එක්කත් එයාලා පුදුම විදිහට එකතු වුණා. ඒත් සත්තුන්ගේ ජාති ගතියට අත් නොහැරුණ දෙයකුත් තිබ්බා. ඒ වඳුරො, රිළව්, කුරුල්ලො, පූසො, කුකුල්ලු වගේ සත්තු දැක්කොත් බුර බුර පස්සෙන් පන්නනවා. මේ දෙන්නා ගෙවල් ළඟ තියන ඇළ පාරටත් නිතර යනවා. ඒ යන්නෙත් රස්නෙ වැඩිකමට වතුරෙ නටන්නයි ඇළ ඉවුරෙ ඉන්න රිලව්න්ට බුර බුර උඩ පනින්නයි..."

එසේ සිටි ලියෝන් පසුගිය පළවැනිදා උදේ ඇළ පාරට දිව ගොස් ආවාට පසු ටිකෙන් ටික වෙනස් වන්නට ගත්තේය.

"අපේ ගෙදරයි ගෙස්ට් හවුස් එකයි එකම ඉඩමේ තියෙන්නේ. දුව ලැබෙනකල් අපි එක්ක ගේ ඇතුළෙම හිටපු ලියෝනුයි ලූගොයි දුව ලැබුණාට පස්සෙ ඉඳලා රෑට තිබ්බෙ ගෙස්ට් හවුස් එකේ. එදා මං උදේම ගෙදරින් වැඩකට ගිහින් හිටියේ. ෂෙහානි උදේ දහයට කෑම එක දෙන්න දොර ඇරලා තියෙනවා. එතකොටම ලියොන් කෑමත් නොකා තමයි ඇළට දුවලා තියෙන්නේ."

ඒත් උදේ කෑම එක දුටු නිසාදෝ ඇළ පාරේ වැඩිවෙලා නොසිට විනාඩි දයකින් පමණ ලියෝන් යළි දිව විත් ඇත. ඒ මොහොතේ ෂෙහානි උදේ කෑම එක ලියෝන්ට දුන්නද ඉව කර බැලුවා මිස කෑම නොකෑ බව ඇය කියයි.

"වෙනදටත් සමහරදාට මෙයාලා කෑම වේලක් නොකන දවස් තියෙනවා. හැබැයි පොඩි කැස්ස ගතියක් ඒ වෙලේ තිබ්බා. මං ඒක එච්චර ගනන් ගත්තෙ නෑ. ආයෙ ගෙස්ට් හවුස් එක ඇතුළෙ දෙන්නව තියලා දොර වැහුවා. අපි මේ දෙන්නට ඊළඟ කෑමවේල දෙන්නෙ රෑට. දවල්ට මෙයාලා කරන්නෙ නිදාගන්න එක. මං රෑ කෑම එක අරන් ගිහින් දොර ඇරියත් කිසිම දැඟලිල්ලක් නැතුව ලියෝන් පැත්තකට වෙලා හිටියා. එයා හිටපු තැන ලේ තිබුණා තැන තැන. හොඳට බලද්දියි දැක්කෙ ඒ ලේ වැටෙන්නෙ ලියෝන්ගෙ කටෙන් කියලා. එතකොටත් මහත්තයා ගෙදර ඇවිත් නෑ. මං කෝල් එකක් දීලා විස්තරේ කිව්වම එයා ඉක්මනට ගෙදර ආවා."

සාලින්ද නිවසට එනවිට රාත්‍රී 9 පසුවී තිබුණි. ඒ වෙලාවේ සීගිරියේ සිට මාතලේට ගොස් පශු වෛද්‍යවරයෙකු සොයා ගන්නට බැරි වේ යැයි සිතා පසුදා උදේ ලියෝන් ගෙන යන්නට ඔහු කල්පනා කළේය. ඒ අනුව සැප්තැම්බර් දෙවැනිදා උදේ ලියෝන් මාතලේ පශු වෛද්‍ය සායනයට ගෙන යන්නට සූදානම් වුණේය.

"ඒ වෙලාවෙ එයාට කෙලින් හිටගන්න බෑ.පිටිපස්සේ කකුල් පණ නැති ගතියක් තිබ්බා. ඒ වෙලාවේ කටින් ලේ ගියේ නැති වුණත් බඩෙන් අල්ලලා උස්සලා වාහනයට දානකොට කටින් ලේ ආවා. ආයෙ පශුවෛද්‍ය ළඟට ගිහිල්ලා මේසේ උඩින් තියන්න බඩෙන් අල්ලලා උස්සද්දි ලේ ආවා. දවල් 11 ඉඳලා හවස 5 විතර වෙනකල් ලියෝන් එතන තියන් හිටියා. ලේ එකක් බැලුවට පස්සේ තමයි කිව්වේ ලේවලට විසක් මිශ්‍ර වෙලා කියලා. ලියෝන්ගේ ජීවිතයේ සියයට අසූවක්ම අවදානම් තත්ත්වයේ තියෙන්නෙ කියලා ඩොක්ටර් කිව්වා. මං ලියෝන්ව ගෙදර අරන් ආවෙ හරිම කම්පාවෙන්. එයාට හොඳටම අමාරුයි. ගේ ඇතුළෙ බාත්රූම් එකෙන් එයාව තියාගත්තා. අපි එයා ළඟට වෙලා අත ගගා බලා හිටියා. රෑ 12 ට කිට්ටු කරලා ඩොක්ටර්ත් කතා කළා. තව බෙහෙතක් දුන්නා පුළුවන්නම් හොයල දෙන්න බලන්න කියලා. මම ඒක ගේන්න යන්න හිතාගෙන වාහනය ළඟට යද්දී ෂෙහානි කෑගහුවා. මං දිව්වා. යනකොට අනේ ලියෝන් බෙල්ල දික්කරගෙන දඟලනවා. මං අත් දෙකින්ම ඔලුව උස්සලා අරගෙන මගේ කකුලෙන් තියාගත්තා. ඒත් ඒ මොහොතේ මගෙ අත් දෙක උඩ ලියෝන්ගෙ අන්තිම හුස්ම පොද ගියා..."

ෂෙහානි කෑගසා හැඬුවාය. පිරිමින්ගේ හිත් තද වුවත් සාලින්දගේ දුකද ඉවුරු තලා ගැලුවේය. ජීවිතය හැර ගියේ ලියෝන්ගේ සිරුර ගේ තුළ තබාගෙන ජීවිතේ දිගම රැය ඔවුන් පහන් කරමින් සිටියහ. පසුදා උදෑසන සීගිරියේ පොලිසියේ සාලින්ද පැමිණිල්ලක් දැමූවේ කෙනෙකු වස දීමෙන් ලියෝන් මියගිය බව කියමිනි. පශ්චාත් මරණ පරීක්ෂණයක් කරගන්නට බොහෝ වෙහෙස වුවත් ඔහුට ඒ මොහොතේ එය කර ගැනීමට නොහැකි විය. ඒ මොහොතේ සැක කරන්නට කෙනෙක් නොසිටියෙන් ඔහු ගෙදර විත් සන්ධ්‍යාවේ ලියෝන්ගේ අවසන් කටයුතුවලට සූදානම් වුණේය. හාමුදුරුවන් වඩමවා පාංශුකූලය දී පැන් වඩා රෑ හතට පමණ අඳුර මැද වත්තේම මිහිදන් කළේය. ඒ මොහොතේ අවට සිටි ඔහුගේ ළඟම ඥාතීන් එහි පැමිණි අතර, ලියෝන් පස් යට මිහිදන් වෙද්දී සැවොම හඬා වැළපුණහ. ඒ අතරේ ලියෝන් සමග පස් යට සැඟව යන්නට තිබූ දෙයක් ද හෙළිවිය. ඒ ඇළ ළඟ අසල්වාසී මිනිසෙකු ඊට සති තුනකට පමණ පෙර ඔහුගේ ආච්චිට කළ තර්ජනයකි.

"ඒ මනුස්සයාගේ ගෙදර හරහා තමයි ලියෝන් ඇළට දුවන්නෙත්. අපේ බල්ලො කුකුලෙක් අල්ලලා කෑවා තියලා ආච්චිලාගෙ ගෙදර ඇවිත් ඒ මිනිහා තර්ජනය කරලා ගියාලු, ආයෙ බල්ලො ආවොත් වහ දෙනවා කියලා. ඒක ආච්චි කිව්වේ ඒ වෙලාවේ. මං ඊට පසුවදම ආච්චිත් එක්ක පොලිසියට ගිහින් පැමිණිල්ල අලුත් කළා. ඒ වතාවෙ පොලිසියෙන් ඒ මනුස්සයාත් අපිත් ඊට පහුවදා උදේ පොලිසියට කැඳෙව්වා. දෙපැත්තෙම කරුණු ඇහුවා. ඒ මනුස්සයා කිව්වා මගෙ කුකුල්ලු බල්ලො කාලා තිබුණා තමයි. ඒත් මේ බල්ලො නෙවෙයි. ආච්චිලාගෙ ගෙදර ගිහින් තර්ජනය කළෙත් නෑ, සතාට වහ දුන්නෙත් නෑ කියලා."

ලියෝන් මැරූ මිනිසාට දඬුවම් දී හෝ හිත සනසා ගන්නට සිටියත් කිසිඳු සාක්කියක් නැති නිසා එය එසේ සිදුවූයේ නැත. වැඩිදුර ඒ ගැන සොයන බවට පොලිසිය දැනුම් දුන්නේය.

"ලියෝන්ට මේ ඉරණම අත්වුණේ අපෙත් වැරැද්දෙන් කියන පසුතැවිල්ල ජීවිත කාලෙ පුරාම තියෙයි. ඒගොල්ලන්ට ඉඳලා හිටලා හරි එහෙම යන්න දුන්න එක වැරදියි. ආයෙ ඒ වැරැද්ද වෙන්නේ නෑ. ලූගෝට තමා ලොකුම පාඩුව. ලියෝන් මල්ලි නැතුව හරිම සාංකාවෙන් ඉන්නේ. මම හැම කෙනෙක්ගෙම ලියෝන් වෙනුවෙන් ඉල්ලන ඉල්ලීමක් තියෙනවා. මොනම හේතුවකටවත් සත්තු මරන්න වහ දෙන්න එපා. ඒ සත්තු පුදුමාකාර විදිහට වද වේදනා විඳිනවා. ඒ හින්දා කවදාවත් සතෙකුට වහ දෙන්න එපා!"

සාලින්ද, ෂෙහානි යුවළ ලියෝන් සහ ලූගෝ සමග

බියංකා නානායක්කාර

ප්‍රශ්න පත්‍ර සාකච්ඡාව
සෑම ඉරිදා දිනකම
උදෑසන 6.30 - 8.00 දක්වා

PEOTV Dialog TELEVISION

Channel No. 14

අද දෙරණ

Education නාලිකාව

ADA derana EDUCATION

තුළින්

දිවයින පුරා පුවත්පත් නියෝජිතයන්ගෙන්
සහ පොත්හල් වලින්
දැන් මිලදී ගත හැක

විශේෂ ඇනවුම් සඳහා විමසන්න, රුවන් - 0762568348

තැනේ හැටියට ඇණේ ගහන්නට ජංගම ව්‍යාපාරික රථ හදන

ඉෂාරා

පියෙකුගේ අභිමානය පරම්පරාවෙන් පරම්පරාවට ගෙනයන්නට පුතෙකු තරම් වටිනා තවකෙක් නැතැයි බොහෝ අය කියති. නමුත් පුතුන් නැතුවාට දියණියකටත් එකී අභිමානය ඉදිරියට ගෙනයා හැකි බව අපට කීවේ 'ඉෂාරා වෙන්චර්ස් පුද්ගලික සමාගමේ' කළමනාකාර අධ්‍යක්ෂකවරිය ඉෂාරා මනමේන්ද්‍රයි.

මේ වනවිට හෝකන්දර ප්‍රදේශයේ පදිංචිව සිටින ඉෂාරා, මෙරට ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරිකයෙකු වන ප්‍රේමදාස මනමේන්ද්‍රගේ වැඩිමහල් දියණියයි. ඇමෙරිකාවේ කැන්සාස් විශ්වවිද්‍යාලයෙන් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උපාධිය හැදෑරූ ඇය, කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ ආදිසිසුවියකි.

"මගේ තාත්තා මුලින්ම පටන් ගත්තේ ග්‍රිල් ගේට්ටු හදන වැඩපොළක්. පස්සෙ කාලෙකදි තාත්තා ටිකෙන් ටික දියුණු වෙන්න ගද්දි ඒක ලොරි බොඩි හදන වැඩපොළක් විදිහට, 'ඉෂාරා ලොරි බොඩි' කියලා වෙනස් කරා. මට මතකයි මමත් පොඩි කාලේ ඉස්කොලේ ඇරිලා තාත්තගෙ වැඩපොළට යන්න ආසාවෙන් බලන් හිටියා. මොකද මං සෙල්ලම් කරේ තාත්තා වාහන හදපු ආයුධවලින්. ඒ විතරක් නෙවෙයි මං පැන්සල් පවා උල් කරේ වාහන හදන ආයුධවලින්. පස්සෙ කාලෙදි මම තමයි අපේ ඉස්කෝලේ ගණිත විෂයට දක්ෂම ශිෂ්‍යාව වුණේ. ඒ දක්ෂතාවයයි, යාන්ත්‍රික පැත්තට (machanical) තිබුණු ආසාවයි නිසා මං හිතුවා කවදහරි මැකනිකල් ඉංජිනේරුවරියක් වෙනවා කියලා. මේක ගෑනු ළමයෙකුට බෑ කියලා මට හිතුණෙ නෑ."

පාසල් අධ්‍යාපනයෙන් අනතුරුව ඇය ඇමෙරිකාවට යන්නේ 2005 වසරේදීය. ඒ සිතූ පරිදිම දක්ෂ ඉංජිනේරුවරියක් වීමේ බලාපොරොත්තුව ඇතිවය. පසුව 2012 වසරේදී තම උපාධිය අවසන් කර මෙරටට පැමිණි ඇය, වසරක් යනතුරුම කළේ, නොයෙකුත් ආබාධ සහිත දරුවන් රැක බලාගැනීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑමය. එහෙත් අවාසනාවකට ඒ කාලයේදීම ඇගේ පියා රෝගී විය. එතැන් පටන් පවුලේ වැඩිමහල් දරුවා ලෙස පියාගේ ව්‍යාපාර කටයුතු ඉදිරියට ගෙනයෑමට සිදුවූයේ ඇයටය. පසුව ඉෂාරා ලොරි බොඩිවලට නව මුහුණුවරක් දීමට සිතූ ඇය, ඉෂාරා ලොරිබොඩි ආයතනයට අනුබද්ධව 'ඉෂාරා වෙන්චර්ස් ප්‍රයිවට් ලිමිටඩ් පුද්ගලික ආයතනය' ආරම්භ කරනු ලැබුවේ 2015 වසරේදීය.

"අපේ ආයතනයෙන් කරන්නේ යකඩ, ඇලුමිනියම් අමුද්‍රව්‍ය යොදාගෙන ලොරි බොඩි වගේම, අනෙකුත් භාණ්ඩ නිර්මාණය සහ නිෂ්පාදනය. මුල් කාලෙදි නම් තාත්තා කරපුවා දුව කරන්නේ කොහොමද කියල ගොඩක් අය කතා කිව්වා. හැබැයි පස්සෙදි මගෙ නිර්මාණ දකිනකොට ඒ අයත් මට ලොකු සහයෝගයක් දුන්නා."

තමන් මෙම ව්‍යාපාරය බිංදුවෙන් පටන් නොගත්තාට, අද වනවිට තිබූ තැනට වඩා දස ගුණයකින් ඉදිරියට ගෙනැවිත් ඇති බව ඇය කියන්නේ නිහතමානී ආඩම්බරයකිනි.

"අපේ රට එන්න එන්නම ජනගහණය වැඩිවෙන පුංචි රටක්. ඒක නිසා දවස ගානෙම ඉඩම් ඒකක ඉහළ යනවා. එතකොට හැමෝටම ඉඩම් මිලට, බද්දට අරන් ව්‍යාපාර කරන්න බෑ. අන්න ඒ නිසා අපේ රටට හරියන්නෙ ජංගම ව්‍යාපාරික රථ කියන මතයේ තමයි මං නිතරම හිටියේ. අපි අවුරුදු 4ක් විතර ඒ ගැන අධ්‍යනය කරලා ජංගම ව්‍යාපාරික රථ හදන්න පටන්ගත්තට පස්සෙ තමයි කොවිඩ්වලටත් ඒ විදිහ අනුගමනය කරන්න පටන් ගත්තෙ. මට මතකයි මම මේ ව්‍යාපාරයට අත තිබ්බට පස්සේ මුලින්ම නිර්මාණය කළේ ජංගම පීට්සා ටේලරයක්. ඇත්තම කිව්වොත් එද මට දැනුණු සතුට කියලා නිම කරන්න බෑ."

මේ වනවිට ඔවුන් ජංගම ව්‍යාපාර ක්ෂේත්‍රයට ගැළපෙන අයුරින් බොහෝ වාහන නිර්මාණය කර ඇත. එම නිර්මාණ අතරින්, ජංගම බැංකු රථ, ජංගම පීට්සා ට්‍රේලර්, හයිඩ්‍රොලික් තාක්ශණය මගින් උස දෙගුණ කළ හැකි ඇස්ට්‍රා මොබයිල් රෙස්ටූරන්ට් රථය සහ නානාවිධ ෆුඩ්ස් ට්‍රක් (ආපනශාලා) සුවිශේෂී තැනක් ගත් නිර්මාණය. තවද ඕනෑම ස්ථාවර නිර්මාණයක් හෝ නිවසක් ජංගම බවට පත්කිරීමේ නවීන තාක්ෂණයද ඔවුන් සතුව ඇත. එමෙන්ම ඕනෑම දේශීය ව්‍යාපාරිකයෙකුට තමන්ගේ ව්‍යාපාරයට සරිලන ආකාරයෙන් රුපියල් ලක්ෂ දෙකේ සිට ඉහළට මෙම ජංගම ව්‍යාපාරික රථ ලබාගැනීමේ හැකියාවද ඇත.

"මේ වෙද්දි හුගක් අය ලොරි බොඩි පිට රටවල්වලින් ගෙනැල්ලා විකුණනවා. ඒකේ වරදක් නැති වුණත් දේශීය කර්මාන්තකරුවාට ලොකු පහරක් වදිනවා. මේ කර්මාන්තයෙන් ඉස්සරහට යන්න නම් අපේ රටේ දේශීය කර්මාන්තකරුවාට ගැළපෙන දෙයක් කරන්න ඕනෙ."

ඇය කියන්නීය..

"ටිකක් හිතන්නකො, සමහරු ලක්ෂ ගණන් අත්තිකාරම් මුදල් ගෙවලා ව්‍යාපාරික ස්ථාන බදු ගන්නවා. ඊටපස්සෙ බිස්නස් නැතුව අත්තිකාරම් මුදලුත් කුලියට කපාගන්න දීලා ගෙදර යනවා. ඒත් ජංගම ව්‍යාපාරික රථයක් කියන්නෙ එහෙම දෙයක් නෙවෙයි. එකතැනක බිස්නස් නැත්තම් තව තැනකට අරන් යන්න පුළුවන්."

මේ වෙද්දි හුගක් අය ලොරි බොඩි පිට රටවල්වලින් ගෙනැල්ලා විකුණනවා. ඒකේ වරදක් නැති වුණත් දේශීය කර්මාන්තකරුවාට ලොකු පහරක් වදිනවා

මුල් කාලෙදි නම් තාත්තා කරපුවා දුව කරන්නේ කොහොමද කියල ගොඩක් අය කිව්වා. හැබැයි පස්සෙ මගෙ නිර්මාණ දකිනකොට එහෙම කියපු අයත් ලොකු සහයෝගයක් දුන්නා

සැබෑය. මෙම ක්‍රමය වැඩි වශයෙන් කරළියට ආවේ කොරෝනා උවදුරත් සමඟය. එමෙන්ම ගෝල්ෆේස් පිටිය, කිඹුලාවල හන්දියට යන එන ඕනෑම අයෙකුට ඒ පිළිබඳ ඕනෑතරම් උදාහරණද දැකිය හැක. ඉෂාරා වෙන්චර්ස් පුද්ගලික සමාගම මේ වනවිට සෘජු සහ වක්‍ර සේවක සේවිකාවක් බොහෝදෙනෙකුට රැකියා අවස්ථා හිමිකර දී ඇත. දේශීය කර්මාන්තකරුවාට තව තවත් නව ව්‍යාපාර රථ හඳුන්වාදීමට කටයුතු කරන ඔවුන් වාර්ෂිකව ඉහළ ආදායම් වාර්ථාද තබන්නට සමත්ව ඇත.

"මම මේ ව්‍යාපාරය ඉහළට ගෙනාවේ ගොඩක් අමාරුවෙන් පියවරෙන් පියවර. මට කාන්තාවන්ට කියන්න තියෙන හොඳම දේ තමයි කවදවත් තමන්ට තමන් සීමාවල් දාගන්න එපා කියන එක. මොකද අපේ සීමාව තියෙන්නේ වෙන කොහෙවත් නෙවෙයි, අපේ හිත ඇතුළෙමයි."

ලිහිණි මධුෂිකා

GS &Co
BELIEVE
Sterill
ON THE GO
සැනිටයිසර් ස්ප්‍රේ
ඔබේ විශ්වාසවන්ත ආරක්ෂකයා
නිවසින් පිටතට යන විට ඔබ ළඟම තබාගෙන පොදු ස්ථාන ඇල්ලීමේදී දෑත් පිරිසිදු කරගන්න...
Sterill
ON THE GO
Sanitizer Spray
Kills 99.9% of illness causing germs
රු.160/- යි
රෝගකාරක විෂබීජ
99.9%
විනාශ කරයි
නියම ප්‍රමිතිය නිසා වැඩි ආරක්ෂාවක්
ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතීන්ට අනුව නිෂ්පාදනය කර ඇත
SLS
1657
ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය සහිතයි
අලෙවිය:
ජෝර්ජ් ස්ටුවර්ට් කන්සියුමර් (පුද්ගලික) සමාගම
439, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව.
දුරකථන: 0115 66 26 26
අනුමැතිය:
ජාතික ඖෂධ නියාමන අධිකාරිය
ලියාපදිංචි අංකය: COS-007793-PR

මගේ ලෙඩේ මහත්තයටත් බෝ වෙලා ඩොක්ටර්!

ලිංගාශ්‍රිත රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය
I.L.ජයවීර
MBBS, PG Diploma, MD (Venereology)
ජාතික ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්ධන වැඩසටහන

සෙව්වන්දි හෙට්ටිආරච්චි

බොහෝ කාන්තාවන් මානසික පීඩාවට ලක්කරනා, පවුල් ජීවිත පවා අවුල් කරනා ඉතා සුලබ රෝග තත්ත්වයක් පිළිබඳව කතා කිරීමයි අද ලිපියේ අරමුණ.

රෝග තත්ත්වය ගැන පැහැදිලි කිරීමට උදාහරණයට ගන්නා යුවළගේ නම් ගම් හෙළි කළ නොහැකි නිසා ඔවුන්ව සමන්ත සහ නදීශා ලෙස හඳුන්වමි. සමන්ත සහ නදීශා විවාහ වී තිබුණේ මීට අවුරුදු දෙකකට පෙරය. නමුත් ඔවුන්ගේ රාත්‍රී නිදියහන වේදනාව, සුසුම්ලෑම් පිරි කටුක ස්ථානයක් බවට පත්වීමට මාස හයක්වත් ගත නොවූ බව සායනයට නදීශා පැවසුයේ ඉකිගසා හඬමින්.

"මට සුද යනවා ඩොක්ටර්... ඒ නිසා අපිට හරියට එකතු වෙන්න බැහැ. ඇත්තම කිව්වොත් මේ කරුම ලෙඩේ නිසා මතක ඇති කාලෙකින් අපි අඹු සැමියෝ විදියට එකතු වෙලා නැහැ... මං විතරක් නෙමෙයි මේක නිසා මෙයත් සෑහෙන දුක් විඳිනවා...."

රෝගී තත්ත්වය නිසා තමාට දරුවෙකු පිළිබඳව සිතීමට පවා අපහසු වී ඇති බව ඈ කීවාය.

එමෙන්ම රෝගී තත්ත්වය හේතුවෙන් ලිංගාශ්‍රිත ප්‍රදේශය කැසීම, තුවාලවීම, වේදනාවක් දැනීම වැනි ලක්ෂණ ඇතිවන බවත් ඇතැම් විටක රතුවීම, ඉදිමීම සහ ගිනි ගන්නා සුළු ස්වභාවයක් (Burning Sensation) දැනෙන බවත් නදීශා පැහැදිලි කළාය.

"සමහර වෙලාවට යෝනි මාර්ගයෙන් උකු ස්‍රාවයක් එනවා.... මුදවපු කිරි වගේ දෙයක් එන වෙලාවලුත් තියෙනවා... ලිංගිකව එකතු වෙන්න හදද්දිත් ඔය මුදවපු කිරි වගේ ස්‍රාවය එනවා. ඊටපස්සේ මගෙන් ඒක මෙයාටත් බෝවෙනවා..."

ලිංගිකව එක්වීමට උත්සාහ කළ පසු සමන්තගේ ලිංගාශ්‍රිත ප්‍රදේශයේද රතුවීමක්, කසන සුළු ස්වභාවයක් ඇතිවන බවත්, ශිෂ්ණය කොටසේ කුඩා පැලීම් ඇතිවන බවත් නදීශා තවදුරටත් පැහැදිලි කළාය.

"එකතු වෙන්න උත්සාහ කළත් පුදුමාකාර වේදනාවක් දැනෙනවා. ඒ විතරක් නෙමෙයි මුත්‍රා කරන්න පවා අපහසු වෙන වෙලාවල් තියෙනවා..."

තත්ත්වය මෙතරම් නරක අතට හැරෙන තෙක් මෙයට ප්‍රතිකාර නොකළේ ඇයිදැයි මම නදීශාගෙන් විමසා සිටියෙමි.

"කීප සැරයක්ම බෙහෙත් ගත්තා ඩොක්ටර්... බෙහෙත් බොනකල් හොඳයි. බෙහෙත් නතර කරපු හැටියේ ආයෙත් ලෙඩේ මතුවෙනවා..."

එය නම් වෛද්‍යවරුන් වන අපට හොඳින් හුරුපුරුදු වැකියක්ය. බොහෝවිට ගැටළුව ඇත්තේ වෛද්‍ය ප්‍රතිකාරවල නොව, වාරයෙන් දෙවාරයෙන් රෝගය සුව කරනා මැජික් ඖෂධ බලාපොරොත්තු වන රෝගීන් තුළය. රෝග තත්ත්වය යටපත් වීමට පටන්ගත් හැටියේ ඖෂධ නතර කර දැමීම බොහෝදෙනාගේ සිරිතය. ඔබේ වෛද්‍යවරයා රෝගයට ප්‍රතිකාර කරන්නේ ක්‍රමානුකූලවය. ඒ නිසා නිතර නිතර වෛද්‍යවරයා සහ ඖෂධ වෙනස් කිරීමට ඉක්මන් නොවී මෙවැනි රෝගයකදී වෛද්‍ය නිර්දේශ නිවැරදිව පිළිපැදීම ඉතාම වැදගත් බව මතක තබාගත යුතුය.

> **බෙහෙත් බොනකල් හොඳයි. නතර කරපු හැටියේ ආයෙත් මතුවෙනවා**

නදීශා, සුදයාම ලෙසින් හැඳින්වූ මෙම රෝගී තත්ත්වයේ වෛද්‍ය විද්‍යාත්මක නාමය කැන්ඩිඩා ආසාදනයයි (Candida). යෝනි මාර්ගයේ ඇති 'ලැක්ටොබැසිලස්' නමැති අපට හිතකර බැක්ටීරියාව අවම වූ විට යෝනි මාර්ගයේ ආම්ලිකතාවයද අවම වේ. එවිට යෝනි මාර්ගය ආශ්‍රිතව ජීවත් වූ 'කැන්ඩිඩා' නම් අහිතකර දිලීරය යහමින් වර්ධනය වී කැන්ඩිඩා රෝග ලක්ෂණ ඇති කරවයි. මෙය ඉතා පහසුවෙන් සුව කළ හැකිය. නමුත් ආසාදනය වී ඇත්තේ තරමක් දුලබ කැන්ඩිඩා දිලීර වර්ගයක් වන කැන්ඩිඩා නන් ඇල්බිකන්ස් (Candida Non Albicans) නම් රෝගය නැවත නැවත මතුවීමට ඉඩ ඇත. ඒ නිසා සාමාන්‍ය කැන්ඩිඩා ආසාදනයට ලබාදෙන යෝනි මාර්ගයට ඇතුළු කරන ප්‍රතිදිලීර කරල් හෝ ක්‍රීම් මෙහිදී ප්‍රතිඵල රහිත විය හැකිය.

යම් කාන්තාවක් නිතර නිතර කැන්ඩිඩා ලක්ෂණ පෙන්නුම් කරන්නේ නම් ඇයව වෛද්‍ය පරීක්ෂණයකට යොමුකිරීම වඩා හොඳය.

ඒ නිසාම නදීශාවද වෛද්‍ය පරීක්ෂණයකට යොමු කිරීමට මම තීරණය කළෙමි. ඇයගේ යෝනිස්‍රාව නියැදි ලබාගෙන ඒවා යෝනිස්‍රාව වගා පරීක්ෂාවකට (Culture) බඳුන් කළෙමි. මෙම පරීක්ෂණයෙන් සිදු කරන්නේ දිලීරයට ප්‍රතිදිලීර ඖෂධ ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්න සොයා බැලීමයි.

මා සිතූ පරිදිම නදීශාට ආසාදනය වී තිබුණේ කැන්ඩිඩා නන් ඇල්බිකන්ස් දිලීර වර්ගයකි.

ප්‍රතිදිලීර ඖෂධ, ආලේපන සහ ප්‍රෙසරි (යෝනි මාර්ගයට ඇතුළු කළ හැකිවන ලෙස තැනූ විශේෂ හැඩයකින් යුත් පෙති) මගින් නදීශාගේ රෝගය නිට්ටාවට සුව කිරීමට මාස කිහිපයක් ගත විය.

යම් කාන්තාවකට කැන්ඩිඩා ආසාදනය වී තිබූ පමණින් ඇයගේ ලිංගික සහකරුවාට රෝග තත්ත්වය ආසාදනය වන්නේද නැත.

නමුත් ලිංගික සහකරුවාට රෝගය බෝවීමට යම් ඉඩකඩක් ඇති බවත් කිව යුතුය. එසේම දිලීරය ආසාදනය නොවූවත් දිලීරයට ආසාත්මිකතා දක්වන පුද්ගලයන්ද ඇත. නමුත් නිසි ප්‍රතිකාර මගින් එම තත්ත්වයද නිට්ටාවටම සුවපත් කරගත හැකිය.

කැන්ඩිඩා රෝග තත්ත්වය කාන්තාවන් අතර ඉතා සුලබ තත්ත්වයක් නිසා රෝගය පිළිබඳව තවත් තොරතුරු කිහිපයක් සටහන් කිරීම හොඳ යැයි සිතමි.

දියවැඩියාව, HIV වැනි ප්‍රතිශක්තිකරණ පද්ධතිය දුර්වල කරවන රෝගාබාධ ඇති කාන්තාවන්ට මෙම දිලීරය ඉතා පහසුවෙන් ආසාදනය විය හැකිය. එයට අමතර යෝනි මාර්ගය ආශ්‍රිතව සිදුකරන වැරදි පුරුදුත් කැන්ඩිඩා ආසාදන ඇතිවීමට හේතු විය හැකියි.

ලිංගාශ්‍රිත ප්‍රදේශය නිතර නිතර සබන් හෝ විෂබීජනාශක දමා සේදීම, එම ප්‍රදේශයේ සැර සුවඳ විලවුන් හා ආලේපන ගැල්වීම සහ සිරුරට තද සිල්ක් යට ඇඳුම් ඇඳීම එම වැරදි පුරුදුවලින් කිහිපයක්ය.

මේ කතාවේ කතා නායිකාව වන නදීශාද සැමියා සමඟ ලිංගිකව එක්වූ විගස සැර විෂබීජනාශක දියරයක් යොදා තද ජල පහරකින් යෝනි මාර්ගය අභ්‍යන්තරය සේදීමට හුරුවූ කාන්තාවකි. මින්මතු එවැනි දේ නොකරන ලෙස මම ඇයට උපදෙස් ලබාදුන්නේ රෝග තත්ත්වය නැවත ඇතිවීම වළක්වාලීම උදෙසාය.

කැන්ඩිඩා දිලීර ආසාදනය ලිංගික සංසර්ගයකදී බෝවිය හැකි නමුත් එය ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝගයක් නොවන බවත් කිව යුතුය. නමුත් ලිංගිකව සක්‍රීය නොවන කාන්තාවකට සාපේක්ෂව ලිංගිකව සක්‍රීය කාන්තාවකට කැන්ඩිඩා දිලීරය ආසාදනය වීමට ඇති අවධානම ඉහළය.

කාන්තාවකගේ යෝනි මර්ගය තෙත් ස්වභාවයෙන් යුක්ත වීම ඉතා ස්වභාවික දෙයකි. නමුත් අසාමාන්‍ය ලෙස යෝනි ස්‍රාවයක් පිටවනවා නම් ළඟම ඇති ලිංගාශ්‍රිත රෝග සායනයට හෝ ප්‍රසව හා නාරිවේද රෝග සායනයට සහභාගී වීමෙන් රෝගය නිට්ටාවටම සුව කරගත හැකිය.

> **එකතු වෙන්න උත්සාහ කරද්දී පුදුමාකාර වේදනාවක් දැනෙනවා. ඒ විතරක් නෙමෙයි මුත්‍රා කරන්න පවා අපහසු වෙන වෙලාවල් තියෙනවා**

සුන්දර සමක් සඳහා ඔබ දෛනිකව අනුගමනය කළ යුතුම පියවර තුනක් තියෙනවා

සම රැක බලාගන්නේ නැතුව නිරපරාදේ හිරුඑළියට බනින්න එපා

"ගොඩක් අය තමන්ගේ සම ආදරෙන් බලාගන්නේ නැහැ. සම සවුත්තු වුණාට පස්සේ ඉතින් හිරුඑළියට හරි තමන්ගේ පෞද්ගලික රූපලාවන්‍ය ශිල්පියාට හරි දෙස් කියනවා."

මෙසේ පවසන්නේ සැන් ප්‍රැන්සිස්කෝහි සම ආරක්ෂණ විශේෂඥ වෛද්‍යවරියක වන ක්‍රිස්ටිනා ගෝලි ය. රුව පිළිබඳව වැඩි උනන්දුවක් දක්වන අයවලුන් පවා තමාගේ දෛනික රූපලාවන්‍ය පුරුදු ගැන වැඩි අවධානයක් යොමු නොකරන බව ඇය පවසයි.

"සුන්දර, තරුණ සමක් හිමි කරගන්න හැම කාන්තාවක්ම සිහින දකිනවා. හැබැයි සමට සත්කාර කරන්න, සමට ආදරේ කරන්න ගොඩක් අය අකමැතියි. එහෙමත් නැතිනම් එයාලා මේ වැඩේට කම්මැලියි."

වෛද්‍ය ක්‍රිස්ටිනා තවදුරටත් පවසන්නීය.

සුන්දර තරුණ සමක් හිමි කරගැනීමට නම් රූපලාවන්‍යාගාරයට ගොස් සිදුකරනා සත්කාර පමණක්ම ප්‍රමාණවත් නැත. ඔබගේ දෛනික රූපලාවන්‍ය පුරුදු ද ඒ සඳහා බලපායි.

මේ නිසා ඔබ දැනගත යුතුම දෛනික රූපලාවන්‍ය හුරුපුරුදු කිහිපයක් ගැන ඔබව දැනුවත් කිරීමට අපි සිතුවේ ඒ නිසාය.

සොඳුරු සමක් උදෙසා ඔබ දෛනිකව අනුගමනය කළ යුතුම පියවර තුනකි.

ඉන් පළමුවැන්න සම පිරිසිදු කිරීමය. සම ටෝනර් කිරීම සහ සමේ තෙතමනය වැඩි කිරීම අනෙකුත් පියවරයන්ය.

සම පිරිසිදු කිරීම (Cleaning)

"අපේ සම දිනපතාම කුණු, දුහුවිලි වගේ දේවල්වලට නිරාවරණය වෙනවනේ. ඉතින් දිනපතාම මේ දේවල් සමෙන් ඉවත් කරන එකත් වැදගත්. එහෙම නොකළොත් මේ දේවල්වලින් සමේ සිදුරු අවහිර වෙලා කුරුලෑ ඇතිවීම, සම අවපැහැගැන්වීම වගේ ගැටලු ඇතිවෙන්න ඉඩ තියෙනවා."

ඇමෙරිකාවේ සුප්‍රසිද්ධ චර්ම රෝග වෛද්‍ය කාලෝස් චාල්ස් නිසි ලෙස සම පිරිසිදු නොකිරීමෙන් ඇතිවිය හැකි ගැටලු පිළිබඳව පහදා දෙන්නේ එසේය.

මෙහිදී මූලිකවම සිදුවන්නේ සමේ ඇති කුණු, දුහුවිලි සහ තෙල් අදාළ ක්ලෙන්සර් නිෂ්පාදනයේ අඩංගු රසායනික ද්‍රව්‍ය මගින් ඉවත් කිරීමය.

නමුත් සාර්ථක ප්‍රතිඵල උදෙසා සමේ ආකාරයට අනුව ක්ලෙන්සර් නිෂ්පාදනයක් තෝරාගැනීම ඉතා වැදගත්ය.

"තෙල් සහිත සමක් තියෙන කෙනෙක්ට නම් ෆෝර්මින් (Foaming) වර්ගයේ ක්ලෙන්සර් එකක් වඩාත් යෝග්‍යයි. ඒ වගේම ඔබට තියෙන්නේ වියළි එහෙමත් නැතිනම් ඉක්මනින්ම රතු පැහැවෙන සමක් නම් ලෝෂන් සහ ක්‍රීම් වර්ගයේ (Cream or Lotion) ක්ලෙන්සර් එකක්ම තෝරගන්න.

සංවේදී සමට තෙල් (Oil) වර්ගවල ක්ලෙන්සර් සහ වැඩිහිටි සමට බාම් (Balm) වර්ගවල ක්ලෙන්සර් නිෂ්පාදන හොඳයි. ඒ වගේම මේ ඕනම සමකට පොදුවේ මයිසෙලර් වෝටර් (Miceller Water) වර්ගයේ ක්ලෙන්සර් හොඳයි කියන එකත් කියන්නම ඕනේ."

වෛද්‍ය කාලෝස් සමේ ආකාර අනුව ක්ලෙන්සර් තෝරාගත යුතු ආකාරය පහදා දෙන්නේ එසේය.

ටෝනර් කිරීම (Toning)

ක්ලෙන්සර් එකක් මගින් සම පිරිසිදු කළ පසුව ටෝනර් එකක් භාවිත කිරීමට බොහෝදෙනාට පුරුද්දක් නැත. නමුත් මෙය සම රැකගැනීමට සිතන ඔබ දිනපතා අනුගමනය කළ යුතුම පියවරක්ය.

අප සමට ආලේප කරන රූපලාවන්‍ය ආලේපනවල සාරය සමට හොඳින් උරාගැනීමට මෙම පියවර අපට උපකාරී වේ.

එමෙන්ම සම නිරෝගිමත්ව, සමබරව පවත්වා ගැනීමට අවශ්‍ය නම් දිනපතා සම ටෝනර් කිරීම ඉතා වැදගත් බව වෛද්‍ය මතයයි.

ඇල්ෆා සහ බීටා හයිඩ්‍රොක්සි (Alpha and Beta Hydroxy Acids), හයිලුරොනික් අම්ලය (Hyaluronic Acid), රෝස වතුර, ග්‍රීන් ටී, විටමින් E, C යන මේවායින් එකක් හෝ කිහිපයක් අඩංගු ටෝනර් වර්ගයක් මිලදී ගැනීම ප්‍රතිඵලදායකය.

සම පිරිසිදු කළ පසුව ඔබ මිලදී ගන්නා ටෝනර් ආලේපනයෙන් බිංදු එකක් හෝ දෙකක් මුහුණේ ආලේප කිරීම ප්‍රමාණවත්ය.

සමේ තෙතමනය වැඩි කිරීම (Moisturizing)

සමේ අභ්‍යන්තර සහ බාහිර ස්ථරවල තෙතමනය වැඩි කිරීමට නම් ඔබ දිනපතා මොයිස්වරයිස් ආලේපනයක් භාවිතා කළ යුතුමය. එසේ නොමැති නම් සම වියළීම සහ වියපත් වීම වේගවත් වීම වළක්වාලිය නොහැකි බවත් මතක් කළ යුතුමය.

තෙල් සහිත සමක් හිමි අයෙකුට ජෙල් (Gel) මොයිස්වරයිස් ආලේපනයක්ද, සාමාන්‍ය සහ මිශ්‍ර සමට ලෝෂන් (Lotion) වර්ගයේ ආලේපනද වඩා හොඳය. එසේම සංවේදී සමට බාම් (Balm) වර්ගයේ ආලේපනත්, වියළි සමට ක්‍රීම් වර්ගයේ අලේපනත් තෝරාගැනීමට අමතක නොකළ යුතුය.

"මේ මූලික පියවර තුනට අමතර සම සුන්දර කරගන්න වැදගත් වෙන එදිනෙද රූපලාවන්‍ය පුරුදු කිහිපයකුත් මම මතක් කරන්නම්.

සමේ තියෙන මැරුණු සම හොඳින් ඉවත් කරගන්න අවශ්‍ය නිසා සතියකට සැරයක් මුහුණ ස්ක්‍රබ් කරගන්න එක වැදගත්. හැබැයි කුරුලෑ තියෙන අයට මේ පියවර සුදුසු නැහැ කියන එකත් මතක් කරන්න ඕනේ.

ඊට අමතරව හිරුඑළියට නිරාවරණය වෙනවා නම් සන්ස්ක්‍රීන් (Sunscreen/Sun Cream) එකක් භාවිත කරන එකත් හරිම වැදගත්.

අනෙක් වැදගත්ම දේ තමයි සීරම් ආලේපනය. රාත්‍රී නින්දට කලින් හයලුරොනික් ඇසිඩ් (Hyaluronic Acid), රෙටිනෝල් (Retinol), විටමින් B, C වගේ සංයෝග එකක් හරි කිහිපයක් හරි අඩංගු සීරම් එකක් ආලේප කරන්න පුළුවන් නම් සමේ තරුණ බව රැකගන්න එක තවදුරටත් හීනයක් වෙන්නේ නැහැ.

තව එකක්, ගොඩක් අය අමතක කරන දෙයක් තමයි ඇස් යට ප්‍රදේශය කියන්නේ. ඇස් යට ප්‍රදේශය හරිම සංවේදීයිනේ. ඉතින් ඒ ස්ථානයට විටමින් C, කොජික් ඇසිඩ් (Kojic Acid), නියාසිනමිඩ් (Niacinamid) වගේ සංයෝග අඩංගු ක්‍රීම් එකක් හරි සීරම් එකක් හරි භාවිතා කරන එක වඩා හොඳයි."

අවශ්‍ය නම් මේ සඳහා රූපලාවන්‍ය උපදේශකවරයෙකුගේ උපදෙස් ලබාගත හැකි බවත් අවසාන වශයෙන් සටහන් කළ යුතුය.

ලස්සනට ඉන්න රූපලාවන්‍යාගාරයට ගිහින් සිදුකරනා සත්කාර පමණක් ප්‍රමාණවත් නෑ

ප්‍රවීණ රූපලාවන්‍ය උපදේශක
මාලිංග ප්‍රනාන්දු
(Personal Grooming Trainer, NVQ 4,5)

නදීශා නිර්මාණි

SLEEVELES
අත් නැති මෝස්තරය
(SHIFT ගවුමට)

පාඩම් අංක 13

SHIFT ගවුම සඳහා අවශ්‍ය මිමි

01. ඉදිරිපස කර ගැඹුර (පසුව නොපෙනෙන ප්‍රමාණය දක්වා අරගන්න) ....

02. Cup-Point එක දක්වා උස ....

03. ඉන දක්වා උස ....

04. ඉනේ සිට වාටිය දක්වා උස ....

05. කර පළල ....

06. උරහිස ....

07. අත් රවුම ....

08. පපුව ....

09. Cup දෙක අතර පරතරය ....

10. ඉන ....

11. උකුල ....

(ඉනේ සිට උකුල මැද දක්වා ඇති දුර මැනගෙන පසුව උකුල වට මනින්න)

වාටිය 1/4 ....

(1 වගුව බලන්න)

අත් නැති මෝස්තරය කැපීමේදී වැදගත් වන කරුණු

අත්නැති මෝස්තරය තමන් කැමති ගවුම් මෝස්තරයකට හෝ බ්ලවුස් මෝස්තරයකට දැමිය හැක.

අත්නැති ඕනෑම මෝස්තරයක් සඳහා මිමි ගැනීමේදී අතදිග, අත්කට සහ ඉහළ කොටස මිමි ගැනීම අවශ්‍ය නොවේ. ඔබට අවශ්‍ය මෝස්තරයේ මිමි අරගන්න. ඒවගේම අදාළ මෝස්තරයේ මූලික මිනුම් වගුවද භාවිතා කරන්න.

කුමන මෝස්තරයකට වුවද අත්නැති මොස්තරය නිර්මාණය කරගැනීමේදී අත්රවුමේ අගය සාදගත යුතු වන්නේ ඉහත වගුවට අනුය.

ඉදිරිපස අත්රවුම ඇඳගැනීමේදී පිටුපස පලුව මත ඇති උරහිසේ සහ පපුවේ පරතරය මැන බලා එම ප්‍රමාණය පිටුපස අත්රවුමේ යට සිට ඉහළට ලකුණු කර එතැන් සිට හැරීම සඳහා පරතරය 10 අඩු නම් අඟල් 1/2 ක් ද, 1කට වඩා වැඩි නම් අඟල් 3/4ක්ද ගෙන ඉදිරි අත්රවුමේ රේඛාව ඇඳගන්න.

ඉදිරිපස සහ පිටුපස මැහුම් වාසිය තබා කපාගැනීමේදී අත්රවුමට පමණක් මැහුම් වාසිය අඟල් 3/8ක් තබන්න.

ඉදිරිපස සහ පිටුපස අත්රවුමට FACING කපාගැනීම.

පිටුපස සහ ඉදිරිපස අත්රවුමට රූප සටහනේ පරිදි Facing කපාගන්න.



(1 රූපසටහන)

Facing එකේ පළල

3/8+3/8+3/8= 1 1/8

BACK - පිටුපස

(2 රූපසටහන)



පළමුව ලබාගත් මිමි මෙම මෝස්තරය සඳහා දී ඇති වගුව අනුව සුලු කරගැනීමය.

පිටුපස පලුව නිසා රෙද්ද දෙකට නවා මිමිවලට අනුව පලුව නිර්මාණය කරන්න.

A-Line ගවුමේ පිටුපස පලුව සකස් කරගත් පිළිවෙලට මේ පිටුපස පලුවද නිර්මාණය කරගත හැක. මෙහිදී වෙනස් වන්නේ අත්රවුමේ අගය, උකුලේ අගය සහ වාටිය 4න් පංගුව පමණයි.

උකුල 1/4 පංගුව සඳහා උකුලට අඟල් 1ක් එකතු කර එය 4න් බෙදූ පසු එන අගය උකුල රේඛාව මත රෙද්දේ නැමීමේ සිට හරස් අත පැත්තට ලකුණු කරන්න.

මෙම මෝස්තරය සඳහා අවශ්‍ය මිනුම්

	C	G	L
පිටුපස කර ගැඹුර	½	3/4	1
උරහිස බෑස්ම	3/4	1	1 1/4
කර පළලට එකතු කරන ප්‍රමාණය	3/4	1	1
පපුවට එකතු කරන ප්‍රමාණය	1 ½	2	2 ½
ඉනට එකතු කරන ප්‍රමාණය	1	1	1
උකුලට එකතු කරන ප්‍රමාණය	1	1	1
වාටියේ උස	½	½	½
වාටිය 1/4න් පංගුව සඳහා උකුල 4 ට බෙදූ පසු අඩු කරන ප්‍රමාණය	1 ½	1 ½	1 ½
අත්රවුම භාගයක් සඳහා පපුව මිනුම ඇගේ ගානට අරගෙන එය 4ට බෙදූ පසු Cup එක අනුව අඩු කරන ප්‍රමාණය Cup එක	අඩු 1 ½	සාමාන්‍ය 2	වැඩි 2 ½
Dart ගැඹර	½	½	½
Dart එකේ ආරම්භය පිටුපස පලුව සඳහා	Cup point එකේ සිට අරගන්න		
Dart එකේ ආරම්භය ඉදිරිපස පලුව සඳහා Cup point එකේ සිට පහත් කරන ප්‍රමාණය	1	1 1/4	1 ½
Dart එකේ අවසානය සඳහා උකුලේ සිට ඉහලට	1 ½	2	2 ½
බයින්ඩින් එකේ පළළ	3/8	3/8	3/8
බොත්තම් වාසිය	½	5/8	3/4
ඇතුලට නැවෙන ප්‍රමාණය	1	1 1/4	1 ½

1 වගුව

වාටිය 1/4 පංගුව සඳහා උකුල 4ට බෙදූ පසු එන අගයෙන් අඟල් 1 1/2 ක් අඩුකර එන අගය වාටියේ රේඛාව මත රෙද්දේ නැමීමේ සිට හරස් අත පැත්තට ලකුණු කරන්න.

අංශයේ රේඛාව ඇඳගැනීමේදී රූපසටහනේ පරිදි අත්රවුමේ සිට උකුල දක්වා හැඩ එන පරිදි ඇඳ එතැන් සිට වාටිය දක්වා අංශයේ රේඛාව කෙළින් අඳින්න.

FRONT - ඉදිරිපස



(3 රූපසටහන)

ඉදිරිපස පලුව සෑදීමේදී පිටුපස පලුව මතම ඉදිරිපස අත්රවුම ඇඳගන්න. මෙහිදී සාමාන්‍ය බ්ලවුස් එකේ ඉදිරිපස අත්රවුම ඇඳගත් ආකාරයටම පිටුපස පලුව මත ඉදිරිපස අත්රවුම ඇඳගන්න.

ඉදිරිපස විවරය සඳහා ඇතුළට නැවෙන ප්‍රමාණය සහ බොත්තම් වාසිය වෙන්කරන්න. පසුව බොත්තම් වාසියේ රේඛාව මත පිටුපස පලුවේ නැමීම තබා උරහිස ඉදිරිපස අත්රවුම සහ Dart එකේ ආරම්භක ස්ථානය, අවසානය සහ දෙපැත්ත පිටපත් කර පිටුපස පලුවේ ප්‍රමාණයටම යටින් සහ අංශය පැත්තෙන් ඉදිරිපස පලුවද කපාගන්න.

ඉදිරිපස Dart එක ඇඳගැනීමේදී Cup Point එකේ සිට පහත් කළ යුතු ප්‍රමාණය පහත් කර එතැන් සිට Dart එක රූපසටහනේ පරිදි හැඩකර ඇඳගන්න.

ඉදිරිපස කර සඳහා උරහිස ඉහළ ස්ථානයේ සිට ලබාගත් මිමිම පහලට ගෙන අවශ්‍ය කරේ මෝස්තරය නිර්මාණය කරගන්න.

ඔබට අවශ්‍ය නම් ඉදිරිපස මැදින් විවරයක් නොතියා අරගන්න.

ප්‍රවීන ඇඳුම් මෝස්තර නිර්මාණ පුහුණු දේශක සහ බතික් කලාව පිළිබඳව පුහුණු දේශක
චමින්ද කුමාර
You tube - Smart Fashion Lanka

ධරණී

සැපදුක - ප්‍රසංශා නින්ද දරාගනී
ඉවතට ද නරක හොඳ දේ උරාගනී
හදවත සොරාගත් ආදර විරාජිනී
වනිතා ලොවට ඔබ විය යුතු සරෝජිනී

ළඳුනට කියාදෙයි ජීවත්වන විදිය
දරු පැටවුනට පවසයි රට යන විදිය
රට ගැහැනියට අඩුබව සලකන විදිය
පවසයි 'ධරණී' බිය නැත ඇය යන විදිය

අරණක තෙරණිය කී ඇය සතු හැඳුනුකම
පැරණිම දෙයට පෙන්වා දෙයි වටිනකම
හිරු නැග එන බඳුද හැම උදයකම
'ධරණිය' සිපගනිමි දෝතින් රැගෙන මම

● **දෙල්හේනේ ඩග්ලස් ඕපාත**
පිටිගල

අත්තම්මා

දරුවෝ... දරුවෝ... දරුවෝ...
ඒ දරුවන්ගෙත් දරුවෝ...
ඒ දරුවන්ගෙත් දරුවෝ...
තැනුවෝ... තැනුවෝ... තැනුවෝ...
අත්තම්මා...
යහගුණ මල් දම් පළඳ
දියුණුවෙ මාවත පහද
කරදර ඔලගුව උරද
දරුවන් වෙනුවෙන් හැමද
අත්තම්මා ඇත හැමද
අසුවෙ සැතපුම පසුකෙරුවා
තව-තව-යන්නට දිරිය ලැබෙවා
දිගුකල් ජීවත් වේවා...
දිගුකල් ජීවත් වේවා...

● **එන්.පී.එල්.ආර්.මැණිකේ**
දැරණියගල

මන්ද පුතේ

අභිමානෙන් ඉගිලෙන්නේ
සැප පුටුවල වැජඹෙන්නේ
මගෙ දහදිය රන්දිය වී
නුඹ උදෙසා වැපිරූ නිසයි

ඔබෙ ලෝකය ගොඩ නගන්න
මගේ ලොවයි මා පිදුවේ
මා සන්තක හැම දෙයක්ම
කැපකෙරුවේ පුත නුඹටයි

විසල් මැදුරු මාලිගාවල
වැඩ වසනා මා පුතුනේ
අත් වාරුව නැති මා අද
මහලු මඩමේ තනිකලේ ඇයි

● **දිස්නා හෙට්ටිආරච්චි**
සෙත්මා රෝහල - ගම්පහ

ආදර හිමියනි

සුන්දර අතීතය මතකෙට නැගෙන විට
දැනෙනා සතුට බැහැ කවියට නගන්නට
කරලා ආදරය පෙම්වතෙකුත් ලෙසට
අද වෙසෙනවා මගෙ ආදර හිමි ලෙසට

ජීවන මගේ පසුකර නොයෙකුත් බාද
මා රැකගත්තෙ දුක් නොමදී ඔබ කිසිද
ඇතත් නැතත් සතුටින් කල් ගෙවී හින්ද
ඔබ මා අදත් පෙර ලෙස සතුටම වින්ද

මව්-පිය-ගුරුද-වෙදැදුරු විය විටෙක ඔබ
සුමිතුරු-සොයුරු විය එලෙසම විටෙක ඔබ
යුග දිවි ගමනෙ පෙම්බර හිමි ලෙසින් ඔබ
මැව් ඒ වරිත තුළ ඉටුදෙවි විය ඔබ

● **චාලටි විජයසිරි**
ඉමගිර

පෙම් බැඳි කුමරුවනේ!

මේ දෙව් මැඳුරේම පුදසුන අභියස
ඔබේ නමිනි මා දණ නැමුවේ
ඒ දෙව් මැඳුරෙම දැඟිලි පටලා
කෙලෙසින් ඔහු හා කුලගෙට යන්නේ
පෙම් බැඳි කුමරුවනේ...?

සයුරු තලාවේ සුදුමුදු වැල්ලේ
තුරු සෙවණැලි යට ළයට ළංව හිඳ
කී පෙම් බස් මතකයේ රැව් දෙන කල
කෙලෙසද මා ඔහු හා කුලගෙට යන්නේ
පෙම් බැඳි කුමරුවනේ...?

මව්පිය නෑසිය ආසිරි ගී මැද
ඔබෙ සුරත ගෙන කුලගෙට යන්නට
පිරූ පෙරුමන් මතකයේ ගොනුකොට
කෙලෙසින් ඔහු හා හෙට කුලගෙට
යන්නේ
පෙම් බැඳි කුමරුවන්...?

● **ශෙරීන් ජයතුංග**
ගෝනවල

කවි යාය

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.

"කවි යාය"
'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,
විජේරාම මාවත,
කොළඹ 07
නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න

සංස්කරණය - මනෝරා ප්‍රේමතිලක

කොරෝනා

කිසිම වරදක් නොකළ මා
කොරෝනා නම් වූ
රක්ෂිත බන්ධනාගාරයේ
සිරකරුවෙක් වුණෙමි
මුකවාඩම් පනතට
හිස නමමින්
මොහොතින් මොහොත
දැත් සෝදමින්
මීටරයේ දුර රැඳෙමින්
සුව විරුවන්ගේ ඔවදන්
පිළිපැද
සිර දඬුවම අගය කරමින්
කල්යල් බලා හිඳිමි

● **සිරිමා ජෝතිපාල**
කිරිබත්ගොඩ

2020 Wedding

Plan කරලා
Loan අරන්
Hall එකක
ලක්ෂ ගණන් සාරි
Fresh මල් බොකේ
මේකප් උලාපු මනාලියක්
එරට මෙරට එකී නොකී
කෑම ජාති හරි හරියට
Buffet එකේ
හතර වරිගෙම එකතු වෙලා
කාල බිල නටල කරල
ජොලිය වැඩිවෙන කොට
පොඩි වලියකුත් දල
හැමෝම එකතු වෙලා
ජෝඩුව කාරෙකට නග්ගල
හනිමූන් එකට පිටත් කරල
ඉතිං යනව
Wedding එකේ
ඇඳ කිය කිය

● **හර්ෂණී නවරත්න**
පඬුවස්නුවර

නික්ම ගිය ගාඩිනියා මල් සුවඳ

ඉරිමා උදයේ ලෙන් දෙරට රහසින්
පැල දෙර හැර දමා
මැඳුරුතර සුවඳ නික්මගිය
ගාඩිනියා මල් සුවඳ
අඩ අඳුර තවරාපු
දහවලකි ඉතින් දැන් හිත
තුල්සි මල් පිපුණාට සුවඳ නෑ ගේ ගාව
නිදිබරයි ගෙමිදුලම
වියළි කොළ වැටුණු බිම
හැඩිකළා මැද මිදුල

සඳපාන අරන් ආ
පැණිකුරුලු කිචි බිචිය
ඇයි ගියේ නොකියාම
ලැගළුන් දෙබ ගහට
නග්න වූ වනස්පති ඉපල් වී
ළා කොළට හැඩවෙන්න
ඉති අගින් හිනැහිලා
මල් මිටක් පුබුදන්න
පතන්නෙම සඳඑළිය
සයනයේ නුඹට හිමි
එදා ඒ ඉඩහසර අදත් රෑ
නිදිවරයි තුරුලු වී මා ළයට

වැටමාර මල් පිපුණු
වල ගැසුණු දෙකොපුල
හසරැලක් අමුණගෙන
ඉතින් රෑ එනු මැනවි
ගිලන් වූ මේ රැයට
සිහිනයක් වී නිබඳ

● **වජිර කුමාරසිංහ**



වැරදීම

ජීවිතය වැරදුන පවින්
අත දරා කිරි බිළිඳුන්
කිරි සිඳී දෙතන මුව ලමින්
ඇය ඇදෙයි කිරි කඳුළු යදිමින්

විසි කරන්නට කසළ ගොඩකට
හිත හද ගනු බැරිව ළතැවී
ජීවිතය ජීවත් කරන්නට
වෙහෙසුණා විඳවමින් සිත කය

සියලු පව් සෝද හරින්නට
කිරි කලවලින් බෝධිය නහවන
බැතිමතුන් වෙස්ගත් නරුමයින්
නැතිවාද දුටුවේ මේ අසරණිය

ඇයට වැරදී මුළු ආත්මයම
පිදුවේ ද උන්ට බව අමතකව
ගැරහුවා නොසරුප් වදන් වැකි
පෙළා ඒ සිත අධම විලසින්

කිසාගෝතමී පටාචාරා
දෙව්රමට ගියද ඒ බුදුන් කල
පන්සලද කෝවිලද පල්ලියද
අහිමිවී ඇය ඇදෙයි මාවතේ

● **වයලා උඩවත්ත**
මිහින්තලේ

බුදු ගුණ සුවඳයි

සීතල කඳුවැටි ගිරිකුළු මැදිකර දියවැල් පහළට බැස යනවා
සුනිල වළාකුළු අතරින් මතුවී පුන්සඳ අහසේ හිනැහෙනවා
නේක කුසුම් වන අරණේ පිපිලා සුවඳක් දසඅත විහිදෙනවා
දහය නිවමින් සිසිලස ගෙනදී සීත සුළං ගත දැවටෙනවා

මාලගිරා සැළලිහිණි කොවුල් නද දෙසවන තුළ නෑ රැව්දෙන්නේ
කණමැදිරියන් දස අත සරමින් තරුකැට වාගේ දිලිසෙන්නේ
දේව පුරෙන් බැස සුරංගනාවන් මුණි පා පිදුමට සැරසෙන්නේ
ඈත සමන්ගිර සිරිපා පියුමෙන් සවණක් බුදුරැස් විහිදෙන්නේ

තෙල් මල් අරගෙන උපාසිකාවන් පන්සල් යන්නට සැරසෙන්නේ
සිලි සිලි නාදෙන් බෝපත් සෙලවී සම්බුදු ගුණයයි පවසන්නේ
හද තුළ නැග එන සදහම් සිතුවිලි මෙත් කරුණා ගුණ පතුරන්නේ
බෝ මළුවේ මල් සුවඳට මුසු වී මව්කිරි සුවඳයි මේ එන්නේ

● **වික්‍රම සෙනවිරත්න**
හොරේතුඩුව

අහස මම් අමතකද

පින්සාර වූ නුඹේ ඉඳුනිල ඇස් දෙකට
මල් පියලි රටාවට මම ලියූ කවි
අමතකද...
හිත් වැහිපොද වැටෙනකොට
ඔය ඉමට...
මතකයට නැගෙනවද
දුක් විඳින අහස මම්...

● **ගීතානී ප්‍රියංකා**
කන්තලේ

සිතේ ඇඳි රුවට

නුහුරු නුපුරුදු නුඹේ සෙනෙහස
හිතේ පතුලෙම ගුලිකරන්
නික්ම යන්නට දෙන්න අවසර
ඔබේ යහපත මුල්කරන්

දයාබර වූ සෙනෙහසක් ළඟ
නතර වෙන්නට නෑ පිනක්
ඔබේ සෙනෙහස අවැසි අයහට
දෙන්න බෑ මට ගින්දරක්

නෙතේ කඳුළැලි සඟව ගන්නෙමි
ඔබේ අභියස මහ මෙරක්
සමුදෙන්න... මට තනිව යා හැක
ජීවිතේ තව ටික දුරක්

● **ශ්‍යාමලී අමරතුංග**
කිරිඳිවැල

කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.